# වාර්ෂික වාර්තාව
# 2017

**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# ජාතික අධ්‍යාපන ආයතනය

# කළමනාකරණ මණ්ඩලය

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මහත්මිය

**අධ්‍යක්ෂ ජනරාල්**

ආචාර්ය පූජ්‍ය මාබුල්ගොඩ සුමනරතන හිමි

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

කේ.ඩබ්ලිව්.බී.එම්.පී. විජේසුන්දර මහතා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

**පාලන, මුදල් හා සහාය සේවා**

එන්.වී.ඒ.එස්. සමරසිංහ මහතා

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)**

**ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය**

# ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ මණ්ඩලය

ඩී.ඒ. ජයලාල් මහතා
අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

ආර්.එම්.පී.සී. රණසිංහ මහතා
අධ්‍යක්ෂ
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

ජේ.ඩී. ප්‍රේමචන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ
සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

කේ.ආර්. පත්මසිරි මහතා
අධ්‍යක්ෂ
ගණිත දෙපාර්තමේන්තුව

ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා
අධ්‍යක්ෂ
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව

ආචාර්ය වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂ
බාහිර සම්පත් කළමනාකරණ අංශය

එන්.ටී.කේ. ලොකුලියන මහතා
අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

එම්.පී.ආර්. ධනවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ඒ.කේ.ඒ.ආර්. අලහකෝන් මහත්මිය
අධ්‍යක්ෂ
ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ටී. මාලනී මහත්මිය
අධ්‍යක්ෂ
මුදල් දෙපාර්තමේන්තුව

එම්.ආර්.ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජී.එච්. අශෝකා මහත්මිය
අධ්‍යක්ෂ
සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පටුන

**1 කොටස : ප්‍රගති වාර්තාව**


**1.0 හැඳින්වීම**

1.1 ආයතනයේ අරමුණු

1.2 මූල්‍යකරණය

1.3 කාර්ය මණ්ඩල පත්කිරීම

**2.00 ජාතික අධ්‍යාපන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය**

2.1 2017 පාලක සභාව

2.2 පීඨ සහ ශාඛා

2.2.1 භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය

2.2.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

2.2.3 පර්යේෂණ සහ සැලසුම් පීඨය

2.2.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

2.2.5 ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

2.2.6 පාලන, මුදල් හා සහාය සේවා අංශය

**3.0 විෂයමාලා සංවර්ධන**

3.1 ප්‍රාථමික අධ්‍යාපනයට අදාළ ඉටුකළ කාර්යය

3.2 ද්විතීය අධ්‍යාපනයට අදාළ ඉටුකළ කාර්යය

3.3 දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

**4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණය**

**5.0 ගුරු වෘත්තීය සංවර්ධනය**

5.1 සංවර්ධන

**6.0 විකල්ප අධ්‍යාපනය**

6.1 අන්තර්කරණ අධ්‍යාපනය

6.2 විද්‍යුත් ප්‍රචාරණය

6.3 මාර්ගෝපදේශනය සහ උපදේශනය

6.4 විවෘත ඉගෙනුම

**7.0 පර්යේෂණ හා සැලසුම්**

7.1 පර්යේෂණ හා සංවර්ධනය

7.2 සැලසුම් හා ඇගයුම්

**8.0 පාලන, මුදල් හා සහාය සේවා**

8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

8.2 මුදල් දෙපාර්තමේන්තුව

8.3 ඉංජිනේරු සේවා හා නඩත්තු දෙපාර්තමේන්තුව

8.4 පුස්තකාලය

8.5 මුද්‍රණ හා ප්‍රකාශන

**2 කොටස : විගණකාධිපති වාර්තාව**

**3 කොටස : මුදල් ප්‍රකාශය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාව**

**4 කොටස : මුදල් ප්‍රකාශ පිළිබඳ සටහන්**

# වාර්ෂික ප්‍රගති වාර්තාව - 2017

## 1.0 හැඳින්වීම

### 1.1 ආයතනයේ අරමුණු

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත මගින් දූයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් උරුම කර දීම සඳහා ඉවහල් වන පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබාදීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සංදර්භයට උචිත, චිර භාවිත දේශිය දැනුම් හා උරුම අගයන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇති කාර්යභාරය පීඨ පහක් සහ එක් අංශයක් මගින් ක්‍රියාවර නංවනු ලැබේ.

කාලයේ වේගය ඉක්මවා විවිධ ඉගෙනුම් ක්ෂේත්‍ර තුළට එකතුවන නව දැනුම ජාතියේ දරුවනට උරුම කර දීම සඳහා ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම අවුරුදු 8කට වරක් ම විෂයමාලා නවීකරණ ක්‍රියාවලියක් සිදු කෙරේ. ඒ අනුව පසුගිය විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය 2006 වර්ෂයෙන් ආරම්භ වී 2010 වසරේ දී සාර්ථකව නිම කරන ලදී. පාසල් විෂයමාලාව අරභයා 2012 වසරේ දී තබන ලද ස්ථාවර පදනම මත පිහිටා 2015 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව විෂයමාලාව සඳහා පවත්නා විෂයමාලාව විචාරවත් විෂයමාලාවක් බවට පත් කිරීමේ

කටයුතු 2012 වසරේ දී ආරම්භ කරන ලදි. පවත්නා විෂයමාලාව යථාර්තවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පාදක කරගනු ලැබුවේ පහත සඳහන් අංශ විෂයමාලාව හා බද්ධ කිරීම සඳහාය.

1. විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම පිළිබඳව ඒ ඒ විෂය කංඩායම් මගින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයන වලින් අනාවරණය වු කරුණු;

2. විෂයමාලාව පිළිබඳව විවිධ සමාජ කණ්ඩායම් මගින් පෙන්වා දෙන ලද ධනාත්මක අදහස් හා යෝජනා;

3. විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ලෝකයේ විවිධ රටවල්වල සාර්ථක අත්දැකීම්;

4. ඒ ඒ විෂය ක්ෂේත්‍රවලට එක්වූ නව දැනුම් හා ඉගෙනුම් ක්‍රමවේද;

2017 වර්ෂයේ දී ප්‍රධාන වශයෙන් විෂයමාලා කාර්ය නාභිගත කරන ලද්දේ 2,8 හා 12 ශ්‍රේණිවල යාවත්කාලීන විෂයමාලාව පන්ති කාමරයේ ක්‍රියාත්මක කිරීම සුපරික්ෂණය සහ යාවත්කාලීන වූ විෂයමාලාවට අදාළ 3,9 සහ 13 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු අත්පොත් සකස් කිරීම, පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීම හා පිළිවෙලින් 2018 සහ 2019 වසරවල ක්‍රියාත්මකවීමට නියමිත 4 ශ්‍රේණිය විෂය නිර්දේශ පාසල් පද්ධතිය තුළ අත්හදා බැලීම සහ 5 ශ්‍රේණිය සඳහා විෂය නිර්දේශ සකස් කිරීම සඳහාය.

### 1.2 මූල්‍ය තත්ත්වය

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ "දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය" (TSEP /DFAT) යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP)හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු සංවර්ධන බැංකු (ADB)ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යන මූල්‍ය ප්‍රවාහ යටතේය.

පවත්නා මුදල් අවහිරතා නිසා මහා භාණ්ඩාගාරය මගින් ආයතනයට ලබාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය පුද්ගල වැටුප් හා දීමනා සඳහා වැය වූ පසු ජලය,විදුලිය, පවිත්‍රතා හා ආරක්ෂක වැනි ප්‍රධාන පුනරාවර්තන වැය ශිර්ෂ පියවාගැනීමට හෝ ප්‍රමාණවත් නොවන තත්ත්වයක් තුළ ආයතනයේ එම වැය ශිර්ෂ යටතේ වූ වියදම් පියවා ගැනිම සඳහන් ලී බඩු හා කාර්යාලයීය උපකරණ මිළ දී ගැනීම සඳහාත් රුපියල් මිලියන 134ක් ආයතනයේ විවිධ පාඨමාලාවලින් ලැබෙන ආදායම් උපයෝගීකර ගනිමින් පියවා ගැනීමට 2017 වසරේ දී සිදුවිය.

**වගුව 1: 2017 වර්ෂයේ ආයතනයේ ආදායම් වියදම් පිළිබඳ තොරතුරු.**

| මූල්‍ය ප්‍රභවය | පුනරාවර්තන වියදම් | | ප්‍රාග්ධන වියදම් | |
|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම | සංශෝධිත ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| ඒකාබද්ධ අරමුදල (CF) | 430,000,000 | 330,000,000 | 200,000,000 | 80,688,695 |
| දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (TSEP) සහ ඔස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපාදන (DFAT) | 112,000,000 | 112,000,000 | 48,000,000 | 23,523,533 |
| ආයතනයේ ආදායම් (Income) | 138,825,500 | 119,023,848 | 53,800,000 | 14,736,618 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන (ESDP) | 72,000,000 | 72,000,000 | - | - |
| එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල (UNICEF) | 8,164,800 | 8,164,000 | - | |
| යුනෙස්කෝව සඳහා වූ කොරියානු ජාතික කොමිසම | 3,705,000 | 3,705,000 | - | |

### 1.3 කාර්ය මණ්ඩලය

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය ඉටුකිරීමට අමතරව අධ්‍යාපනය හා සම්බන්ධව රජය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන, පාසල් පදාක ඇගයීම් වැඩසටහන වැනි ප්‍රමුඛ වැඩ සටහන්වල තිරනාත්මක කාර්යභාරයක් ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී තිබුණු අතර, විශාල කාර්යමණ්ඩල හිඟයක් පවතිද්දී වුවද විවිධ බාධක වලට ද මුහුණ දෙමින් යථෝක්ත කාර්ය ඉටුකිරීම සඳහා දැඩි කැපවීමක් කිරීමට 2017 වසරේ දී සිදු විය.

වගුව 2 : 2017 වසර අවසාන වනවිට ආයතනයේ පැවති කාර්යමණ්ඩල තත්ත්වය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය (01.01.2017 දිනට) | පවත්නා කාර්ය මණ්ඩලය (31.12.2017 දිනට) | | | පුරප්පාඩු සංඛ්‍යාව (31.12.2017 දිනට) |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 01 | 01 | 00 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 00 | 00 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 | 02 | 00 | 02 | 04 |
| අධ්‍යක්ෂ | 27 | 07 | 07 | 14 | 13 |
| සහා ලේකම් (අධ්‍යාපන) | 01 | 01 | 00 | 00 | 00 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ | 72 | 47 | 18 | 65 | 07 |
| කථිකාචාර්ය / අධ්‍යාපනඥ | 75 | 07 | 17 | 24 | 51 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සහකාර කථිකාචාර්ය / සහකාර අධ්‍යාපනඥ | 90 | 29 | 26 | 55 | 35 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 379 | 147 | 149 | 296 | 83 |
| **එකතුව** | **652** | **240** | **218** | **458** | **194** |

යථෝක්ත බාධක සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ ඉහත වගුවේ දක්වෙන පරිදි පැවති කාර්යමණ්ඩල හිඟයයි. 2016 වර්ෂය ආරම්භ වන අවස්ථාව වනවිට 652ක් වූ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 184ක් පැවතුනි. ආයතනයේ කාර්ය මණ්ඩල හිඟය පියවීමට ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන අමාත්‍යංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව ගන්නා ලද සාධනීය පියවර හේතුවෙන් කාර්යමණ්ඩල පුරප්පාඩු 75ක් පිරවීම සඳහා අභ්‍යන්තර උසස් වීම් මගින් හා බාහිරව පුද්ගලයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**වගුව 3 : අධ්‍යාපන සුදුසුකම් අනුව අධ්‍යයන කාර්යමණ්ඩලය**




## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

### 2.1 ආයතන සභාව - 2017

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත:

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම;

- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීතිරීති තිරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රතිලාභ ලැබෙන පරිදි හා අර්ථ සාධක සහ සුභසාධක වැනි අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2017 වසරේ ආයතන සභාව පහත සඳහන් සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| *සුනිල් හෙට්ටිආරච්චි මහතා* | - | *සභාපති* |
| *(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | | |
| *ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මිය* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *තිස්ස හේවාවිතාරණ මහතා* | - | *සාමාජික* |
| *(රාජ්‍ය ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය)* | | |
| *එස්.එච්. කුමාරසිංහ මහතා* | - | *සාමාජික* |
| *(විදුහල්පති (විශ්‍රාමික) රාජකීය විදුහල, කොළඹ)* | | |
| *මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා* | - | *සාමාජික* |
| *(උප සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන සභාව)* | | |
| *මහාචාර්ය හේමමාලා රත්වත්ත මිය* | - | *සාමාජික* |
| *( භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව, විවෘත විශ්ව විද්‍යාලය )* | | |
| *එම්.කේ. ප්‍රදීප් කුමාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යංශය)* | | |
| *ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතා* | - | *සාමාජික* |
| *(කොමසාරිස් ජෙනරාල් (විශ්‍රාමික) විභාග දෙපාර්තමේන්තුව)* | | |
| *එන්.කේ.ජී.කේ. නැම්මවත්ත මහතා* | - | *සාමාජික (2017.01.17) සිට* |
| *(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන (රජයේ නොවන), උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාතංයශය )* | | *(2017.11.29 දක්වා )* |
| *ආචාර්ය හර්ෂ සුබසිංහ මහතා* | - | *සාමාජික* |
| *මාහාචාර්ය පී. රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා* | - | *සාමාජික* |
| *(සභාපති, අන්තරායකර ඖෂධ නිවාරණ මණ්ඩලය)* | | |
| *වී.සි.ඩී.පී.පෙරේරා මිය* | - | *ආයතන සභා ලේකම් (2017.03.16 දක්වා)* |
| *(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)* | | |
| *එම්.ඒ.පී. මුණසිංහ මහතා* | - | *ආයතන සභා ලේකම් (2017.03.20 සිට)* |

**ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය - 2017**

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2017 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

*ආචාර්ය එම්.ඒ. උපාලි මාම්පිටිය මහතා - සභාපති*
*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)*
*ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර මිය - සාමාජික*
*(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)*
*මහාචාර්ය ආර්. අරංගල මහතා - සාමාජික*

(සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

කේ.එම්.එච්.බණ්ඩාර මහතා - සාමාජික

(ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය)

ඊ.කේ. ගණිහිගම මහතා - සාමාජික

(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික) සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය )

මහාචාර්ය ආර්. යූ. හල්වතුර මහතා - සාමාජික

(සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය)

ආචාර්ය එම්.ටී.එම්. මහීස් මහතා - සාමාජික

(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ
විශ්ව විද්‍යාලය)

ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා - සාමාජික

(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
විවෘත විශ්ව විද්‍යාලය)

වී. මුතුකුමාරස්වාමි මහතා - සාමාජික

(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා - සාමාජික (2017 ඔක්තෝම්බර් දක්වා)

(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)

බී. සනත් පූජිත මහතා - සාමාජික (2017නොවැම්බර් සිට)

(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)

අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මහතා - සාමාජික

(කොමසාරිස්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
අධ්‍යාපන අමාතංශය)

පූජ්‍ය ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමින් වහන්සේ - සාමාජික

(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ
විද්‍යා පීඨය, ජා.අ.ආ.)

එස්.එෆ්.ඒස්.පී. ජයවර්ධන මහතා - සාමාජික (2017.07.17 දක්වා)

(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ)

එන්.වි.ඒ.එස්. සමරසිංහ මහතා - සාමාජික

(වැඩ බලන, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය ජා.අ.ආ.)

වී.සී.ඩී.පී. පෙරේරා මිය - ශාස්ත්‍රීය කටයුතු

(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ) මණ්ඩල ලේකම් (2017. 03.16 දක්වා)

එම්.ඒ.පි. මුණසිංහ මහතා - ශාස්ත්‍රීය කටයුතු
මණ්ඩල ලේකම් (2016 .03.20 සිට)

අධ්‍යයන සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ උපදේශනය හා අධීක්ෂණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනයට පැවරුණු කටයුතු පහත සඳහන් සංවිධාන ව්‍යුහය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

## 2.2 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය, විභාග දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් ඒ ඒ පීඨ දෙපාර්තමේන්තු සහ අංශ අධ්‍යක්ෂ ජනරාල් තුමිය හා සම්බන්ධීකරණය කිරීමට අමතරව, 2017 වසරේ දී ආයතන සභා රැස්වීම් 12ක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 13ක් හා ඒකාබද්ධ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකොට ඇත.

### ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලාවල ඇගයීම් කටයුතු මනාලෙස ඉටුකරගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී තක්සේරු ක්‍රමයක් පවත්වාගෙන යාම විභාග දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීමයි. පහත සඳහන් පාඨමාලා හා සම්බන්ධ විභාග පැවැත්වීම, ඇගයීම සහ සහතික නිකුත් කිරීම 2017 වසරේ දී ඉටු කොට ඇත.

- විද්‍යාව ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2016 (අවසන් විභාගය)
- ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2017 (අවසන් විභාගය)
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ කෙටි කාලීන සහතික පත්‍ර පාඨමාලාව - 2017
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2017
- සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - 2016 / 2017 (අවසාන විභාගය)
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2016 /2017 (අවසාන විභාගය)
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 /2017
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2016 / 2017 (අවසාන විභාගය)
- පාසල් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - 2017 (ප්‍රවේශ විභාගය)
- විදේශීය බසක් ලෙස ජපන් භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2016
- අධ්‍යාපනවේදී උපාධිය - 2013 /2015 (තුන් වන කොටස) 2017
- අධ්‍යාපනවේදී උපාධිය - 2013/2015 (පළමු කොටස)- පුනර් පරීක්ෂණ 2017
- අධ්‍යාපනවේදී උපාධිය - 2013 /2015 (දෙවන කොටස) - පුනර් පරීක්ෂණ 2017
- අධ්‍යාපනවේදී උපාධිය - 2011/2013 (තුන්වන කොටස) - පුනර් පරීක්ෂණ 2017
- අධ්‍යාපනපති උපාධිය - 2015/2016 (අවසාන විභාගය) - 2017
- අධ්‍යාපනපති උපාධිය (ප්‍රවේශ විභාගය) - 2017
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2015 /2016 (අවසානය) 2017
- පශ්චාත් උපාධිය අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝම පාඨමාලාව (අර්ධ කාලීන) - 2017

- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණ කාලීන)- 2017

2017 වර්ෂයේ දී පැවැත් වූ අතිරේක විභාග පහත දැක්වේ.

- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් දිශාභිමුඛ කිරීමේ විභාගය 2016 (දෙවන කොටස)
- ජාතික අධ්‍යාපන ආයතනයේ කළමනාකරණ සහකාර 111 සඳහා පලමු කඩඉම් විභාගය පැවැත්වීම (තාක්ෂණික නොවන / තාක්ෂණික)
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව ( අවසාන විභාගය) - 2017
- පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ උපාධි පාඨමාලාව (පූර්ණකාලීන හා අර්ධකාලීන ප්‍රවේශ විභාගය - 2017

ආයතනයේ ප්‍රධානියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ ඍජුව සම්බන්ධ වෙමින් 2017 වසරේ දී ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 විගණන වාර්තා 29 ක් සැකසීම සහ රු. 150,000 ට වැඩි වැඩමුළු ඇස්තමේන්තු 551ක ගෙවීම් පරික්ෂා කරන ලදී.

ආයතන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල් වන දීර්ඝ කාලීන හා කෙටි කාලීන පාඨමාලා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට වෘත්තීය සංවර්ධන අවස්ථා සලසා දීම බාහිර සබඳතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. බාහිර සබඳතා ඒකකය මගින් 2017 වර්ෂය තුළ දී පහත සඳහන් කාර්ය ඉටු කරන ලදී.

- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, 2017 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනයේ නිලධාරීන් 19 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.
- ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරින් 11 දෙනෙකු සඳහා මැලේසියාවේ Science & Management විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය උපාධි හැදෑරීමට අවස්ථාව ලබා දීම.
- 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ විෂයමාලා සංවර්ධන කාර්යවල නියුක්ත නිලධාරින් 15 දෙනෙකු සඳහා අධ්‍යාපන චාරිකාවක් මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය සමඟ එක්ව සංවිධානය කිරීම.

## 2.3 පීඨ / අංශ

2017 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත සඳහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

### 2.3.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළ භාෂා දෙපාර්තමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් හා සාරධර්ම දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

**2.3.2 විද්‍යා හා තාක්ෂණ පීඨය**

විද්‍යා දෙපාර්තමේන්තුව
ගණිත දෙපාර්තමේන්තුව
තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වාණිජ දෙපාර්තමේන්තුව
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය
මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**2.3.3 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය**

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව
පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

**2.3.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය**

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව
අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව
විදේශීය පාඨමාලා ඒකකය

**2.3.5 ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය**

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව
අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය
විවෘත පාසල් ඒකකය

**2.3.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය**

පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් දෙපාර්තමේන්තුව
ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව
පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව
ප්‍රවාහන ඒකකය

**2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ කාර්ය**

- ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන උපාධි / පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරූ උපාධිලාභින් සඳහා උපාධි ප්‍රදානෝත්සවය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනවාරි මස 31 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීම. එහි දී පහත දැක්වෙන උපාධි පිරිනමනු ලැබීය.

| | |
|---|---|
| අධ්‍යාපන දර්ශනපති උපාධිලාභින් | 02 |
| අධ්‍යාපනපති උපාධිලාභින් | 196 |
| අධ්‍යාපනවේදි උපාධිලාභින් | 1355 |
| අධ්‍යාපන විද්‍යාපති (දේශිය) | 03 |
| අධ්‍යාපන විද්‍යාපති (විදේශිය) | 23 |

- යුනෙස්කෝ ( UNESCO ) සහයෝගීතාව යටතේ මීපේ පරිශ්‍රයෙහි ස්ථාපිත දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය සඳහා යුනෙස්කෝ ආයතනයේ සහ කලාපීය රටවල සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයේ ආරම්භක රැස්වීම 2017 මාර්තු මස 30 වන දින පැවැත්වීම.

- රජයේ ප්‍රමුඛතා වැඩසටහනක් වන "13 වසරක සහතික කළ අධ්‍යාපන වැඩ සටහන" යටතේ රජයේ හා පෞද්ගලික අංශයේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් එම විෂයමාලාව පිළිබඳව ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට 2017 පෙබරවාරි මස සම්මන්ත්‍රණයක් පැවැත්වීම.

- අධ්‍යාපන විෂය හා සම්බන්ධ පහත සඳහන් විශේෂ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
  - "පින්ලන්තයේ අධ්‍යාපනය හා එහි නව ප්‍රවනතා" යන මැයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) උපදේශක Andeßon Longman මහතා විසින් පැවැත්වීම.
  - "මැලෙසියාවේ තාක්ෂණික වෘත්තීය විෂයමාලාව" යන මැයෙන් මලයා විශ්ව විද්‍යාලයේ සහාය මහාචාර්ය Norlidah Alias සහ ආචාර්ය Dorathy Dewitt විසින් පැවැත්වීම.

- "අග්‍රහාර රක්ෂණ ආවරණය" ආයතනයට හඳුන්වා දීමට මූලික පියවර ගැනීම හා එම රක්ෂණයේ මාසික වාරිකයෙන් භාගයක් ආයතනයේ ආදායමෙන් දැරීමට කටයුතු කිරීම.

## 3.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.

විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දොපර්තමේන්තු 7ක්, විද්‍යා තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් හා ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව 2017 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති 64ක් ක්‍රියාත්මක කරන ලදී. විෂයමාලා සංවර්ධන කාර්ය තුළින් පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අතර, යම් යම් බාධක මධ්‍යයේ වුව ද එම අපේක්ෂා වැඩි ප්‍රමාණයක් ලඟ කර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය සමත් වී ඇත.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.

- විෂයමාලා නවීකරණ හා සමඟ ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.

- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේ කාර්යවල නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.

- විෂයමාලා සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.

- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.

- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.

- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සෑම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

පහත දැක්වෙන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව යථාවත් විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම 2015 වර්ෂයේ දී ආරම්භ වූ අතර, එහි ඊ ලඟ පියවර 2018 වසරේ දී 3,9, හා 13 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විෂයමාලා සංවර්ධන හා පුහුණු කටයුතු 2017 වසරේ දී ඉටුකරන ලදී.

**වගුව 4 : 2012 - 2020 විෂයමාලා චක්‍රය සඳහා වන විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම**

| කාර්යය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|
| විෂයමාලා ව්‍යාප්ති සටහන් සැකසීම (Grid) | 1-5<br>6-11 ශ්‍රේණි | | | | | | | | |
| විෂය නිර්දේශ සකස් කිරීම | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8 ශ්‍රේණි | 3,9,12 හා 13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | | | |
| ගුරු අත්පොත් සැකසීම | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | | |
| දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක | | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කිරීම | | | | | | | | | |
| විෂයමාලාව ක්‍රියාත්මක කිරීම | | | | 6,10 ශ්‍රේණි | 1,7,11 ශ්‍රේණි | 2,8,12 ශ්‍රේණි | 3,9,13 ශ්‍රේණි | 4 ශ්‍රේණි | 5 ශ්‍රේණි |

**විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2017 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.**

3.1 ප්‍රාථමික අධ්‍යාපනයට අදාළව නිම කළ කාර්ය

- 3 වන ශ්‍රේණියට අදාළව සකස් කළ ගුරු මාර්ගෝපදේශ 12 සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම් අන්තර්ගත කොට පාඩම් නැවත සමාලෝචනය කොට ශක්තිමත් කිරීම.
- 4 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සැලසුම්ගත සෙල්ලන් හා ක්‍රියාකාරකම් අන්තර්ගත කොට ක්‍රියාකාරකම් කෙටුම්පත් කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට අදාළ ඇගයීම් උපකරණ සකස් කිරීම.
- සම්පිණ්ඩිත ඇගයීම හඳුන්වාදීමේ පොත් පිංච සකස් කිරීම හා ඒ පිළිබඳව ප්‍රාථමික අධ්‍යාපන කණ්ඩායම් සාමාජිකයන් 130 දෙනෙකු දැනුවත් කිරීම.
- ප්‍රාථමික ශ්‍රේණිවලට අදාළ වාචික ඉංග්‍රීසි විෂයයේ ක්‍රියාකාරකම් සම්බන්ධ කිරීමට අතිරේක විෂයමාලා ද්‍රව්‍ය 10ක් සැකසීම.
- සමාජ ඒකාබද්ධතාව, ආපදා අවදානම් අවම කිරීම, කාලගුණය වෙනස්වීම යන තේමා ප්‍රාථමික අධ්‍යාපනය තුළ ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සැකසීම.
- 3 වන ශ්‍රේණියේ විෂයමාලාව තුළ සමාජ ඒකාබද්ධතා සංකල්ප සවිමත් කිරීමට අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සැකසීම.
- පූර්ව ළමාවිය (වයස අවුරුදු 9) සංවර්ධන ප්‍රමිතීන් හඳුනාගැනීමේ අධ්‍යයන වාර්තාව සකස් කිරීම.
- පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සැකසීම.
- දෙවන ජාතික භාෂාව ඉගැන්වීම සවිමත් කිරීමට ප්‍රාථමික පළාත් අධ්‍යාපන කණ්ඩායම් සාමාජිකයන් 360ක් දැනුවත් කිරීම.
- 3වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සම්පත් දායකයන් 619 දෙනෙකු සඳහා පැවැත්වීම.

**3.2 ද්විතීයික අධ්‍යාපනයට අදාළ ව නිම කළ ගුරු අත්පොත්**

- 12 වන ශ්‍රේණියට අදාළ ගුරු මාර්ගෝපදේශ 02
- 13 වන ශ්‍රේණියට අදාළ ගුරු මාර්ගෝපදේශ 24
- 9 වන ශ්‍රේණියට අදාළ ගුරු මාර්ගෝපදේශ 04

**අතිරේක විෂයමාලා ද්‍රව්‍ය**

- 12/13 ශ්‍රේණි සිංහල විෂයය සඳහා අතිරේක කියවීම් ද්‍රව්‍ය.
- සිංහල විෂයය (6වන ශ්‍රේණිය) සඳහා වැඩ පොත.
- සිංහල විෂයය (12 / 13 ශ්‍රේණි) සඳහා ශිෂ්‍ය පරික්ෂණ අයිතම සැකසීම.
- දෙමළ විෂයය (13 ශ්‍රේණිය) සඳහා ශිෂ්‍ය පරික්ෂක අයිතම සැකසීම.

- දෙවන ජාතික භාෂාව (7 හා 11 ශ්‍රේණි) වැඩ පොත් 2ක් සැකසීම.
- ඉංග්‍රීසි භාෂාව (9 ශ්‍රේණිය ) සඳහා අතිරේක ද්‍රව්‍ය හා CD පටයක් සැකසීම.
- චිත්‍ර, භරත නාට්‍ය හා පෙරදිග සංගීතය (9 හා 13 ශ්‍රේණි) සඳහා සම්පත් පොත් 6ක් සැකසිම.
- බටහිර සංගීතය (8 හා 13 ශ්‍රේණි) සඳහා සම්පත් පොත් 2ක් සැකසිම.
- හින්දු ධර්මය හා හින්දු ශිෂ්ටාචාරය (12 ශ්‍රේණිය) සඳහා සම්පත් පොත් 2ක් සැකසිම.
- භූගෝල විද්‍යාව (12/13 ශ්‍රේණි) සඳහා ශිෂ්‍ය පරීක්ෂණ අයිතම සැකසීම.
- ඉතිහාසය (12/13 ශ්‍රේණි) සඳහා සිතියම් පොතක් සැකසීම.
- වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අත්පොතක් සැකසීම.
- දේශපාලන විද්‍යාව හා තර්ක ශාස්ත්‍රය විද්‍යාත්මක ක්‍රමය යන විෂය සඳහා සම්පත් පොත් 2ක් සැකසීම.
- සංයුක්ත ගණිතය සඳහා සම්පත් පොතක් හා ශිෂ්‍ය පරික්ෂණ අයිතම සැකසීම.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිත විෂයය සමත්වීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා විද්‍යුත් නාමාවලියක් ( E- catalogue) සැකසීම.
- ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා ප්‍රායෝගික වැඩ පෙත් 2ක් සැකසීම.

**සඟරා /පුවත් පත්‍රිකා ප්‍රකාශන**

- "අයධනම්" නවරාත්‍රි සඟරාව
- ව්‍යාපාර අධ්‍යාපනය සඟරාව සිංහල / දෙමළ

**ශ්‍රව්‍ය /දෘෂ්‍ය ඉගෙනුම් උපකරණ**

- සිංහල ( 6-11 ශ්‍රේණි සඳහා) CD (ශ්‍රව්‍ය පටයක් සැකසිම)
- ජෛව පද්ධති තාක්ෂණවේදය සඳහා විෂය DVD 2ක් සැකසීම.
- අධ්‍යාපන මෘදුකාංග 30ක් සැකසිම

**සම්මන්ත්‍රණ / අධ්‍යාපනික තරඟ**

- ඉංග්‍රිසි හැකියා භාෂා තක්සේරුකරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- පාසල් සිසුන්ගේ සහභාගිත්වයෙන් ව්‍යවසායකත්ව අධ්‍යාපනය විෂයය පාසල් ළමුන් අතර ප්‍රචලිත කිරිම සඳහා ව්‍යාපාරික අදහස් හා සම්බන්ධ තරඟ 2ක් (සිංහල හා දෙමළ) සංවිධානය කිරීම.

**අධ්‍යාපනික වාර්තා**

- කෘෂි හා ආහාර තක්ෂණවේදය, නිර්මාණ තාක්ෂණවේදය, ගෘහ ආර්ථික විද්‍යාව, ශිල්ප කලා, තාක්ෂණය සඳහා විද්‍යාව, ගිණුම්කරණය යන විෂය 10/11 ශ්‍රේණිවල ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳ නියමනය වාර්තා 5ක් සැකසිම.
- ගණිතය විෂයය නව විෂය නිර්දේශ 7 සහ 11 ශ්‍රේණිවල ක්‍රියාත්මක වන ආකාරය නියාමනය පිළිබඳ වාර්තාව සැකසීම.

**දැනුවත් කිරීමේ වැඩ සටහන්**

- ගෝලීය පුරවැසිභාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් ගුරුඋපදේශක හා විෂයමාලා අධ්‍යක්ෂවරු 159 දෙනෙකු සඳහා පැවැත්වීම.
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති සහ විෂය අධ්‍යක්ෂවරු 821 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ගුරුවරුන් 500 දෙනෙකු සඳහා පැවැත්වීම.

**පුහුණු වැඩසටහන් පැවැත්වීම**

යථාවත් විෂයමාලාව පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක කිරීම සඳහා විෂය අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් සඳහා පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩමුළු සඳහා සහභාගි වූ සංඛ්‍යා පහත සඳහන් වෙයි.

| **ශ්‍රේණිය** | **2017 සඳහා ඉලක්කය** | **2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුහුණු වූ ගුරුවරු සංඛ්‍යාව** |
|---|---|---|
| 9 ශ්‍රේණිය | 7425 | 6620 |
| 11 ශ්‍රේණිය | 1040 | 1012 |
| 12 / 13 ශ්‍රේණිය | 26950 | 24786 |
| | | |

### 3.3 දහතුන් වසරක සහතික කළ අධ්‍යාපන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

ජාතික අධ්‍යාපන ආයතනය ආරම්භයේ සිට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විෂයමාලා සංවර්ධන කාර්ය හා සම්බන්ධව අවස්ථා කිපයක දී විවිධ අත්හදා බැලීම්, සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කරනු ලැබුව ද පළමු ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් අතරින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය දක්වා වූ වසර දහයක පාසල් අධ්‍යාපන කාලය අතරතුර දී මෙන් ම අවසානයේ දී විශාල ප්‍රතිශතයක් ඉගෙනුම් සමාජයෙන් ඉවත් වෙයි. නූතන ලෝකයේ සාර්ථක පුරවැසියකු සේ ජීවත්වීමට අවශ්‍ය දැනුමක්, නිපුණතාවක් හෝ ශක්‍යතාවක් උරුම කර නොගෙන මෙසේ විශාල පිරිසකට සමාජයට එක්වීමට මග පෑදී ඇත්තේ පවත්නා දැඩි ව්‍යුහගත විෂයමාලාව සම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය හා ඇගයීම් ක්‍රමවේදවල පවත්නා ගැටළු සහගත තත්ත්ව හේතුවෙනි.

අධ්‍යාපන පද්ධතියෙහි පවත්නා මෙම පරතරය මෙන්ම ගෝලීය හා දේශීය වශයෙන් අධ්‍යාපනයෙහි ගොඩනැගී ඇති නැම්යා හා දිශානතීන් මෙන්ම නව ප්‍රවණතා හඳුනාගත් රජය දරුවන්හට සාර්ථක ඵලදායි අධ්‍යාපනයක් ලබා දීම සඳහාත් නිදහස් අධ්‍යාපන සංකල්පය රට තුළ යථාර්ථයක් බවට පත්කිරීම සඳහාත් දහතුන් වසරක සහතික කාරන ලද අධ්‍යාපන වැඩ සටහන නමින් නව අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනාව හඳුන්වා දෙන ලදී.

ඒ හා සම්බන්ධිත විෂයමාලා සංවර්ධන කාර්ය හා පුහුණු කටයුතු 2016 වසරේ අගභාගයේ දී ජාතික අධ්‍යාපන ආයතනයට පැවරුණු අතර, එම වැඩ සටහනේ පොදු විෂය සංරචකයට අදාළ විෂය ක්ෂේත්‍ර 8ක් සඳහා විෂය නිර්දේශ හා මොඩියුල සකස් කිරීමත් විෂය කාණ්ඩ 7 යටතේ ක්‍රියාත්මක වන නව වෘත්තීය විෂය 26ක් සඳහා විෂයමාලා හා මොඩියුල සකස් කිරීම 2017 වසර තුළ ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටු කරන ලදී.

ඊට අමතරව යථෝක්ත වැඩසටහන නියාමක අදියරයක් ලෙස පාසල් පද්ධතියේ ක්‍රියාත්මක කිරීමට තෝරාගත් පාසල් 42 ක ගුරුවරුන් 418 දෙනෙකු පුහුණු කිරීම ද 2017 වසර තුළ දී ඉටු කරන ලදී.

## 4.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම මීපේ පිහිටුවා ඇති අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයට පැවරී ඇති ප්‍රධාන කාර්යයයි. යථෝක්ත කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන කළමනාකරණය සහ පාසල් පරිපාලනය යටතේ අධ්‍යාපන විද්‍යාපති කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවේ සිට අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව දක්වා පරාසයක පැතිරුණු පාඨමාලා රැසක් අධ්‍යාපන කළමනාකරුවන් පරිපාලකයන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් වෘත්තීය සංවර්ධනය අරමුණු කර ගනිමින් ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ පරිශ්‍රයෙහි දී ක්‍රියාත්මක කරන ලදී.

ඊට අමතරව, පද්ධතියෙහි සිටින අධ්‍යාපන පරිපාලන සේවයට අයත් නිලධාරීන් සඳහා කෙටිකාලීන පුහුණු පාඨමාලා සහ අධ්‍යාපන පරිපාලන සේවයට බඳවාගත් නවක නිලධාරීන් සඳහා විශේෂ වශයෙන් සකස් කළ දිගුකාලීන ප්‍රේරණ පාඨමාලා ක්‍රියාත්මක කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරනු ලැබේ.

පහත සඳහන් වගුව අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පීඨය 2017 වසරේ දී පවත්වන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු ගෙනහැර දක්වයි.

**වගුව 5 : වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර - 2017**

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා**<br>අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 32 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා**<br>පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන පාඨමාලාව) | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 303 |
| **ඩිප්ලෝමා පාඨමාලා**<br>පාසල් කළමනාකාරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 324 |

| | | | |
|---|---|---|---|
| විදේශීය සිසුන් සඳහා වන පාඨමාලා අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 15 |

## 5.0 ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන පද්ධතියෙහි නියැළි වෘත්තීකයින් සඳහා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා පාදක කරගනිමින් විශාල පරිමාණයෙන් විවිධ ගුරු කණ්ඩායම් සඳහා නවීකරණ හා විධි ක්‍රම හඳුන්වාදීමේ දීර්ඝකාලීන අත්දැකීම් රාශියක් ජාතික අධ්‍යාපන ආයතනය ලබා ගෙන ඇත. පද්ධතියට හඳුන්වා දෙනු ලබන විෂයමාලා සංවර්ධන හෝ වෙනත් ඕනෑම සංවර්ධනාත්මක කාර්යයක සාර්ථකත්වය රඳා පවතින්නේ ඒවා ක්‍රියාත්මක කරනු ලබන ගුරුවරුන් සතුව ඒ පිළිබඳව මනා අවබෝධයක් හා දැනුවත් බවත් ඇත්නම් පමණි. ඔවුන් ඵලදායී ක්‍රියාකාරීන් කිරීම සඳහා ඉවහල් වන අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පැතිරුණු පාඨමාලා රැසක් ගුරු අධ්‍යාපනය හා සම්බන්ධ දෙපාර්තමේන්තු සහ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තු කීපයක් විසින් දිවයින පුරා විහිදුණු ප්‍රාදේශීය මධ්‍යස්ථාන රැසක් ද කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් නාභිගත කොට ඇත්තේ අධ්‍යාපන වෘත්තිකයින්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා ඉටුකිරීම සහ පහත සඳහන් අරමුණු ඉටුකරගත හැකි ගෞරවණීය ගුරු පිරිසක් බිහි කිරීමේ අපේක්ෂා පෙරදැරි කර ගනිමිනි.

- අධ්‍යාපනයේ නව දිශානතීන් හඳුනාගැනීමට සමත්කම් දක්වන;
- පුළුල් විෂය දැනුම සහ එය පංතිකාමරය තුළ මනා ලෙස භාවිත කිරීමට සමත්;
- ඉගැන්වීමේ සහ පංති කාමර කළමනාකරණ කුසලතා උසස් මට්ටමින් සංවර්ධනය කරගත හැකි;
- සිසුන්ගේ පෞද්ගලික විවිධතාවලට ගැලපෙන අයුරින් ඵලදායී වැඩ සැලසුම් කළ හැකි;
- දෙමව්පියන්ගේ දැනුම හා ශක්‍යතා හා හැකියා ඵලදායී ලෙස ලබාගැනීමට වැඩ සැලසුම් කළ හැකි;
- හොඳ ඉගැන්වීමක් සඳහා අවශ්‍ය පොදු නිපුණතා ගොඩනංවා ගත හැකි;
- කාර්යබද්ධ පුහුණුව සංවර්ධනය කර ගැනීමට ඉවහල්වන කුඩා පරිමාණයේ පර්යේෂණවල නියැළෙන;
- නිපුණතා පාදක කාර්යසාධනය සඳහා පුහුණුව ලබාගන්නා සහ
- ඉගැන්වීම සඳහා ස්වයං නිර්මාණී එළඹුමක් සංවර්ධනය කරගත හැකි;

පහත වගුව ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ විවිධ දෙපාර්තමේන්තු විසින් සහ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විසින් 2017 වසරේ දී පවත්වන ලද පාඨමාලා සහ එහි සහභාගිත්වය පෙන්නුම් කරයි.

වගුව 6 : ගුරු අධ්‍යාපන පාඨමාලා පිළිබඳ තොරතුරු - 2017

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 26 |
| අධ්‍යාපනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./යාපනය | 306 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 24 | 3950 |
| **උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 24 | 4905 |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ඉංජිනේරු තාක්ෂණවේදය) | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ මධ්‍යස්ථාන | 260 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | ජා.අ.ආ | 28 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ප්‍රාථමික අධ්‍යාපනය | ජා.අ.ආ | 47 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ. | 65 |
| සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 24 |
| උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය | ජා.අ.ආ. | 69 |
| අතිරේක භාෂා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. මධ්‍යස්ථාන 10 | 380 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| බ්‍රේල් පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 15 |

## 5.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල ගුණාත්මක සංවර්ධනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම මෙන්ම ගුරු මධ්‍යස්ථාන හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2017 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත දැක්වෙන කාර්ය පූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටුකර ඇත.

- ගුරු විද්‍යාලවල ප්‍රධාන විෂය ධාරාව යටතේ විශේෂ විෂය සහ වෘත්තීය විෂයවලට අදාළ විෂය නිර්දේශ 16ක් සැකසීම.
- ගුරු විද්‍යාලවල සාමාන්‍ය විෂයමාලාවේ අභ්‍යන්තර පරීක්ෂණ සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය වලින් ප්‍රශ්න පත්‍ර 12ක් සැකසීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල උප පීඨාධිපතිවරුන්ට අධ්‍යයන සැසි 09ක් පැවැත්වීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාවල ක්‍රියාත්මක වන ගුරු අධ්‍යාපන පාඨමාලා නියාමනය හා සුපරීක්ෂණයට සඳහා අවස්ථා 9ක් සහභාගී වීම.

- ධර්මාචාර්ය ගුරු සහායකයන් ලෙස බඳවා ගත් 294 දෙනෙකු සඳහා ගුරු පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාව, නේපාලය, මියන්මාරය, කාම්බෝජය සහ උස්බෙකිස්තානය යන රටවල්වල ගුරු අධ්‍යාපන පාඨමාලාවල සහ පෙළපොත්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්ප ඇතුළත් වී ඇති මට්ටම් අවබෝධ කර ගැනීම සඳහා යුනෙස්කෝ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කරනු ලබන "ආසියාවේ ගුරු අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය" පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කිරීම.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාවලට අදාළ ප්‍රායෝගික ඉගැන්වීම හා පෞරුෂත්ව ඇගයීම් පිළිබඳ උපදෙස් සංග්‍රහයක් සකස් කිරීම.
- ගුරු විද්‍යාල හා විද්‍යා පීඨ ගුරු අධ්‍යපඥයින්ට ක්‍රියාකාරකම් පාදක කර ගත් වාචික ඉංග්‍රීසි පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- විද්‍යා පීඨ ගුරු අධ්‍යාපනඥයින් 13 දෙනෙකු සඳහා "අධ්‍යාපනයේ මූලධර්ම හා අධ්‍යාපනික සමාජය" පිළිබඳ පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම.

## 6.0 විකල්ප අධ්‍යාපනය

විවිධ හේතූන් මත විධිමත් අධ්‍යාපන අවස්ථා අහිමි වූ දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා හිමි කර දීම සඳහා ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය විශේෂ අවධානයක් යොමුකර කටයුතු කරයි. ඒ අනුව සැමට අධ්‍යාපනය සහ යාවජීව අධ්‍යාපනය යන සංකල්ප සාර්ථක කර ගැනීම සඳහා නවීන තාක්ෂණය හා උපස්තම්භක සේවා ලබා දෙමින්

විකල්ප අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වන අන්තර්කරණ අධ්‍යාපන, විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තු හා මාර්ගෝපදේශන හා උපදේශන අංශය මගින් 2017 වර්ෂය තුළ ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

### 6.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා, සංඥා භාෂා ඩිප්ලෝමා ආදි පාඨමාලා ඔස්සේ අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි ගුරුවරුන්හට වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අන්තර්කරණ අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය 02ක් සම්පදානය කිරීම: (ඔටිසම් තත්ත්වය සහිත දරුවන් සහ විවිධ දුබලතා සහිත දරුවන් සඳහා)

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 40 දෙනෙකු හඳුනාගෙන, එම දරුවන් සමඟ කටයුතු කරන දෙමාපියන් සඳහා උපදේශන සේවා ආරම්භ කිරීම.
- අධ්‍යාපන විද්‍යාපීඨ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ විශේෂ අධ්‍යාපනය හැදෑරූ ඩිප්ලෝමාධාරීන් එම ක්ෂේත්‍රයෙහි තවදුරටත් රැඳී නොසිටීම සඳහා බලපාන හේතු හඳුනා ගැනීම සඳහා කරනු ලබන අධ්‍යයනයේ කෙටුම්පත සැකසීම.
- විශේෂ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.
- සංඥා භාෂාව පිළිබඳ උපදේශාත්මක සංයුක්ත තැටියක් නිෂ්පාදනය කිරීම.
- අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍ර හා සම්බන්ධ ගුරු උපදේශවරු හා ගුරුවරුන් 821 දෙනෙකු පුහුණු කිරීම.

## 6.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම් - ඉගැන්වීම් මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගන්නා රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කරලීම සඳහාත්, විෂයමාලාවේ කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි.

2017 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් වෙයි.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද සාරවත් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික අංශ සඳහා අධ්‍යාපන විඩීයෝ වැඩසටහන් 20ක් (සිංහල /දෙමළ) නිෂ්පාදනය කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා සිංහල මාධ්‍ය උපකාරක වීඩියෝ වැඩසටහන් 21ක් සැකසීම.

## 6.3 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

පාසල් පද්ධතිය හා සම්බන්ධ ප්‍රජාවගේ මානසික ව්‍යාකූලතා නැති කිරීම සඳහා මනෝ සමාජයීය මැදිහත් වීමක් ලබා දීමේ අරමුණ ඇතිව 2006 වසරේ ජූනි මාසයේ දී නව උපදේශන හා මාර්ගෝපදේශන ඒකකයක් ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම මෙම ඒකකයට පැවරී ඇති වගකීමයි. 2017 වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- පාසල් සිසුන් හා දෙමාපියන් 36 දෙනෙකු සඳහා උපදේශන සැසි පැවැත්වීම.

- සබරගමුව, මධ්‍යම, හා ඌව පළාත්වල ගුරුවරුන් 133ක් සඳහා පාසල් උපදේශනය සම්බන්ධව
  යාවත්කාලීන කිරීම.
- රැකියා ක්ෂේත්‍ර 8කට අදාළ වෘත්තීය මාර්ගෝපදේශන නාමාවලිය - 2016 (Job Inventory) සැකසීම. (රථවාහන, ගොඩනැගිලි ඉදිකිරීම, රෙදිපිළි කර්මාන්තය, හෝටල් හා සංචාරක, බැංකු සහ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය)
- රැකියා ක්ෂේත්‍ර 02ට අදාළ වෘත්තීය මාර්ගෝපදේශන නාමාවලිය - 2017 සැකසීම. (වෛද්‍ය හා සෞඛ්‍ය, විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සන්දේශ)

## 6.4 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගී කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම්ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාට ම අධ්‍යාපනය ලබා දීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම්ලාභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

විවෘත පාසල් ඒකකය විසින් විවෘත ඉගෙනුම සම්බන්ධව 2017 වර්ෂයේ දී ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- සාක්ෂරතා, පදනම් හා විවෘත ද්විතියික පාඨමාලාවල උපදේශකවරු 83 දෙනකු යාවත්කාලීන කිරීම.
- විවෘත පාසල් ඉගෙනුම්ලාභින් සඳහා අභිමුඛ සැසි 69ක් පැවැත්වීම.
- සාක්ෂරතා පාඨමාලාව සඳහා ඉගෙනුම්ලාභින් 110ක් හා පදනම් පාඨමාලාව සඳහා ඉගෙනුම්ලාභින් 400ක් බඳවා ගැනීම.
- ඉගෙනුම්ලාභින් 210කු සාක්ෂරතා පාඨමාලාවන්, ඉගෙනුම්ලාභින් 190කු පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කිරීම හා විවෘත ද්විතීක පාඨමාලාවට ඇතුළත් ඉගෙනුම්ලාභින් 1400ක් සඳහා අඛණ්ඩව අධ්‍යයන සැසි ක්‍රියාත්මක කිරීම.

## 7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධනය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම

සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව යටතේත් ආයතනයේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ නියාමනය සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව යටතේත් ක්‍රියාත්මක වෙයි.

## 7.1 පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සහ නියාමනය අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදය සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීම තුළින් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2017 දී නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අ.පො.ස. උසස් පෙළ 13 වසර සිසුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳ අධ්‍යයනයේ වාර්තාව සැකසීම.
- පූර්ව සේවා ගුරු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනයේ වාර්තාව සැකසීම.
- 2020න් ඔබ්බට සිදුවන ඊළඟ විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා පූර්ණ පද්ධති විශ්ලේෂණය පිළිබඳ අවසන් කෙටුම්පත සැකසීම.
- පර්යේෂණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණයක් 81 දෙනෙකු සහභාගිත්වයෙන් පැවැත්වීම.
- "වෛද්‍ය අධ්‍යාපනය සහ කන්නන්ගර දර්ශනය" මැයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ළමා රෝගවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා විසින් පැවැත්වීම.

## 7.2 සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

2017 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ ප්‍රමුඛ කාර්ය පහත සඳහන් වෙයි.

- 2016 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම.
- 2018 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව සහ 2018 අයවැය වාර්තාව, 2018 - 2022 මධ්‍යකාලීන පස් අවුරුදු සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- දේශිය හා විදේශිය මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනය සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා 4ක් සකස් කිරීම.
- වෙනත් ආයතන වෙත ඉදිරිපත් කිරීමට පහත සඳහන් ප්‍රගති වාර්තා සකස් කිරීම.
    - මහ බැංකුවට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා 2ක් සකස් කිරීම.

- ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ආයතනික ප්‍රතිඵල රාමුව (ORF) යටතේ ප්‍රගති වාර්තා 04ක් සකස් කිරීම.
- රාජ්‍ය භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා 04ක් සකස් කිරීම.
- කෝප් කමිටුවට ඉදිරිපත් කිරීමට කාර්යසාධන වාර්තා (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සකස් කිරීම.
- ADB,TSEP.DFAT සහ UNICEF යනාදි විදේශීය මූල්‍යාධාර ආයතන වලට ඉදිරිපත් කිරීමට කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම.

## 8.0 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන, සැමට අධ්‍යාපන, පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨ මගින් කරනු ලබන සියලු ම කාර්ය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, පරිපාලන, මූල්‍ය හා සහායක සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. පරිපාලන මූල්‍ය හා සහාය සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන ඒ ඒ දෙපාර්තමේන්තු විසින් 2017 වසරේ දී ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

## 8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

එදිනෙදා ඉටුකරනු ලබන සාමාන්‍ය පරිපාලන රාජකාරි කටයුතු වලට අමතරව, 2017 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන බඳවා ගැනීම් සිදු කර ඇත.

- <u>බඳවා ගැනීම්</u>

| | | |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | - | 01 |
| සහකාර කථිකාචාර්ය | - | 25 |
| සහකාර අධ්‍යක්ෂ (මුදල්) | - | 01 |
| කාර්යාල ලේකම් | - | 01 |
| පොත් තබන්නා | - | 01 |
| සිවිල් ඉංජිනේරු | - | 01 |

<u>උසස්වීම්</u>

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 02 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - | 25 |
| කථිකාචාර්ය | - | 10 |
| මානව සම්පත් කළමනාකරණ | - | 01 |
| මූල්‍ය නිලධාරි | - | 01 |
| තාක්ෂණ නිලධාරි | - | 01 |

කළමනාකරණ සහකාර 1 (තාක්ෂණික නොවන) - 13

කළමනාකරණ සහකාර 11 (තාක්ෂණික නොවන) - 04

කළමනාකරණ සහකාර 1 (තාක්ෂණික) - 06

කාර්යාල ආධාරක 1 - 07

කාර්යාල ආධාරක 11 - 06

කම්කරු - 01

- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 40 දෙනෙකු විසින් පාඨමාලා හැදෑරීම සම්බන්ධව කරන ලද ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීම.

## 8.2 මුදල් දෙපාර්තමේන්තුව

ආයතනයේ සියලු ම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් සිදු කරයි. ඒ යටතේ එම දෙපාර්තමේන්තුව ඉටු කළ ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් වෙයි.

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.
- 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.

## 8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යාම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලැබේ. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2017 වර්ෂයේ දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- මහරගම සහ මීපේ පරිශ්‍රයෙහි ලොකු කුඩා ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු 31ක් සම්පූර්ණ කිරීම.
- විදුලිය සම්බන්ධ වැඩි දියුණු කාර්යයන් 40ක් සම්පූර්ණ කිරීම.
- ආයතනයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු 13ක් සම්පූර්ණ කිරීම
- ආයතනයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය සහ අතුරු මාර්ග සංවර්ධනය කිරීම.

## 8.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ

වෙනත් ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරණයට බඳුන් වේ. එම පුස්තකාලයට 2017 වසරේ දී අලුතින් එකතු කරගන්නා ලද පොත් පත් හා සංයුක්ත තැටි ප්‍රමාණය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පොත් | - | 1664 |
| පොත් (පරිත්‍යාග) | - | 82 |
| විෂයමාලා ද්‍රව්‍ය | - | 868 |
| අධ්‍යාපනික වාර්තා | - | 126 |
| දේශීය වාර සඟරා (පරිත්‍යාග) | - | 15 |
| දේශීය වාර සඟරා | - | 08 |
| විදේශීය වාර සඟරා (පරිත්‍යාග) | - | 12 |
| ජා.අ.ආ එකතුව | - | 21 |
| පුවත් සඟරා | - | 05 |
| DVD / CD | - | 18 |

## 8.5 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලසීමාව තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ - 24
- විෂය නිර්දේශ - 103
- ගුරු පුහුණු අත්පොත් - 22
- අමතර ප්‍රකාශන - 84
- සහතික - 19
- අතිරේක විෂයමාලා ද්‍රව්‍ය - 79
- අමතර ප්‍රකාශන - 110
- ආරාධනා පත්‍ර - 06

ඉහත සඳහන් මුද්‍රණ සහ ප්‍රකාශන කාර්යයන්ට අමතරව, පොත් ප්‍රදර්ශන අවස්ථා පහකට සහභාගි වීමට 2017 වසරේ දී අවස්ථාව ලබා ගෙන ඇත.

මගේ අංකය / எனது இல. / My No. : ඊඩියූ/සී/එන්අයිඊ/එෆ්ඒ/1/17 | ඔබේ අංකය / உமது இல. / Your No. : | දිනය / திகதி / Date : 2018 ඔක්තෝබර් 15 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ජාතික අධ්‍යාපන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.




No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

පසුගිය වර්ෂ 09 කට අදාළව එකතුව රු.72,188,213 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් සහ රු.8,889,405 ක් වූ සේවක භාරකාර අරමුදල් සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.81,077,618 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර වියදම් නියමිත කාලපරිච්ඡේදයේදී හඳුනා නොගැනීම නිසා 2016 හා 2017 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල සංගතතාවය සහ සන්සන්දනාත්මකභාවය නොමැති වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා උපකරණ අත්පත් කරගැනීම් රු.46,089,932 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව එම වටිනාකම රු.24,421,416 ක් වූයෙන් මුදල් ගලා යෑම් රු.2,668,516 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුල වෙනත් ජංගම වත්කම් වැඩිවීම් ලෙස රු.114,177 ක් දක්වා තිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ එවැනි වත්කමක් දක්වා නොතිබුණි.

(iii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය තුල කෙටි කාලීන තැන්පතු වෙනස්වීම් රු.54,227,194 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුල උපචිත වියදම් වැඩිවීම් රු.37,467,998 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(v) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල දේපල පිරියත උපකරණ විකුණුම් අලාභ රු.1,299,765 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 47 වගන්තිය ප්‍රකාරව වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට එම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද වටිනාකම රු.1,175,975,418 ක්වූ ආයතනයේ වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ප්‍රමිතයේ 15 ඡේදය ප්‍රකාරව තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු වුවද පොත් තොග ශේෂය රු.24,498,345 ක් ලෙස විකුණුම් මිලට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.50,000,000 ක් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය සහ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානයක් ලෙස ලැබී තිබුණු රු.169,000 ක් වටිනා කාර්යාල උපකරණ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණු පාරිතෝෂික වියදම් රු.5,547,436 ක් වූ පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික වියදම් ගිණුමට හරකර තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ගිණුම් ගතකර තිබුණු රු.6,418,346 ක භාණ්ඩාගාර බිල්පත් පොළිය නැවතත් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු භාණ්ඩාගාර පොළියක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ ලැබිය යුතු පොළී ආදායම එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි.

(ඉ) ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කළ යුතු රු.2,344,710 ක් වූ වියදම් හා යන්ත්‍ර මිලදීගැනීම සඳහා දරා තිබූ රු.26,656,147 ක් නඩත්තු වියදම් ලෙස දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී මීපේ දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම් වියදම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර තිබුණද එම ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු උපදේශක ගාස්තු රු.603,235 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයවන විටද ප්‍රාග්ධනීත නොකර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂ හා ලෙජර් ගිණුම්වල දක්වා තිබූ ශේෂ අතර එකතුව රු.37,957,303 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ හා විගණනයට ඉදිරිපත් කර තිබූ උපලේඛනවල ශේෂ අතර එකතුව රු.58,341,508 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු ලෙස රු.73,609,665 ක පුරෝකථනය කරන ලද අගයක් ගිණුම්වල දක්වා තිබුණද එම ශේෂය සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) එකතු වටිනාකම රු.514,112,042 ක් වූ ගොඩනැගිලි, පරිගණක හා උපාංග, ඡායා පිටපත් යන්ත්‍ර, පුස්තකාල පොත්, ගෘහ භාණ්ඩ උපකරණ යන වත්කම්වල එම වත්කම් මිලදීගත් දිනයන් සඳහන් නොවූ බැවින් එම වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රමාණය හා සමුච්චිත ක්ෂය ගණනය කිරීම් පිළිබඳ නිවැරදිතාවය තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඇ) ජංගම ගිණුම් 05 කට අදාළ ලැබීම් හා ගෙවීම් මුදල් පොත් වෙන වෙනම පවත්වා ඇති අතර ලැබීම් මුදල් පොත්වල මාසික මුළු ලැබීම් එකතුව සහ ගෙවීම් මුදල් පොත්වල දෛනික මුදල් ශේෂ ලබාගැනීමට හැකි වුවද මාසය අවසානයේ ශේෂ ලබාගත නොහැකි බව නිරීක්ෂණය විය. ආයතනයේ ඇති පරිගණක පද්ධතිය මගින් ආරම්භක මුදල් ශේෂයට මාසික ලැබීම් එකතුකර මාසික ගෙවීම් අඩුකර මාසිකව අවසන් ශේෂය ලබාගත නොහැකි අතර මෙම නිසා වර්ෂය අවසානයේ එක් එක් ගිණුම්වල 2017 දෙසැම්බර් 31 දිනට රු.468,696,829 ක මුදල් ශේෂයක් පැවතියද මුදල් පොතේ ශේෂ සමග මෙම ශේෂ සනාථ කර ගැනීමට නොහැකි විය.

## 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ පාසැල් පදනම් කරගත් ඇගැයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800 ක් 2008 වර්ෂයේ සිට අයවිය යුතුව තිබුණි.

(ආ) වර්ෂ 05 ඉක්මවා තිබුණු එකතුව රු.1,574,603 ක ගෙවිය යුතු තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ ණයගැති ශේෂය තුළ ඇතුළත් වර්ෂ ගණනාවක සිට අයවිය යුතුව පැවති රු.393,500 ක ශේෂය ප්‍රවර්තන වර්ෂයේදිද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 හා 2017 වර්ෂවල පවත්වන ලද වැඩමුළු වෙනුවෙන් නිකුත් කර තිබූ අත්තිකාරම්වලින් රු.5,027,588 ක් ද ප්‍රවාහන හා වෙනත් අත්තිකාරම් රු.4,072,955 ක් හා වර්ෂ 05 ඉක්මවා තිබුණු රු.60,431 ක පොදු අත්තිකාරම්ද සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016 සංශෝධිත) දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛයේ 3.1 වගන්තිය | පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර 2015 නොවැම්බර් 7 දින සිට 2016 මැයි 12 දින දක්වා පුස්තකාලය මගින් සිදුකර තිබූ පුස්තකාල පොත් සමීක්ෂණයට අනුව, අපහරණය කළ යුතු පොත් 11,642 ක් හඳුනාගෙන තිබුණද එම පොත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු.1,000,000 ඉක්මවා අත්තිකාරම් ලබාදීමේදී චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරයේ පූර්ව අනුමතිය ලබාගත යුතුය. එහෙත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.2,661,303 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු අතර එක් අත්තිකාරමක් පියවීමට පෙර නැවත අත්තිකාරමක් ලබාදී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 716 (2) | භාණ්ඩ මිලදීගැනීමේදී සැපයීමේ විශ්වාසභාවය හා ඉක්මනින් සපයා භාරදීමේ හැකියාව යන කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු වුවත් 2017 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා ඇණවුම් කළ රු.3,888,687 ක් වටිනා භාණ්ඩ 21 ක් විගණිත දිනය වන විටත් ආයතනයට ලැබී නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 705 (5) | කොන්ත්‍රාත්තු පැහැර හැරී අයගේ නම් ඇතුළත් කර සැපයුම්කරුවන්ගේ අසාධු ලේඛනයක් ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | නිල වාහන වෙන්කර ඇති නිලධාරීන් සහ ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් විසින් සංචිත හෝ වෙනත් කාර්යාලීය වාහනයක් භාවිතා කිරීම සඳහා හිමිකම් නොලබන නමුත් ආයතනයේ ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරිණියක් අවස්ථා 11 කදී සංචිත වාහන භාවිතාකර තිබුණු අතර ඒ සඳහා රු.135,345 ක ඉන්ධන පිරිවැයක් ආයතනය විසින් දරා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.82,516,985 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.37,792,759 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,724,226 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.279,066,913 කින් වැඩි වී තිබුණද තැන්පතු ආදායම් රු.115,131,191 කින් සහ විභාග ගාස්තු රු.182,522,154 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.36,496,150 ක් වූ අතිරික්තය 2015 වර්ෂයේදී රු.157,631,150 ක් දක්වා වැඩිවී තිබූ නමුත් 2016 වර්ෂයේදී රු.37,792,759 ක් දක්වා අඩුවී තිබූ අතර නැවත සමාලෝචිත වර්ෂයේදී රු.82,516,985 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.257,724,220 ක් වූ ආයතනයේ දායකත්වය 2015 වර්ෂය අවසානයට රු.464,705,488 ක් දක්වා වැඩිවී තිබූ නමුත් 2016 වර්ෂයේදී රු.371,685,653 ක් දක්වා අඩුවී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී රු.404,042,670 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 4.7:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 3.7:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 4.3:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 3.5:1 ක් ව පැවතුණි. ජංගම වත්කම් වලින් සියයට 88 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැඳුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂවන අතර ඒ අනුව ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි. ආයතනය සතුව ඇති බැංකු ගිණුම් 05 න් එකක 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 298 ක ශේෂයක් පැවති අතර, අවශ්‍යතා ඉක්මවා මුදල් ශේෂ පවත්වා ගැනීමත් කෙටිකාලීන ආයෝජන සිදුකිරීමත් රු.මිලියන 36 ක තොග ශේෂයක් පැවතීමත් හේතුවෙන් ජංගම හා ක්ෂණික අනුපාත ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3.3 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගතවූ නිලධාරීන් 03 දෙනෙකුට එරෙහිව එකතුව රු.4,481,538 ක වන්දි ඉල්ලා ආයතනය විසින් දිසා අධිකරණයේ නඩු 03 ක් ගොනුකර තිබුණි.

(ආ) ගුරු පුහුණු සහතිකයක් ලබාගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් හා සේවක පාරිතෝෂික මුදලට ජීවන වියදම් දීමනාව ඇතුළත්ව නොගෙවීම සම්බන්ධයෙන් සේවකයන් 10 දෙනෙකු විසින් රු.927,091 ක වන්දි මුදලක් ඉල්ලා අධිකරණවල නඩු 11 ක් පවරා තිබුණු අතර පාරිතෝෂික දීමනා ගෙවීම් සම්බන්ධ නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය සඳහා සැලසුම්ගත වැඩසටහන් සකස් කිරීම, අධ්‍යාපන ක්‍රමයෙහි කාර්යසාධනය, අරමුණු ව්‍යුහ හා විෂය ප්‍රමාණය අතුළු අධ්‍යාපන ක්‍රමය පිළිබඳව හා අධ්‍යාපන සමාජීය, ආර්ථික හා වෙනත් අංශ පිළිබඳව අධ්‍යයන පවත්වා ගෙන යාම අධ්‍යාපන ක්‍රමයෙහි නියැලී සිටින කාර්යමණ්ඩලයේ වෘත්තීය හා කළමනාකරණ නිපුණත්වය වැඩිදියුණු කිරීම පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම ආදිය ආයතනයේ ප්‍රධාන අරමුණු වේ.

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉහත අරමුණු ඉටු කර ගැනීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක කර නොතිබුණු අතර එය සමස්ත ශ්‍රී ලාංකික සිසු දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි සෘජුවම බලපෑ හැකි බවද නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

(i) දැනුම හා නිපුනතා සංවර්ධන වැඩසටහන් 49 ක් මගින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීයවේදීන් 22,725 ක් පුහුණුකිරීම සඳහා සැලසුම්කර තිබුණද 15,743 දෙනෙකු පමණක් පුහුණුකර තිබුණි.

(ii) දෙපාර්තමේන්තු 10 ක් මගින් විෂයයන් 48 ක් සඳහා ගුරු මාර්ගෝපදේශ අත්පොත් සකස්කිරීම සඳහා සැලසුම්කර තිබුණද විෂයයන් 29 ක් සඳහා එම අත්පොත් සකස්කර නොතිබුණි.

(iii) විෂයයන් 30 කට අදාළ සම්පත්දායක පොත් සකස්කර අවසන් කිරීමට සැලසුම්කර තිබුණද විෂයයන් 25 ක් සඳහා සැලසුම් කළ පරිදි එම පොත් සකස්කර අවසන් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2013 ඔක්තෝබර් 09 දිනැති අංක 257 දරන චක්‍රලේඛය ප්‍රකාරව, නිලධාරීන්ගේ වැටුපට අමතරව උපයන ඉපයීම් ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුපෙන් සියයට 50 නොඉක්මවිය යුතුය. එහෙත් එම චක්‍රලේඛයට පටහැනිව 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැටුපෙන් සියයට 50 ඉක්මවා නිලධාරීන් 48 දෙනෙකුට රු.4,501,586 ක් අමතර ඉපයීම් ලෙස වැඩිපුර ගෙවා තිබුණු අතර 2018 අප්‍රේල් දක්වාම එම වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) විෂය නිර්දේශ සකස්කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විද්‍යා විෂයය - 6, 11 ශ්‍රේණි

6 ,10 ශ්‍රේණි සඳහා 2015 වර්ෂයේදීත් 7 , 11 ශ්‍රේණි සඳහා 2016 වර්ෂයේදීත් 8, 12 ශ්‍රේණි සඳහා 2017 වර්ෂයේදීත් හා 9,13 ශ්‍රේණි සඳහා 2018 වර්ෂයේදීත් වශයෙන් විද්‍යා විෂයය සඳහා නව විෂය නිර්දේශ හඳුන්වා දී තිබුණි.එහෙත් එම විෂය මාලා නවීකරණය කිරීමට පෙර සපුරාලිය යුතු කාර්යයන් සිදු කර ඒවා විෂය මාලා නවීකරණය කිරීමට පාදක කරගෙන තිබු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(ii) උසස් පෙළ 12,13 ශ්‍රේණි සඳහා රසායන විද්‍යාව,භෞතික විද්‍යාව, හා ජීව විද්‍යාව විෂය නිර්දේශ

2012-2020 විෂය මාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ඉහත සඳහන් විෂයයන් වලට අදාළ නව විෂයය නිර්දේශ 12 හා 13 ශ්‍රේණි සඳහා පිළිවෙලින් 2017 සහ 2018 වර්ෂවලදී ක්‍රියාත්මක කල යුතුව තිබුණි. ඒ අනුව, එම විෂය නිර්දේශ පිළිවෙලින් 2016 දෙසැම්බර් 15 හා 2016 නොවැම්බර් 08 දින පාලක මණ්ඩලය හා ශාස්ත්‍රීය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එහෙත් එම අනුමැතීන් නොසලකා, අමාත්‍යාංශ ලේකම්ගේ 2017 පෙබරවාරි 21 දිනැති අංක ඊඩී/01/14/05/02 දරන ලිපිය මගින් එම විෂය නිර්දේශ නැවත සලකා බැලීම සිදුකර තිබු අතර 2017 නොවැම්බර් 14 දින නැවත අනුමත කර තිබුණි. එහෙත් 2017 මැයි මාසය තුල 12 ශ්‍රේණියේ ඉගැන්වීම්

ආරම්භ කර තිබූ අතර අදාළ සංශෝධන සිදුකිරීමට පෙර රු.3,655,207 ක් වැයකර ගුරුවරුන් 3457 ක් 2017 මැයි හා අගෝස්තු මාස වලදී පුහුණු කර තිබීම හේතුවෙන් එම සංශෝධන සම්බන්ධයෙන් දැනුවත් වූයේද යන්න ගැටළු සහගත විය.තවද සංශෝධන තුළින් අන්තර්ගතය වෙනස්වී නොතිබීම හේතුවෙන් ඒ සඳහා ගතකළ කාලය හා දරන ලද රු.354,450 ක වියදම ඵලදායිද යන්න ගැටළු සහගත වූ අතර විෂය නිර්දේශ අප්‍රමාදව සකස් කර ගුරුවරුන් දැනුවත් කිරීමට හා නිවැරදි විෂය නිර්දේශ ඉගෙනීමට අවස්ථාව සලසාදීම සිදුවිය යුතු අත්‍යවශ්‍ය කරුණු ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂයය

- අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2012 පෙබරවාරි 14 දිනැති අංක ඊඩී/01/26/19/01/02 දරන ලිපියට අනුව, 6 සිට 9 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය අළුතින් ඇතුළත්කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. මෙම විෂයය සඳහා වූ නව විෂය නිර්දේශයේ ඒකකයක් සඳහා අන්තර්ජාල ගතවූ ද්‍රව්‍ය (IOT - Internet of Thing) යන්න ඇතුළත් කර තිබුණු නමුත් පළමුවරට මෙම විෂයය හදාරන සිසුන් සඳහා මෙම ඒකකය ඉගැන්වීම සුදුසු නැතිබවත්, සිසුන්ගේ මට්ටම අනුව එම විෂය ඒකකය ඉතා ඉහළ මට්ටමක පවතින බැවින් ඒ අනුව විෂය නිර්දේශය වෙනස් කළ යුතු බවත් 2017 ජනවාරි මාසයේදී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය දන්වා තිබුණි. කෙසේ වුවද මෙම විෂයය නිර්දේශ සංශෝධනය කර අනුමත කිරීම 2017 වර්ෂය අවසානය දක්වා ප්‍රමාද වීම හේතුවෙන් අදාළ පෙළපොත් සකස් කිරීම හෝ විෂයය ඉගැන්වීම සඳහා ගුරුවරු පුහුණුකිරීම 2018 ජනවාරි වන විටත් සිදුකර නොතිබුණි.

- 12 ශ්‍රේණිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හා උසස්පෙළ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂයය නිර්දේශ සකස්කිරීමේ වැඩමුළු පැවැත්වීම 2015 වර්ෂයේ ආරම්භ කර අතර 2016 මාර්තු මාසය වන විට අවසන් කර තිබූ 2016 දෙසැම්බර් සිට 2017 පෙබරවාරි 16 දක්වා විෂයය නිර්දේශ අවසන් කෙටුම්පත් සකස්කිරීමට වැඩමුළු පවත්වා තිබුණි. කෙසේ වුවද IOT විෂයය

ඒකකය පාසල් විෂයය නිර්දේශවලට නුසුදුසු බව 2017 මාර්තු 07 දිනැති අංක 366 දරන ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල තීරණය මගින් තීරණය කර තිබූ නමුත් එම තීරණය නොසලකා එම ඒකකය ඇතුළත් කර 2017 අප්‍රේල් 20 දිනැති අංක 413 දරන පාලක මණ්ඩල තීරණය මගින් විෂයය නිර්දේශ සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

- 13 ශ්‍රේණියේ විෂයය නිර්දේශය සඳහා අලුතින් එකතු කරන ලද පරිගණක ව්‍යාපෘතිය සහ පරිගණක භාෂාව පිළිබඳව නිර්දේශ ලබාගැනීම සඳහා නැවත වරක් 2017 දෙසැම්බර් 05 දින පැවති අංක 376 දරන ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය මගින් විශ්ව විද්‍යාල මහාචාර්ය හා ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණි. පාසල් පද්ධතියේ අ.පො.ස. (උසස් පෙළ) ඉගැන්වීම ආරම්භ කර තිබුණද අනුමැතිය ලැබී තිබුණු මෙම විෂයය නිර්දේශ සඳහා තවදුරටත් සංශෝධන එකතු කරමින් පැවතීම හේතුවෙන් 2019 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන්ට ගැටළු සහගත තත්ත්වයකට මුහුණදීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) ආගම්වලට අදාළ විෂයය නිර්දේශ පිළියෙල කිරීම

එක් එක් ආගම් සඳහා බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, ක්‍රිස්තියානි, කතෝලික ශිෂ්ටාචාරය ආදී විෂයය නිර්දේශ සකස්කිරීම, වැඩමුළු පැවැත්වීම, පරිවර්තන කිරීම, වාර්තා සකස්කිරීම සහ ගුරු අත්පොත් සකස්කිරීම ආදී සියළුම කටයුතු එක් නිලධාරියෙකු විසින් සිදුකරන අතර මෙම හේතුව නිසා සකස් කළ විෂයය නිර්දේශවල නිවැරදිතාවය පිළිබඳ ගැටළුකාරී තත්ත්වයක් ඇතිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යනය සඳහා වූ නව විෂයය නිර්දේශය

2017 අගෝස්තු 17 දිනැති අංක 417 දරන පාලක මණ්ඩල තීරණය අනුව, 12 ශ්‍රේණිය සඳහා සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන විෂයය නිර්දේශය හා ගුරු අත්පොත සකසා අනුමත කර තිබුණි. ඒ අනුව එම විෂය නිර්දේශය 2017/2018 වර්ෂවල ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණද මිනුම් මට්ටම (Level of Bench marking) පිළිබඳව ශාස්ත්‍රීය මණ්ඩලයේ අදහස් දැක්වීමට

අනුව 2008 වර්ෂයේ හඳුන්වා දී තිබූ පැරණි විෂයය නිර්දේශයම 2019 වර්ෂයේ උසස් පෙළ විභාගයේදී ද ක්‍රියාත්මක කිරීමට චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දී තිබුණි. එසේ වුවද, ඒ සඳහා චක්‍රලේඛයක් නිකුත් කර නොතිබූ අතර 2019 උසස් පෙළ සඳහා ඉදිරිපත්වන සිසුන් වෙනුවෙන් ඉගැන්වීම් කටයුතු කළ යුතු වන්නේ කුමන විෂයය නිර්දේශයද යන්න පිළිබඳව පාසල් දැනුවත් කර තිබුණ බවට සාක්ෂිද නිරීක්ෂණය නොවූයෙන් එය 2019 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් වෙත සිදුවන අසාධාරණයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ගුරු පුහුණු ආරම්භ කිරීම ප්‍රමාද වීම සහ ගුරු පුහුණු සංවිධානය කිරීමේ අවිධිමත් බව

2017 අප්‍රේල් මාසයේදී අනුමත කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂයය නිර්දේශය 2017 මැයි මාසයේ පාසල් පද්ධතිය තුල ඉගැන්වීම ආරම්භ කිරීමට නියමිතව තිබුණි. එහෙත් ඒ වනවිටද ගුරු පුහුණු කිරීම් ආරම්භ කර නොතිබූ අතර පුහුණු කළ යුතු ගුරුවරුන් 2223 ක් අතුරින් පාසල් පද්ධතියේ මෙම විෂයය ආරම්භ කර මාස 3 කට පසුව ගුරුවරුන් 1023 දෙනෙකු පමණක් පුහුණුකර තිබුණි. තවද පළාත හෝ කළාපය මගින් පුහුණු කිරීමට අවශ්‍ය ගුරුවරුන් කැඳවීම සිදුකිරීමකින් තොරව අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවීම මගින් ගුරුවරුන් තෝරා ගැනීම සිදුකර තිබුණි. මේ හේතුවෙන් අන්තර්ජාල හා පරිගණක පහසුකම් නොමැති ගුරුවරුන් දැනුවත් නොවීම හා ලංකාවේ අඩු පහසුකම් සහිත පාසල්වල මෙම විෂයයන්වලට අදාළ ගුරුවරුවන්ට පුහුණුවීම් ලබාගැනීමට නොහැකිවීම එම සිසුන්ට හා ගුරුවරුන්ට සිදුවන අසාධාරණයක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) විභාග පැවැත්වීම හා පරිපාලනය

(i) 2010/2011 අධ්‍යාපනපති අවසාන පරීක්ෂණයේදී සිදුව ඇති විභාග වංචාවට අදාල මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2013 ජූනි 28 දිනැති අංක 4050 දරන ආයතනික සභා තීරණය මගින් අනුමත කර තිබුණි. ඒ අනුව විභාග ප්‍රශ්න පත්‍ර සකස්කිරීම හා පිළිතුරු පත්‍ර පරීක්ෂාකිරීමේ කාර්යයන්ගෙන් පාඨමාලා සමායෝජකයින් හා දේශකවරුන් නිදහස්කරන ලෙස හා එම කාර්යයන් අයතනයේ හා සමාන්තර වෙනත් විද්‍යායතනයක සේවය කරන සුදුසුකම් ලත් අයගෙන් ඉටුකරවා ගත යුතු බව සඳහන් වුවද

විගණිත දිනය වූ 2018 මැයි 31 දක්වාම ප්‍රශ්න පත්‍ර සකස්කිරීම හා පිළිතුරුපත් පරීක්ෂාකිරීම පාඨමාලා දේශකවරුන් විසින් සිදුකර තිබුණු අතර එම නිසා විභාගවල රහස්‍යභාවය හා විනිවිධභාවය පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) ආයතනය මගින් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2000 දෙසැම්බර් 31 දිනැති කෙටුම්පත් විභාග උපදෙස් සංග්‍රහයේ අඩුපාඩු ඇති බැවින් වඩාත් නිවැරදි හා ශක්තිමත් විභාග උපදෙස් සංග්‍රහයක් පිළියෙල කරන ලෙස ඉහත විමර්ශන වර්තාව මගින් ලබාදුන් නිර්දේශ ආයතනික සභාව අනුමත කර තිබුණි. එහෙත් විධිමත් විභාග උපදෙස් සංග්‍රහයක් පිළියෙල කිරීම සඳහා 2013 වර්ෂයේ සිට මේ දක්වා වැඩමුළු 18 ක් පවත්වා ඇති නමුත් විගණිත දිනය වූ 2018 මැයි 31 වන විටත් එය සකස්කිරීමට පියවර ගෙන නොතිබුණි.ඒ අනුව රහස්‍යභාවය හා විශ්වාසභාවය ආරක්ෂා වන පරිදි විභාග සංවිධානය, ප්‍රශ්න පත්‍ර සකස්කිරීම, උත්තර පත්‍ර ඇගයීම හා විභාග පරිපාලනය විධිමත් නීතිමය රාමුවකට අනුව සිදු නොවීම හේතුවෙන් විභාග අක්‍රමිකතා හා විභාග නීති උල්ලංඝනයවීම් සිදු විය හැකි අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි තත්වයක්ද නිර්මාණය වන බව නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ විභාග 04 ක් පවත්වා නොතිබුණ අතර 2017 වර්ෂය තුලදී පවත්වා තිබූ විභාග 19 ක් අතරින් විභාග 08 ක ප්‍රතිඵල 2018 අප්‍රේල් මාසය වන විටත් නිකුත් කර නොතිබුණි. තවද 2015/2016 වර්ෂයන් වලදී පවත්වන ලද විභාග 08 ක ප්‍රතිඵල නිකුත් කිරීමට වසරකට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ඇ) අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා කළමනාකරණයට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම

---

ආයතනය විසින් පවත්වාගෙන යන උපාධි හා ඩිප්ලෝමා සම්පූර්ණ කළ බවට තොරතුරු සොයාගත හැකි මධ්‍යගත දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබූ අතර විවිධ උපාධි හා පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ගුරු සිසුන් එම පාඨමාලා නිමකිරීම, නැවත විභාගවලට පෙනී සිටීම මගින් පාඨමාලා සම්පූර්ණ කළ බවට තොරතුරුද ගුරු අධ්‍යාපන ආයතනය තුළ නොතිබුණි.

(ඉ) පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

(i) දැයේ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරන, විෂය මාලා සංවර්ධනය සහ වෘත්තීය සංවර්ධනය හා සම්බන්ධ ඉදිරි සංවර්ධනාත්මක කටයුතු සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගැනීමට ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන සිදුකළ යුතුව තිබුණද එවැනි පර්යේෂණ සිදුකර නොතිබූ අතර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සිදුකරන ලද පර්යේෂණ 7 ක් අතුරින් 06 කම ඇගයීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ii) විෂයය මාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, වසර 8 කට වරක් වෙනස්කම් හා සංවර්ධනයන් සිදුකිරීමට පෙර, පවතින විෂය මාලා පාසැල් පද්ධතියේ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්, විවිධ සමාජ කණ්ඩායම් මගින් පෙන්වා දෙන අදහස් හා එක් එක් විෂය ක්ෂේත්‍රවලට එක්වූ නව දැනුම් හා ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව අර්ථවත් පර්යේෂණ ආයතනයේ එක් එක් දෙපාර්තමේන්තු වෙත ලබාදීම හා කාලීන අධ්‍යාපන පර්යේෂණ මාතෘකා තෝරාගෙන පර්යේෂණ සිදුකිරීම හා එම පර්යේෂණ පිළිබඳ නියමිත කාල සීමාවන් තුල දැනුවත් කිරීම සඳහා අවධානය යොමුකර නොතිබුණි.

(ඊ) ගුරු අත්පොත් ප්‍රමාද වී මුද්‍රණය කිරීම

2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ විෂය මාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව,11 හා 12 ශ්‍රේණි සඳහා පිළිවෙලින් 2016 හා 2017 වර්ෂවලදී නව විෂය මාලාව ක්‍රියාත්මක කළ යුතු අතර ඊට අදාළව සකස්කරන ලද විෂය නිර්දේශ ඇතුළත් ගුරු අත්පොත් එම විෂය ඉගැන්වීම් ආරම්භ කිරීමට පෙර ගුරුවරුන් අතට පත්කළ යුතුය.එහෙත් ආයතනය විසින් සමහර විෂයයන් සම්බන්ධ විෂය නිර්දේශ හා ගුරු අත්පොත් සකස්කර අනුමත කිරීම පමණක් 2017 වර්ෂයේදී සිදුකර තිබුණු අතර විෂයයන් 14 කට අදාළ මෘදු පිටපත් 2018 ජනවාරි 31 දින වනවිටත් මුද්‍රනය කිරීමට කටයුතු කර නොතිබුණි.තවද 2017 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශ අනුව ඉගැන්වීම් ආරම්භ කළ යුතු නමුත් ගුරු අත්පොත් ගුරුවරුන් වෙත නොලැබීමෙන් විධිමත් අධ්‍යාපනයට බාධා ඇතිවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) භෝජනාගාරය පිළිබඳ පරීක්ෂාව

ආයතනය විසින් අරක්කැමියන් 09 දෙනෙකුගෙන් යුත් භෝජනාගාරයක් පවත්වාගෙන යන අතර 2017 වර්ෂයේදී එහි අදායම රු.8,375,309 ක් සහ මුළු වියදම රු.14,365,423 ක් විය. භෝජනාගාරයේ ආහාර සැපයීම වෙනුවෙන් ලැබූ ආදායම ඉක්මවා රු.5,990,114 ක වියදමක් දරා තිබුණු අතර ආයතනය මගින් වියදම් දරමින් භෝජනාගාරයක් පවත්වාගෙන යාම ඵලදායී නොවන බව නිරීක්ෂණය විය. තවද, භෝජනාගාරයෙන් ඇණවුම් කර තිබූ උදේ ආහාර වේල් 17,897 ක්ද දවල් ආහාර වේල් 33,774 ක්ද රාත්‍රී ආහාර වේල් 14,095 ක්ද ප්‍රතික්ෂේප කර තිබුණු අතර ආයතනය විසින් ඉල්ලුම් කරන ආහාර ඇණවුම් සැපයීමට භෝජනාගාරයට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණිත දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇති 10 ශ්‍රේණි පුහුණු ප්‍රශ්න පත්‍ර සංග්‍රහයේ සිංහල සහ දෙමළ භාෂා පිටපත් 10,000 ක් 11 ශ්‍රේණියේ පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සංග්‍රහයේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් 3,000 ක් මුද්‍රණය කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.3,787,500 ක මුදලක් මුද්‍රණ වියදම් වශයෙන් දරා තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද මෙම කිසිදු පොතක් මුද්‍රණයකර පාසල්වලට ලබාදී නොතිබුණි.

(ආ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු අරමුදලේ 2011 වර්ෂයේ සිට රු.8,750,000 ක් පැවතියද 2017 දෙසැම්බර් 31 දින වන තෙක්ම මෙම අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) අ.පො.ස. (උසස් පෙළ) තෝරාගත් විෂයයන් සඳහා සම්පත් මූලාශ්‍ර ග්‍රන්ථ 06 ක් සකස්කිරීමට හා මුද්‍රණය කිරීමට 2014 වර්ෂයේදී ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ කටයුතු දෙපාර්තමේන්තු ආධාර (DFAT/(AUSAID) මගින් රු.15,400,000 ක අරමුදල් ප්‍රතිපාදනය කර තිබුණු අතර වර්ෂ 04 ක කාලයක් අවසන් වී තිබුණු නමුත් එම ග්‍රන්ථ මුද්‍රණය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය දක්වාම එම අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) ආයතනයේ අරමුණුගත කාර්යයන්හි යොදවා ගැනීමකින් තොරව ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු.36,934,387 සිට රු.313,682,200 දක්වා වූ පරාසයන්හි මුදල් ශේෂ රඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

ආයතනයේ පවත්වාගෙන යන කිරිහල හා මීපේ නායකත්ව පුහුණු සංවර්ධන මධ්‍යස්ථානයේ ඇති ආපනශාලාව සඳහා ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් කිරිහලේ විදුලි බිල්පත සම්පූර්ණයෙන්ම හා ආපනශාලා බිල්පතෙන් සියයට 50 ක් ගෙවිය යුතු වුවත් 2017 වර්ෂයට අදාළ ආපනශාලා හා කිරිහලේ විදුලි ගාස්තු පිළිවෙලින් රු.136,312 ක් හා රු.108,550 ක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකරගෙන නොතිබුණි.

## 4.6 කාර්යමණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 652 ක් සහ තථ්‍ය සේවක සංඛ්‍යාව 452 ක් වූයෙන් පුරප්පාඩු 224 ක් පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයෙන් පසු 2011 වර්ෂයේදී අවසන් වරට කාර්යමණ්ඩලය අනුමත කරගෙන තිබූ අතර එය පිළිවෙලින් 646 ක් හා 652 ක් විය.ඒ අනුව 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය වන විට ආයතනයේ කාර්ය භාරය විශාල වශයෙන් පුළුල් වී තිබූ නමුත් කාර්ය මණ්ඩලය සංශෝධනය කර නොතිබීම හේතුවෙන් බොහෝ අංශවල කාර්යයන් ප්‍රශස්ථ අයුරින් ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය තුල එකම ශාඛාවක අවු 05 ත් 26 ත් අතර කාලයක් සේවය කර ඇති නිලධාරීන්ගේ / සේවකයන්ගේ සංඛ්‍යාව 69 ක් වූ අතර ආයතනය තුල අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් නොකිරීම ආයතනයේ අභ්‍යන්තර පාලනයට අහිතකර ලෙස බලපාන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) 2017 වර්ෂය තුල තනතුරු 28 ක් බඳවාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකර තිබුණද තනතුරු 12 ක් සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබුණි.

(ඇ) පුස්තකාලය සඳහා නිලධාරීන් 11 දෙනෙකු අනුමත කර තිබුණද 2018 අප්‍රේල් වන විට නිලධාරීන් 05 දෙනෙකු පමණක් සේවය කරන බව නිරීක්ෂණය වූ අතර වසර ගණනාවක සිට පුස්තකාල අධ්‍යක්ෂ, සහකාර පුස්තකාලාධිපති, පුස්තකාල සහකාර හා කළමනාකරණ සහකාර යන තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් අංශ 05 කින් යුත් පුස්තකාලයේ දෛනික කටයුතු පවත්වාගැනීම ගැටළුකාරී වී ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) ආයතනයේ බඳවාගැනීමේ පරිපාටියට අනුව පුස්තකාල සහායක III තනතුර සඳහා නිලධාරීන් බඳවාගැනීමේදී පුස්තකාල විඥාපන විද්‍යාව පිළිබඳව වසර 03 ක ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුය. එසේ වුවත් සමාන වෙනත් පුස්තකාලවල (උදා: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව යටතේ පාලනය වන විශ්වවිද්‍යාලවලට අයත් පුස්තකාල සහ කොළඹ මහ නගර සභා පුස්තකාලය) එම තනතුර සඳහා පුස්තකාල විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රථම පරීක්ෂණය සමත්වීම ප්‍රමාණවත් සුදුසුකමක් ලෙස සලකන බව නිරීක්ෂණය වූ අතර 2013 වර්ෂයේ සිට පුස්තකාල සහකාර තනතුරු පුරප්පාඩුව පැවතීම සඳහා බඳවාගැනීමේ පටිපාටියෙහි ඇති මෙම දුර්වලතාවය හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

## 4.7 වාහන උපයෝජනය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව වාහන අළුත්වැඩියා දේශීය නියෝජිතයකු හරහා සිදුකිරීමේදී එහි ආර්ථික වාසිය වාහනයේ වයස සහ තත්ත්වය සැලකිල්ලට ගෙන මිල ගණන් පිළිබඳ ප්‍රසම්පාදන අස්ථිත්වය සෑහීමකට පත්විය යුතුය.එහෙත් ප්‍රසම්පාදන කමිටුව විසින් ආර්ථික වාසිය පිළිබඳව සැලකීමකින් තොරව 2017 වර්ෂයේදී අවස්ථා 37 කදී රු.3,838,823 ක වියදමක් දරා දේශීය නියෝජිතයන් මගින් පමණක් වාහන අළුත්වැඩියා සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.8 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

2016 හා 2017 වර්ෂ තුල අදාල අංශවල ඉල්ලීම මත මිලදීගන්නා ලද රු.1,023,115 ක් වටිනා භාණ්ඩ විගණිත දිනය වූ 2018 මැයි 30 වන විටත් එම අංශ වෙත බෙදා හැරීමකින් තොරව ආයතනයේ ප්‍රධාන ගබඩාව තුල නිෂ්කාර්යව ඇති බව නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව" සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ඒ පිළිබඳව 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත සම්මත කර චක්‍රලේඛ මගින් සියළු රජයේ ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව, තම විෂයය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුවද ජාතික අධ්‍යාපන ආයතනය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.4,492,613 ක ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ හා රු.2,113,200 ක්වූ දේශන ශාලා පුටු හා මේස ප්‍රසම්පාදනයන්ට අදාලව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ඡේදය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබූ රු.789,400 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍ර මිලදීගැනීමේ ප්‍රසම්පාදනයට අදාල ලංසු කැඳවීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.2 ප්‍රකාරව, වෙළඳපල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කිරීමේදී අවම වශයෙන් දින 07 ක කාලයක් ලබාදිය යුතු වුවත් උක්ත ප්‍රසම්පාදනයට අදාළව මිලගණන් කැඳවීම, සැපයුම්කරුවන් විසින් ලංසු ඉදිරිපත්කිරීම ලංසු විවෘතකිරීම සහ ලංසු ප්‍රදානය කිරීම ආදී වූ සියළුම ප්‍රසම්පාදන කාර්යයන් 2017 දෙසැම්බර් 28 දින සිදුකර තිබුණි. තවද, ලියාපදිංචි තැපැල මගින් මිල ගණන් ඉදිරිපත්කරන ලෙස ලිඛිතව දන්වා තිබුණද මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.3 ඡේදයට අනුකූල නොවන ලෙස 2017 දෙසැම්බර් 29 දින ෆැක්ස් මාර්ගයෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුවක් ඇගයීම් කර එය ජයග්‍රාහී ලංසුව ලෙස පිළිගෙන තිබුණි.

6.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.301,800,000 ක් වුවද සත්‍ය ප්‍රාග්ධන වියදම රු.118,948,846 ක් වූයෙන් රු.182,851,154 ක විචලනයක් වූ අතර අයවැය ගත පුනරාවර්තන ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 14 සිට 1,131 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවන ලෙස ගිණුම් පිළියෙල නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) විෂය නිර්දේශ සකස්කිරීමේ ප්‍රමාද වීම සහ විධිමත් පරිදි සකස්කිරීමට කටයුතු නොකිරීම.<br>(ii) විෂයමාලා සංවර්ධනය සඳහා තීරණ ගැනීමට ඉවහල් වන පර්යේෂණ සිදුනොකිරීම.<br>(iii) උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචිවීම් හා නිම කිරීම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි දත්ත පද්ධතියක් නොපැවතීම. |

| | | |
|---|---|---|
| (ඇ) | විභාග පරිපාලනය | අවිධිමත් ලෙස විභාග පැවැත්වීම සහ විභාග කටයුතුවලට අදාළ විධිමත් නීතිමය රාමුවක් නොමැතිවීම. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කිරීම් සිදු කිරීම. |
| (ඉ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම.<br>(ii) ආයතනය පාර්ශවයෙන් ගිවිසුම්වලට අත්සන් නොයෙදීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව**

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

2018 වර්ෂයේ ගිණුම් සැකසීමේදී, සැසඳුම් තීරුවේ ජ'නල් සටහන් යොදා නිවැරදි කර දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) 2018 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී සැසඳුම් තීරුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) 2017 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් අංක 06 සහ 07ට අදාළ වටිනාකම්වල එකතුව ජංගම වත්කම් වශයෙන් සලකා ගණනය කිරීම සිදු කර ඇත.

(iii) 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජ'නල් සටහන් යොදා නිවැරදි කර සැසඳුම් තීරුවේ (2017 තීරුවේ) දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(iv) 2018 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී සැසඳුම් තීරුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(v) 2018 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සැසඳුම් තීරුව (2017 වර්ෂය) තුළ නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කාර්යය සඳහා තක්සේරුකරුවෙකු (එල්. දසනායක මහතා) තෝරා ගෙන ඇත. 2018 නොවැම්බර් මාසයේ දී කාර්යය ආරම්භ කර ඇත. 2019 ජූලි මාසයේ දී කාර්යය අවසන් කිරීමට නියමිතය.

(ඈ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

ඉදිරියේ දී තොග අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම ගිණුම්කරණ ප්‍රමිත අනුව සිදු කරනු ලැබේ.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) කෙටිකාලීන තැන්පතු (ස්ථාවර තැන්පතු) ගිණුමට තැන්පතු වියදම් ගිණුමේ ජ'නල් සටහනක් පරිගණකගත වීම නිසා ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය රු. 50,000,000/- ක් අඩුවෙන් පෙන්නුම් කරයි. එය ජ'නල් සටහන් මඟින් නිවැරදි කරනු ලැබේ.

(ආ) පරිත්‍යාගයක් ලෙස ලැබුණු රු. 169,000/- ක් වටිනා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් (Projector) ගිණුම් ගතවී නොමැත. එය 2018 වර්ෂයේ ගිණුම්වල ගලපා නිවැරදි කර ඇත.

(ඇ)

| | (රු.) | (රු.) |
|---|---|---|
| Provision for Gratuity | 5,547,436.00 | |
| Accumulated Fund | | 5,547,436.00 |

ඉහත ජ'නලය මගින් 2018 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරනු ලැබේ.

(ඈ) ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොලිය වශයෙන් වැරදි සටහනක් යෙදීමෙන් වැඩිපුර හඳුනාගෙන තිබූ මුදල ජ'නල් සටහන් මගින් නිවැරදි කරනු ලැබේ.

(ඉ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ)

| | (රු.) | (රු.) |
|---|---|---|
| Fixed Assets – Land & Building | 603,235.00 | |
| Work -In- Progress | | 603,235.00 |

ඉහත ජ'නලය මගින් 2018 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

## 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

අවසාන ගිණුම්වලට ගැනීමේ දී මෙම වරද සිදුව ඇත. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

උපලේඛන සකස් කිරීම පරිගණක පද්ධතිය මගින් සිදු නොවන අතර ඒ සඳහා Excel Sheet තුළට තොරතුරු ඇතුළත් කිරීමේදී මෙම වෙනස ඇති වී තිබේ. එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

## 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙතින් අවශ්‍ය සාක්ෂි ලේඛණ ලබාගෙන ඒ අනුව ඉදිරියට ගෙවන ලද පාඨමාලා ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම වත්කම් වෙන වෙන ම හඳුනාගත හැකි බැවින් එම එක් එක් වත්කමෙහි ආරම්භක ශුද්ධ අගය සහ එක් එක් වත්කමට අදාළ ක්ෂය ප්‍රතිශතය සලකා වර්ෂය සඳහා ක්ෂය ගණනය කිරීම සිදු කර ඇත. ශුද්ධ අගය බිංදුව වන අවස්ථාවේ ක්ෂය ගණනය කිරීම අවසන් කරනු ලැබේ. ඒ අනුව මෙම ගණනය කිරීම නිවැරදි ය. 2018 වර්ෂයේ දී ආරම්භ කර ඇති වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව මෙම ගැටලුව නිරාකරණය වේ.

(ඇ) මෙය දැනට නිවැරදි කර ඇත.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව තිබූ රු.3,237,799/66 ක මුදල 2018.12.31 දින අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් නිකුත් කර ඇත (ඇමුණුම 01).

(ආ) වසර 5ක් ඉක්මවා ඇති සියලුම තැන්පතු මුදල් නැවත ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන ලෙස අදාළ කොන්ත්‍රාත්කරුවන් වෙත ලිඛිත ව දැනුම් දී ඇත. එසේ තහවුරු කිරීම් නොලැබෙන තැන්පතු මුදල් 2018 වර්ෂයේ ආයතනයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මෙම මුදල් අය කර ගැනීම සඳහා 2017 වසර තුළ දී ලිඛිත ව දැනුම් දුන්න ද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත (ඇමුණුම 02). හිඟ මුදල් ගෙවීම පිළිබඳව නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් වෙතින් ප්‍රතිචාරයක් නොදක්වන බැවින් මේ පිළිබඳව නීති මාර්ගයෙන් කටයුතු කිරීමට සිදු වන බව අදාළ ආයතනය වෙත දැනුම් දීමට කටයුතු කර ඇත (ඇමුණුම 03).

(ඈ) වර්ෂ 05 ඉක්මවා තිබූ රු.60,431/- ක පොදු අත්තිකාරම හැර ඉතිරි අත්තිකාරම් මුදල් මේ වන විට පියවා ඇත. නොපියවූ රු. 60,431/- ක අත්තිකාරම වෙනුවෙන් නඩුවක් විභාග වෙමින් පවතී.

අත්තිකාරමක් ලබා ගැනීමේ දී ඊට පෙර ලබා ගත් අත්තිකාරම පියවා ඇති බවට අදාළ නිළධාරියා වවුචරයේ අත්සන් තබා සහතික කිරීමෙන් අනතුරුව අත්තිකාරමක් ලබා දේ. එබැවින් මින් ඉදිරියට මෙවැනි තත්ත්වයන් නැවත ඇති නොවේ.

2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) **2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016 සංශෝධිත) දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛයේ 3.1 වගන්තිය**

2015-2016 වසරේ දී සකස් කළ පොත් සමීක්ෂණ වාර්තාව සම්පූර්ණ කර ඇත. එම වාර්තාව අනුව පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය ලබා ගෙන ඇත.

පුස්තකාල කාර්යය මණ්ඩලය 06 කට සීමා වී ඇති අතර දෛනික පුස්තකාල කාර්යයන් අතරතුර අපහරණය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් එම කාර්යය කිරීමට අපහසු වී ඇත. මේ සඳහා අපහරණ කමිටුවක් පත්කර ඇත. අපහරණ කමිටු වාර්තාව සකස් කර ඇත. මේ අනුව ඉදිරි පියවර ගැනීමට නියමිතය.

(ආ) **2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

තත්කාර්ය අතුරු අග්‍රිම මුදල රු 100,000/-ඉක්මවන අවස්ථා වලදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ **03/2015** ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

(ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) **මුදල් රෙගුලාසි 716(2)**

විගණන වාර්තාවේ 2017 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා ඇණවුම් කළ රු.3,888,687 ක් වටිනා භාණ්ඩ විගණිත දිනය වන විටත් ආයතනයට ලැබී නොතිබූ බව සඳහන්ව ඇත. මෙම කරුණට අදාළව ආයතනය වෙත යොමු කර තිබූ විගණන විමසුමේ ඇමුණුම් අංක 03 හි සඳහන් කර තිබූ පරිදි භාණ්ඩ වල වටිනාකම රු.2,403,009/75 ක් බව සඳහන් කරනු කැමැත්තෙමි.

එහි සඳහන් කර තිබූ ඇණවුම් අංක 6994, 6996, 6941, 6959, 6981 වලට අදාළ භාණ්ඩ දැනටමත් ගබඩාවට ලැබී ඇත.

2017 වර්ෂයේ නිකුත් කරන ලද ඇණවුම් අංක 6850, 6851, 6852, 6854, 6890, 6891, 6892, 6893 6966, 6983 යන ඇණවුම්වලට අදාළ භාණ්ඩ ගබඩාවට ලැබී නැත. මෙම ගැනුම් ඇණවුම් අවලංගු කර ඇත.

ඇණවුම් අංක 6985ට අදාළ භාණ්ඩ අත්තිකාරමක් ලබා ගෙන මිල දී ගෙන ඇත. ඇණවුම් අංක 6957 හි ඇණවුම් කර ඇත්තේ Toner 1000 ක් නොව A3 Photocopy paper පැකට් 1000 කි. භාණ්ඩ නොසැපයීම නිසා මෙම ගැනුම් ඇණවුම අවලංගු කර ඇත.

විගණන විමසුමේ ඇණවුම් අංක 6948 ට අදාළ වටිනාකම රු. 4,318/- කි. අයිතම සංඛ්‍යාව 300 කි. සැපයුම්කරු ඇණවුමින් සපයන ලද ප්‍රමාණය සඳහා පමණක් භාණ්ඩ ලැබීම් පත්‍රිකාව (GRN) නිකුත් කර ඇත.

(ii) **මුදල් රෙගුලාසි 705(5)**

මුදල් රෙගුලාසි 705(5) ට අනුව කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නම් ඇතුළත් කර සැපයුම්කරුවන්ගේ අසාධු ලේඛනයක් සකස් කර ඇත.

(ඈ) **2015 මැයි 25 දිනැති අංක පීඑඩී 1/2015 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය**

සම්භාව්‍ය භාෂා, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද්විභාෂා සම්බන්ධව කටයුතු ඉටු කිරීමට සිටිනුයේ මෙම අධ්‍යක්ෂවරිය පමණි. එබැවින් සේවා අවශ්‍යතාව මත බාහිර සම්පත් පුද්ගලයන් යොදා ගනිමින් පළාත්බදව ද්විභාෂා පුහුණු කටයුතු ඉටු කෙරේ. මෙය විශේෂිත අවස්ථාවක් බැවින් අදාළ පුහුණු වැඩමුලු පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සිටින එක ම නිලධාරිනියට සංචිත වාහනය යොදා ගැනීමට සිදු ව ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි.

### 3.3 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) 2017 වර්ෂයේ අවසන් ගිණුම් තුළ මෙම නඩු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

- No. 4801/05/Finance – සෙනෙවිරත්න මිය රු. 2,947,755/-
  (දිසා අධිකරණය - ගල්කිස්ස)

  මෙම නඩුවේ 1, 2 හා 3 යන විත්තිකරුවන් තිදෙනා විදේශගත ව සිටී. ඔවුන් වෙත සිතාසි ලබා දීමට නොහැකි බව පිස්කල්වරයා අධිකරණයට වාර්තා කර ඇත. එම නිසා මෙම නඩුව බහා තබා ඇත.

- No. 2320/16/M – කේ.ඩබ්.පී.ඒ. වීරවර්ධන මිය රු. 198,497/-
(දිසා අධිකරණය - නුගේගොඩ)

මෙම නඩුව 2018.06.20 දින කැඳවූ අවස්ථාවේ දී විත්තිකාර පාර්ශ්වයෙන් සමථ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම නඩුව නැවත 2018.08.02 දින කැඳවූ අතර එකී සමථ යෝජනාවේ ඇතැම් ඉල්ලීම්වලට එකඟ විය නොහැකි බව කියා සිටි බැවින්, මේ පිළිබඳ ව තවදුරටත් ආයතනය සමග සාකච්ඡා කර තීරණය අධිකරණයට දැනුම් දෙන බව කියා සිටින ලදී. ඒ අනුව මෙම නඩුව 2018.11.07 දින කැඳවූ නමුත් එදින සමථයක් නොවූ බැවින්, 2019.04.29 දින නැවත විභාගයට දින නියම කර ඇත.

No. 2706/17/M – බී.කේ. විජේගුණවර්ධන මෙනවිය රු. 1,335,286/-
(දිසා අධිකරණය - නුගේගොඩ)

මෙම නඩුව 2018.07.06 දින අධිකරණය කැඳවූ අවස්ථාවේ දී 1, 2, 3 යන විත්තිකරුවන් නොමැති බැවින් සිතාසි භාර දීමට නොහැකි වූ බව අධිකරණයේ පිස්කල්වරයා වාර්තා කර ඇත. මෙම නඩුව 2018.12.04 දින කැඳවූ අවස්ථාවේ දී 2, හා 3 යන විත්තිකරුවන්ට සිතාසි නිකුත් කරන ලෙසට දැනුම් දෙන ලදී. ඉදිරි කැඳවීම් දිනය 2019.05.21 දින වේ.

(ආ) WP/ACCA/MT/12/12/RA කේ. පී. රානි මිය
(සිවිල් අභියාචනා මහාධිකරණය)

ගුරු පුහුණු සහතිකයක් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ මෙම නඩුවේ තීන්දුව 2018.07.17 දින ප්‍රකාශයට පත් කර ඇත. එම තීන්දුවට අනුව පෙත්සම නිශ්ප්‍රභා කර ඇත.

2017 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ලබා දුන් තොරතුරුවල තිබූ අඩුපාඩුවක් නිසා මෙය අවසන් ගිණුමවල හෙළිදරව් කර නැත. එම තොරතුරු ඇමුණුම 04 මගින් ඉදිරිපත් කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(i) 2017 වර්ෂයේ දී සිදු කරන ලද උසස් පෙළ විෂයමාලාවේ සංශෝධනවලට අදාළ ව පද්ධතියේ සිටින උසස් පෙළ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබන්නේ සියලු ම පළාත්වල විෂය අධ්‍යක්ෂවරුන් එක් එක් විෂය සඳහා තම පළාත්වල සිටින ගුරුවරුන් සංඛ්‍යාව පිළිබඳ දත්ත ජාතික අධ්‍යාපන ආයතනය වෙත ලබා දුන් පසුව ය. ඒ අනුව වසර ආරම්භයේ දී එක් එක් විෂය සඳහා පුහුණු කරන ගුරු සංඛ්‍යාව වාර්ෂික සැලැස්මට ඇතුළත් කරනු ලබයි. පළාත්බදව පැවැත්වෙන මෙම වැඩමුලු සඳහා ගුරුවරුන් කැඳවීම සිදු කරනු ලබන්නේ පළාත්වල විෂය අධ්‍යක්ෂවරුන් විසිනි. සමහර විෂයයන් සඳහා සැලැස්මේ සඳහන් ගුරු සංඛ්‍යාවලට වඩා අඩු ගුරු සහභාගිත්වයක් පවතී. එය ජාතික අධ්‍යාපන ආයතනයට පාලනය කළ නොහැකි තත්ත්වයකි. එහෙත් සමහර දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී සැලැස්මේ සඳහන් සංඛ්‍යාව අභිභවා ගුරු සහභාගිත්වයක් දක්නට ඇත.

(ii) 2017 වසරේ දී සැලසුම් කර තිබූ විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ කෙටුම්පත් කර තිබුණ ද, ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල හා ආයතන සභාවේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වී ඇත.

ගුරු මාර්ගෝපදේශවල වර්තමාන තත්ත්වය ඇමුණුම 05 මගින් ඉදිරිපත් කර ඇත.

(iii) ප්‍රමාද වූ විෂය නිර්දේශවලට අදාළ සම්පත් පොත් 25ක් ද 2017 වසරේ දී සකස් කර අවසන් කිරීමට නොහැකි වී ඇති අතර සම්පත් පොත් වලට අදාළ වර්තමාන තත්ත්වය ඇමුණුම 06 මගින් ඉදිරිපත් කර ඇත.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

ආයතනයේ නිලධාරීන් ආයතන චක්‍රලේඛ අංක 257 අනුව දීමනා ලබා ගැනීමේ දි වාර්ෂික වැටුපෙන් 50% ක් ඉක්මවා දිමනා ලබා ගැනිම සිදු නොකළ යුතු බව දක්වා ඇත.ඒ අනුව සෑම වර්ෂයකටම දෙසැම්බර් මස 31 දින වන විට එම අතිරික්ත ඉපයීම් ප්‍රමාණය ගණනය කර අය කිරීම් සිදු කරනු ලැබේ.

2014, 2015, 2016 හා 2017 වර්ෂවලට අදාළ 50% ඉක්මවා ඉපයිම් පිළිබඳ වාර්තා වල

(i) වැටුපෙන් 50% ගණනය කිරිම අදාළ නිලධාරින්ගේ වැටුප් සැකසීමට පෙර සිදු කිරිම.

(ii) චක්‍රලේඛය පරිදි විභාග කටයුතු සඳහා ගෙවීම්, ඉහත අතිරික්ත ඉපයීම්වලට අදාළ ගෙවීම්වලින් නිදහස් කර ඇති නමුත් ගණනයේ දී ඒවා ද ඇතුළත් කර තිබීම නිරීක්ෂණය විය.

නිවැරදි කිරීම් වලින් පසු අතිරික්ත ඉපැයීම් අය කර ගැනීම සඳහා කටයුතු කෙරේ.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**(අ) (i) විද්‍යා විෂයය - 6, 11 ශ්‍රේණි**

පවතින විෂයමාලා ප්‍රතිපත්තියට අනුව විෂයමාලා චක්‍රයක් වසර 08 කට සීමා වන අතර දැනට ක්‍රියාත්මක වන විෂයමාලා චක්‍රයට පෙර පැවති විෂයමාලා චක්‍රය 2005-2012 කාලය තුළ ක්‍රියාත්මක විය. එම විෂයමාලා චක්‍රය තුළ 01 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වාම විෂය නිර්දේශ නවීකරණය කරන ලද අතර එය පාසල්වලට හඳුන්වා දෙනු ලැබ ක්‍රියාත්මක වූයේ 2007 වසරේ සිට අදියර 05 කිනි.

2015 සහ 2016 වසරවල දී හඳුන්වා දුන් නව විෂය නිර්දේශයට පෙර ක්‍රියාත්මක වු විෂය නිර්දේශ (2005-2012) පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීමත් සමඟම පර්යේෂණ දෙපාර්තමේන්තුව මඟින් 2007 සිට අදියර හතරකින් පර්යේෂණයක් දියත් කරන ලදි. එයට අමතරව SLAAD ආයතනය වෙත පවරන ලද පර්යේෂණයක් මඟින් සකස් කරන ලද විෂය නිර්දේශ කෙතෙක් දුරට අධ්‍යාපන අරමුණු හා ගැළපෙන්නේ ද, විෂයන් අතර තිරස් හා සිරස් සමෝධානයක් පවතී ද, විෂය සංධාරයේ ගැලපීම කෙතෙක් ද, යන්න පර්යේෂණාත්මක ව සොයා බලන ලදී. මෙම වාර්තා පර්යේෂණ දෙපාර්තමේන්තුව සතුව ඇත. මෙම පර්යේෂණවල නිර්දේශ අදාළ දෙපාර්තමේන්තුවලට සහ විෂයමාලා සම්පාදකවරුන්ට සන්නිවේදනය කරන ලද අතර පසුව එළඹුණු විෂයමාලා සංස්කරණයේ දී එහි නිර්දේශ භාවිතයට කටයුතු යොදන ලදී.

සියලුම දෙපාර්තමේන්තුවල නිලධාරින්ට තම විෂය ක්‍රියාත්මක වීම පිළිබඳ තවදුරටත් ගැඹුරු අධ්‍යයනයක් ක්ෂේත්‍ර නිරීක්ෂණ තුළින් සිදු කිරීමට 2007-2012 දක්වා වාර්ෂික සැලසුම්වල ප්‍රතිපාදන සලසා තිබූ අතර විද්‍යා දෙපාර්තමේන්තුව ද ඒ අනුව අදාළ පියවර ගෙන ඇත.

2015 හඳුන්වා දුන් විෂය නිර්දේශ සංස්කරණ කටයුතු ඇරඹීමට පෙර සෑම විෂය කමිටුවක් විසින්ම ලෝකයේ වෙනත් රටවල විෂය නිර්දේශ පිළිබඳ අධ්‍යයනය කර ගෝලීය ප්‍රවණතා හඳුනා ගැණින. එක් එක් විෂය පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කර අදාළ තොරතුරු රැස්කර ගෙන දේශීය වශයෙන් පවතින ඉල්ලුම සමග ආර්ථික, සමාජ හා දේශපාලන වෙනස්කම් ගලපමින් විශ්ලේෂණ සිදු කර විෂයමාලා ව්‍යාප්තිය (Curriculum Grids), ප්‍රාථමික (1-5 ශ්‍රේණි), ද්විතියක (6-11 ශ්‍රේණි), ජ්‍යෙෂ්ඨ ද්විතීයක (12-13

ශ්‍රේණි) සඳහා වෙන් වෙන් ව සකස් කර ඒ අනුව සෑම ශ්‍රේණියක් සඳහා ම සෑම විෂයකට ම විස්තරාත්මකව විෂය නිර්දේශ සකස් කර ඇත.

දැනට ක්‍රියාත්මක වන විෂයමාලා චක්‍රයේ (2015 – 2022) විෂයමාලා සැලසුම් කරන කටයුතු ආරම්භ වූයේ 2012 වර්ෂයේ දී වන අතර එහි දී විද්‍යා විෂයමාලාව සැකසීම සඳහා ද ඉහත සඳහන් ක්‍රමවේද මගින් තොරතුරු රැස් කර ගෙන තිබුණු අතර එයට අමතර ව දිවයිනේ පළාත් නවයෙන් නම් කරන ලද ගුරුවරුන් හමුවී, පැවැති විෂයමාලාව පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම පිළිබඳ ව අදහස් විමසීම 2015 ජනවාරි සිට මාර්තු දක්වා සිදු කරන ලදී. අදාළ වාර්තා පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඇත.

### (ii) උසස් පෙළ 12,13 ශ්‍රේණි සඳහා රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා ජීව විද්‍යාව විෂය නිර්දේශ

පාසල් තුළ මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද නොවීමට සුළු වෙනස්වීම් සහිත වූ විෂය නිර්දේශයට අනුව ගුරු පුහුණුව සිදු කළ අතර විෂයමාලා ද්‍රව්‍ය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ දී ද ඒ ලෙසට ම අනුමත විය. 2017.01.01 වන විට විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශවල මෘදු පිටපත් (මාධ්‍ය තුනෙන් ම) අන්තර්ජාලයට මුදා හැර තිබුණි.

පාසල්වල විෂය ඉගැන්වීම ආරම්භ කිරීමට ගුරුවරුන් සූදානම් කිරීමේ වගකීම ජාතික අධ්‍යාපන ආයතනය සතු වූ බැවින් විෂය නිර්දේශය සමග ගුරු මාර්ගෝපදේශයේ පළමු වාරයේ කොටස් පිටපත් කර ගුරුවරුන්ට ලබා දෙමින් ජීව විද්‍යාව හා භෞතික විද්‍යාව උගන්වන සියලුම ගුරුවරුන් ජාතික අධ්‍යාපන ආයතනය මගින් සෘජුව ම පුහුණු කරන ලදී. බොහොමයක් පාසල්වල අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ වූයේ 2017 ජූලි මාසයේ දී ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් යෝජනා කර තිබුණේ අදාළ ඉගෙනුම්ඵල විස්තරාත්මකව ලියැවී නොතිබීම නිසා ගුරුවරුන්ට ඉගැන්වීමේ සීමා තීරණය කිරීමේ දී ගැටලු පැන නගින බැවින් ඉගෙනුම්ඵල විස්තරාත්මක ව නැවත ලිවීමක් පමණි. අන්තර්ගතයේ වෙනස් කිරීමක් සිදු කිරීමට යෝජනා කර නොතිබුණි. සියලුම බාහිර විද්වත් මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතන නිලධාරින් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා ශාඛාවේ නිලධාරින් දැනට පවතින විෂය අන්තර්ගතය කෙරෙහි එකඟතාව පළ කර ඇත.

ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවන ලෙස කටයුතු කරනු ලැබේ.

### (iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂයය

- විවිධ රටවල විෂය නිර්දේශ අධ්‍යයනය කරමින් සැකසූ 6 වන ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා තොරතුරු තාක්ෂණ, විෂය නිර්දේශ 2017 ජනවාරි මස ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශ ලබා ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදී. එහි දී IOT හා Scratch Programming විෂය ඒකක පාසල්වල ඉගැන්වීම අනවශ්‍ය බවත් ඒවා විශ්වවිද්‍යාලවලදී ඉගැන්විය හැකි බවත් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් දන්වන ලද අතර විෂය නිර්දේශය පිළිබඳ වාර්තාවක් සැපයීමට ආචාර්ය ගාමිණී විජේවර්ධන මහතා ඇතුළු තුන්දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී. එම කමිටුව විසින් 2017 මැයි මාසයේදී වාර්තාවක් ලබා දී ඇත. එම වාර්තාවේ IOT හෝ Scratch Programming පාසල්වල ඉගැන්වීමට නුසුදුසු යයි දක්වා නැත. (ඇමුණුම-07)
  එම වාර්තාව අනුව විෂය නිර්දේශ සංශෝධනය කර නැවත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කළ විට UNESCO ප්‍රමිතීන්ට අනුව විෂය නිර්දේශ සකස් කර නොමැති බව දන්වන ලද අතර නැවතත් විෂය නිර්දේශ සංශෝධනය කර ඉදිරිපත් කළ විට BBC ප්‍රමිතීන් ට අනුව සකස් විය යුතු යැයි දන්වන ලදී. අනතුරුව ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල සාමාජික ආචාර්ය ප්‍රසාද් විමලරත්න මහතා ද සමග UNESCO හා BBC වාර්තා දෙකම පරීක්ෂා කරමින් විෂය නිර්දේශ සංස්කරණය කර නැවත ඉදිරිපත් කළ විට 2017 නොවැම්බර් මස එම විෂය නිර්දේශ හතර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් ආයතන සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී. IOT සහ Scratch Programming ඒකක මෙම අනුමත වූ විෂය නිර්දේශවල අන්තර්ගත වේ.

- 2016 වසරේ දී අ.පො.ස (උසස් පෙළ) තොරතුරු තාක්ෂණ විෂය නිර්දේශ සැකසීමේ කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී. එම විෂය නිර්දේශවල IOT ඒකකය අන්තර්ගත වූ අතර 2017 ජනවාරි මස ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය 6 -9 ශ්‍රේණි විෂය නිර්දේශවලින් IOT ඉවත් කිරීමට කළ යෝජනාවට අනුව උසස් පෙළ විෂය නිර්දේශවලින් ද IOT ඉවත් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශය ලබා ගන්නා ලදී. එහෙත් එම විෂය නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කළ විට ආයතන සභාවේ උපදෙස් පරිදි IOT ඒකකය නැවත ඇතුළත් කර විෂය නිර්දේශයට අනුමැතිය ලබා ගන්නා ලදී. එම විෂය නිර්දේශවලට අනුව 2017 අගෝස්තු මස ගුරු පුහුණු කිරීම් සිදු කරන ලදී.

- ත්‍රි පුද්ගල විශේෂ කමිටු නිර්දේශ සඳහා ඉදිරිපත් කර තිබූ 13 වන වසර විෂය නිර්දේශය එම වාර්තාවලට අනුව සකස් කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ නිර්දේශය 2018.06.05 දින ලබා ගෙන ආයතන සභා අනුමැතිය 2018.08.02 දින ලබා ගෙන ඇත. මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට 2018.06.19 දින භාර දී ඇත. මෙම ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ මාධ්‍ය තුනෙන්ම ආයතනයේ වෙබ් අඩවියට 2018 ජූනි මාසයේ දී ම මුදා හැර තිබූ බැවින් අගෝස්තු මස 13 වන වසර පන්ති ඇරඹීමට පෙර ගුරු මාර්ගෝපදේශ හා විෂය නිර්දේශ ගුරුවරුන්ට හා සිසුන්ට ලබා ගත හැකි විය.

  2017 වසරේ 12 වසර සඳහා ගුරු පුහුණුව සිදු කරන අවස්ථාවේදී 13 වසර විෂය නිර්දේශයේ මුල් නිපුණතා දෙක (8,9) සඳහා ද ගුරු පුහුණුව ලබා දී ඇති බැවින් එම ගුරුවරුන්ට 13 වන වසර විෂය නිර්දේශය ජූලි මාසයේ දී හෝ සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කර 13 වසර දෙවන වාරයේ මැද වන තෙක් (2019 පෙබරවාරි) ඉගැන්වීමට බාධාවක් නොවේ.

  13 වසර සඳහා පුහුණුව 2018 ජූලි මාසයේ සිට ආරම්භ කර ඇති අතර මේ වන විට ගුරුවරුන් 1300 පුහුණු කර ඇත.

(iv) **ආගම්වලට අදාළ විෂයය නිර්දේශ පිළියෙල කිරිම**

මෙහි සඳහන් කළ ආකාරයට සියලුම ආගම්වල වැඩ කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව තුළ සිටිනුයේ එක් විෂයක් සඳහා එක් නිලධාරියා බැගින් වුව ද විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම, භාෂා පරිවර්තන කාර්යය ගුරු පුහුණු කටයුතු සිදු කිරීම ආදී සියලු කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත බාහිර සම්පත් පුද්ගල ලේඛනයට අනුව බාහිර සම්පත් පුද්ගලයින් සහභාගි කෙරේ.

ඒ අනුව එක් එක් ආගම් සඳහා විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ කථිකාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ ගුරුවරු ඇතුළු විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කමිටු මඟින් විෂයමාලා සම්පාදනය සිදු කරන අතර, විෂයමාලාවල නිවැරදි භාවය තහවුරු කර ගැනීමට දස පුද්ගල කමිටු වෙත යොමු කර අදහස් ලබා ගැනීම ද සිදු කෙරේ.

විෂය නිර්දේශයේ නිවැරදිතාව ස්ථිර නිලධාරින් ප්‍රමාණය අනුව තීරණය නොවන අතර විෂය කමිටුවේ වගකීම හා වගවීම මෙන් ම විෂය නිර්දේශ සකස් කිරීමේ දී ඒ සඳහා සහභාගි වන සම්පත් පුද්ගලයන්ගේ ගුණාත්මක භාවය මත රඳා පවතී.

සකසන ලද විෂය නිර්දේශ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය හා ආයතන සභාව විසින් අනුමත කරනු ලබන අතර නිවැරදිභාවෙන් යුත් විෂය නිර්දේශ පද්ධතියට ලබා දීමේ වගකීම එම මණ්ඩල විසින් ද දරනු ලබයි.

(v) **සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය සඳහා වූ නව විෂයය නිර්දේශය**

සකස් කර තිබූ විෂය නිර්දේශය සඳහා ගුරු පුහුණු කටයුතු ආරම්භ කිරීමෙන් පසුව ද ඉදිරිපත් වූ විරෝධතාවක් හේතුවෙන් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ සභාපති විසින් එය කමිටුවක් වෙත ලබා දී නැවත විමර්ශනය කොට ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට යොමු කරන ලද අතර ඒ අනුව නව විෂය නිර්දේශයේ සමහර කොටස් නැවත සංශෝධනය කිරීමට ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය තීරණය කරන ලදී. එබැවින් පාසල්වල නව විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම කල් ගත වන බැවින් 2015 ඇරඹි විෂයමාලා චක්‍රය යටතේ මෙම විෂයය සඳහා 2017/2018 වසරවල ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ නව විෂය නිර්දේශය වෙනුවට, 2008 වර්ෂයේ 12, 13 ශ්‍රේණිවලට හඳුන්වා දී තිබූ විෂය නිර්දේශය ම 2019 වසර අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පළමු වරට ඉදිරිපත් වන සිසුන් සඳහා ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛයක් නියමිත පාසල් වෙත නිකුත් කිරීම සඳහා අවශ්‍ය විධි විධාන සලස්වන ලෙස ඉල්ලීමක්

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල උපදෙස් පරිදි 2017.12.04 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යාපන ලේකම් වෙත ලිපියකින් දැනුම්දීමෙන් පසු අදාළ චක්‍රලේඛය නිකුත් වී ඇත.

අ.පො.ස (උ.පෙළ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය (සිංහල මාධ්‍යය) 12 ශ්‍රේණිය නව විෂය නිර්දේශයට 2018.05.08 දින ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයේ නිර්දේශය හා 2018.05.17 දින ආයතන සභාවේ අනුමැතියෙන් පසු අන්තර්ජාලයට එක් කරන ලදී. ඉන් පසුව 12 ශ්‍රේණිය දෙමළ මාධ්‍යය විෂය නිර්දේශයට 2018.06.05 දින ශාස්ත්‍රිය කටයුතු මණ්ඩල නිර්දේශය හා 2018.06.21 දින ආයතන සභා අනුමැතිය ලබා අන්තර්ජාලයට එක්කර ඇත. අ.පො.ස.(උ.පෙළ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 12 ශ්‍රේණියට අදාළ සිංහල හා දෙමළ මාධ්‍යය ගුරු පුහුණුව සියළුම පළාත් සඳහා පවත්වා අවසන් කර ඇත. දැනට පුහුණු කර ඇති 513 ක් වන ගුරු පිරිසගේ ප්‍රතිචාර පත්‍රිකා අනුව 95% ක පමණ ගුරුවරුන්ගේ අදහස වන්නේ 2018 නව විෂය නිර්දේශය සාර්ථක ව සිදු කළ හැකි බවයි.

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය නව විෂය නිර්දේශය 2018 වර්ෂයේ සිට 12 ශ්‍රේණියේ ක්‍රියාත්මක වීමට නියමිත බැවින් ඒ සඳහා පාසල්වලට චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස 2018.07.13 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යාපන ලේකම් වෙත ලිපියක් යවා ඇත. ඒ අනුව අධ්‍යාපන ලේකම් තුමා විසින් 2018.10.23 දිනැති අංක 39/2018 චක්‍රලේඛය නිකුත් කර ඇත.

**(ආ) ගුරු පුහුණු ආරම්භ කිරිම ප්‍රමාද වීම සහ ගුරු පුහුණු සංවිධානය කිරීමේ අවිධිමත් බව**

ගුරු පුහුණුව සඳහා වූ මූල්‍යමය ප්‍රතිපාදන (රුපියල් මිලියන 5ක මුදලක්) අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබීමට ප්‍රමාද වූ අතර, අගෝස්තු මස අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා සිසුන් සූදානම් කිරීමට ඇති නිසා උසස් පෙළ ගුරුවරු පුහුණු වැඩමුළු සඳහා මැයි, ජුනි, ජූලි මාසවල ගෙන්වා ගැනීමට ද නොහැකි වූ බැවින් පුහුණු වැඩමුලුව අගෝස්තු මාසයේ දී පවත්වා ඇත. ඒ වන විට අදාළ ප්‍රතිපාදන ජාතික අධ්‍යාපන ආයතනයට ලැබී තිබුණි.

පුහුණු වැඩමුලු සංවිධානය කිරීම සඳහා පළාත්වල තොරතුරු තාක්ෂණ විෂය පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරු ගෙන්වා පුහුණුවීම් පිළිබඳ ව දැනුවත් කරන ලදී. එම පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් කළාප කාර්යාල මගින් ගුරුවරුන් දැනුවත් කර ඉන්පසු අදාළ ගුරුවරුන් විසින් වෙබ් අඩවියට ඇතුළත් කරන ලද තොරතුරු අනුව ඉක්මණින් වැඩමුළු සැලසුම්කර ගුරුවරුන් කැඳවා පුහුණුවීම් කරන ලදී. එබැවින් එය විධිමත් ව සිදු කරන ලද පුහුණු කිරීමකි. තොරතුරු තාක්ෂණය භාවිත කර සහ අදාළ පළාත් හා කලාප නිලධාරීන්ගේ සහාය ලබා ගෙන, එම පුහුණුව ඉක්මනින් පවත්වා ගුරුවරු 1023 දෙනෙකු පුහුණු කිරීමට හැකි වී ඇත.

උසස් පෙළ විෂයයන් උගන්වන පාසල්වල පරිගණක සහ අන්තර්ජාල පහසුකම් පවතී. එසේ නොමැති නම් එම පාසල්වල තොරතුරු තාක්ෂණ විෂයය ද ඉගැන්විය නොහැක. උසස් පෙළ තොරතුරු තාක්ෂණ විෂයය උගන්වන ගුරුවරුන්ට Online අයදුම් පතක් පුරවා ගැනීමේ හැකියාව ඇත. ස්මාර්ට් ජංගම දුරකතනයෙන් ද අන්තර්ජාල පහසුකම් ලබා ගෙන මෙම කටයුතු කළ හැකි ය. ඒ අනුව මෙම පුහුණුවීම් සඳහා Online අයදුම් පත් ලබා ගැනීම නිසා ගුරුවරුන්ට අවස්ථා නොලැබීමක් සිදු නොවේ. 2017-05-17 දින ජාතික අධ්‍යාපන ආයතනයේ පැවැත් වූ පළාත් තොරතුරු තාක්ෂණ විෂයභාර අධ්‍යක්ෂකවරුන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩමුළුවේ දී මෙම පුහුණුව ලබා දිය යුතු ගුරුවරුන් දැනුවත් කරන මෙන් දැනුම් දී තිබුණි. පළාත් තොරතුරු තාක්ෂණ විෂය භාර අධ්‍යක්ෂවරුන් හරහා ගුරුවරුන්ගෙන් අදාළ තොරතුරු online මගින් ලබා ගෙන ඒ අනුව වැඩමුළුව සඳහා කැඳවීම් කර ඇත.

(ඇ) **විභාග පැවැත්වීම හා පරිපාලනය**

(i) මෙවැනි විභාග පවත්වන පාඨමාලා ඇත්තේ කීපයක් වන අතර, එම පරීක්ෂකවරුන් මෙම ආයතනයේ අවශ්‍යතාව අනුව කැඳවීම් කළ ද සහභාගීකර ගැනීම අපහසු වී ඇත. එසේම සංඛ්‍යාත්මකව ද ප්‍රමාණවත් පරීක්ෂකවරුන් යොදවා ගැනීම අපහසු වී ඇත. (මෙම ආයතනයේ ඇතැම් විභාග සඳහා 3000, 4000 ක් පමණ සංඛ්‍යාවක් පෙනී සිටී.) අධ්‍යාපනවේදී වැනි පාඨමාලා ඇත්තේ විශ්ව විද්‍යාල 3 ක පමණක් වන අතර එම කථිකාචාර්යවරුන් කැඳවීම ද අපහසු වී ඇත.

මෙම හේතු නිසා සියලු දේශකවරුන් ගේ ලේඛනයක් එම දෙපාර්තමේන්තුවලින් ලබාගෙන රහස්‍ය අංශයේ නිලධාරී විසින් අහඹු ලෙස තෝරාගත් කථිකාචාර්යවරයෙකු හෝ එම විෂයම ප්‍රවීණ වෙනත් විශ්වවිද්‍යාලයක ආචාර්යවරයෙකු ප්‍රශ්න පත්‍රයේ මූලික සැකසීමට කැඳවනු ලබයි. ප්‍රශ්න පත්‍රය ප්‍රමිත කිරීමේ දී විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු හෝ බාහිර විද්වතෙකු යොදා ගනී.

ඇගයීම් ක්‍රියාවලියේ දී පාලක පරීක්ෂකවරුන් පත්කරනුයේ පාඨමාලාවට සම්බන්ධ නොවූ විද්වතුන්ගෙනි.

(ii) 2013 වසරේ දී උපදෙස් සංග්‍රහයක් හා රෙගුලාසි ගැසට් පත්‍රය කෙටුම්පත් කිරීම ආරම්භ කෙරිණි. මුල්වර සකස් කළ කෙටුම්පත 2015.05.28 දින පැවති ආයතන සභා රැස්වීමට ඉදිරිපත් කර ඇත. එහි දී ආයතන සභා සාමාජික මහාචාර්ය ඩබ්.ඩී.ඩබ්. ජයතිලක මහතාගේ පරීක්ෂාවට යොමුකරන ලද අතර ඔහු විසින් අධ්‍යයනය කර ලබා දෙන ලද උපදෙස් අනුව සංශෝධිත කෙටුම්පතක් සකස් කර ඇත. අනතුරුව 2017 නොවැම්බර් මස පත් වූ නව ආයතන සභාවට උපදෙස් සංග්‍රහයේ කෙටුම්පත ඉදිරිපත් කළ පසු ආයතන සභා සාමාජික හා හිටපු විභාග කොමසාරිස් ජනරාල් ඒ.එම්.ආර්.බී. අමරකෝන් මහතාගේ පරීක්ෂාවට නැවත යොමු කිරීමෙන් පසු අවසන් පිටපත 2018.10.18 දින පැවති 431 වන ආයතන සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර එය අනුමත වී ඇත.

(iii) 2017 විභාග දින දර්ශනයට ඇතුළත් නොවූ අමතර විභාග 04ක් පවත්වා ඇති අතර, ඒ අනුව 2017 වර්ෂයේ දී විභාග 20ක් පවත්වා ඇත.

විභාග නොපැවැත්වීමට හේතු උපලේඛණ අංක 01 මගින් ඉදිරිපත් කර ඇත.

**විභාග ප්‍රතිඵල නිකුත් කිරීම් ප්‍රමාදයට බලපෑ කරුණු පහතින් දක්වා ඇත.**

- ජාතික අධ්‍යාපන ආයතනයේ වෘත්තීය පාඨමාලා ඇගයීම් ක්‍රමවේදයට අවසාන ලිඛිත විභාගය මෙන්ම පැවරුම්, ගුරුපුහුණු, නිබන්ධන, ක්‍රියා මූල පර්යේෂණ ද ඇතුළත් ය.
- අවසාන ලිඛිත විභාගය, විභාග දෙපාර්තමේන්තුව මගින් ද අනෙක් ඇගයීම් අදාළ දෙපාර්තමේන්තු මගින් ද සිදු කෙරේ. මෙම කොටස් දෙකෙහි ලකුණු ඒකාබද්ධ කර ප්‍රතිඵල සකස් කරනු ලබයි. මෙම කොටස්වල ලකුණු ලැබීමේ ප්‍රමාදය ප්‍රතිඵල සැකසීම ප්‍රමාදයට හේතු වී ඇත.
- එලෙස සකස් කළ ප්‍රතිඵල විභාග කමිටුව හා ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමෙන් පසු එම නිර්දේශ වාර්තාව ද සමග ආයතන සභාවට අනුමැතිය සඳහා යොමු කෙරේ. ශාස්ත්‍රිය කටයුතු මණ්ඩලයේ නිර්දේශය තහවුරු කෙරෙනුයේ ඊළඟ සභා වාරයේ දී බැවින් ආසන්නව පැවැත්වෙන ආයතන සභා රැස්වීමට ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට නොහැකි වන අතර ඊට පසු මාසයේ රැස්වීමට ඉදිරිපත් කෙරේ. මේ නිසා ද ප්‍රමාදයක් සිදු වේ.
- එමෙන්ම සියලුම පාඨමාලාවල ප්‍රතිඵල ශ්‍රේණිගත (GPV/GPA) ක්‍රමයට නිකුත් කිරීම මෙම වර්ෂයේ දි ආරම්භ විය. විභාග පැවැත්වීමෙන් පසු ප්‍රතිඵල නිකුත් කිරීමේ දී හෝ ප්‍රතිඵල සැකසීමේ දී ඇගයීම් පටිපාටිවල යම් නොගැලපීම් ඇතිවුයෙන් අදාළ දෙපාර්තමේන්තු මගින් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය හා ආයතන සභාව වෙත නැවත ඉදිරිපත් කර ලබා දී ඇති උපදෙස් අනුව සංශෝධනය කර අනුමත කර ගැනීමට සිදු වීම නිසා ද ප්‍රමාදවීම් ඇති විය.

ඒ අනුව හෝ වෙනත් හේතුමත ප්‍රමාදයට හේතු වු කරුණු උපලේඛණ අංක 02 මගින් ඉදිරිපත් කර ඇත.

2015/2016 වර්ෂවල දී පවත්වන ලද විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබූ බවට සඳහන් කරුණට අදාළ පැහැදිලි කිරීම් උපලේඛණ අංක 03 මගින් දක්වා ඇත.

**(ඈ) අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා කළමනාකරණයට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම**

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අධ්‍යාපනපති උපාධි පාඨමාලාවට (MEd) අදාළ ව දත්ත පද්ධතියක තොරතුරු මේ වනවිට පවත්වාගෙන යන අතර එහි පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර ඇත (ඇමුණුම-08).

අනෙකුත් පාඨමාලා සඳහා ද අදාළ ලේඛන සකස් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිළධාරින් වෙත උපදෙස් ලබා දී ඇත.

**(ඉ) පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්**

(i) දෙපාර්තමේන්තුව මගින් නිම කරන ලද පර්යේෂණ වාර්තා ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමක් පූර්ව වාර්ෂික සැලසුම්වල අංගයක් වශයෙන් ඇතුළත් ව නොතිබුණි. එබැවින් 2014-2017 දක්වා නිම කරන ලද පර්යේෂණ වාර්තා ඇගයීම් කමිටුවකට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණි.

(ii) දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද පර්යේෂණ අනාවරණ, ආයතනික වෙබ් පිටුවට ඇතුළත් කිරීම, කියවීම් කුටිය හා පුස්තකාලයට ලබාදීම සහ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණ මගින් සොයා ගත් නව දැනුම සම්ප්‍රේෂණයට අවස්ථා සම්පාදනය කිරීම සිදු කෙරේ.

**(ඊ) ගුරු අත්පොත් ප්‍රමාද වී මුද්‍රණය කිරීම**

උසස් පෙළ (12 ශ්‍රේණිය) ගුරු මාර්ගෝපදේශ සැකසීමේ, අනුමත කර ගැනීමේ ප්‍රමාදයට තුඩුදුන් හේතු පහත දැක්වේ.

ඕනෑම විෂය නිර්දේශයක් සකස් කර අදාළ අනුමැතීන් ලබා එහි ගුරු මාර්ගෝපදේශ සැකසීම සහ අදාළ අනුමැතීන් ලබා ගැනීමට ගතවන කාලය පිළිබඳව ඉතා හොඳින් සැලසුම් කර කාර්යය අදාළ පරිදි ආරම්භ කරන ලද නමුත්, මෙම සැලසුම්කරණය සිදුවන අවස්ථාවේ දී ගෙන නොතිබූ තීරණ හේතුවෙන් පහත දැක්වෙන පරිදි අමතර කාලය ගතවීමක් සිදු විය.

2016.02.16 දින පැවති අංක 351 දරණ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණයට අනුව සියලුම උසස් පෙළ විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ ශාස්ත්‍රීය සභාව විසින් නම් කෙරෙන දස පුද්ගල කමිටුවකට ඉදිරිපත් කර නිර්දේශ ලබා සංශෝධන වෙතොත් ඒවා සිදු කිරීමෙන් පසු නැවත ඉදිරිපත් කිරීමට සිදු විය. මෙය විෂයමාලා ද්‍රව්‍යවල ගුණාත්මක භාවය වැඩි දියුණු වීමට හේතු වු නමුත් එය සැලසුම්කරණ අවස්ථාවේ නොතිබූ කාර්යයක් බැවින් ඒ සඳහා සැලකිය යුතු අමතර කාලයක් වැය වී ඇත.

ගැටලු සහගත තත්වයක් හේතුවෙන් 2016 ජනවාරි මාසයෙන් පසුව ආයතන සභාවේ රැස්වීම් නොපැවති අතර අධ්‍යාපන අමාත්‍යතුමා විසින් නව පාලක මණ්ඩලයක් පත් කිරීමට ගෙන තිබූ තීරණය නිසා නව පාලක මණ්ඩලය පත් කර ප්‍රථම රැස්වීම 2016 අගෝස්තු මස පැවැත්වෙන තුරු මාස 06 ක් ආයතන සභා රැස්වීම් නොපැවති බැවින් විෂයමාලා ද්‍රව්‍ය අනුමත කර ගැනීමට නොහැකි විය.

එම හේතුවෙන් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයෙන් නිර්දේශ කරන ලද විෂයමාලා ද්‍රව්‍ය විශාල වශයෙන් එකතු වීම නිසා අනුමැතීන් ලබා ගැනීම සඳහා වන ප්‍රමාදය වලක්වා ගැනීමට තාවකාලික පියවරක් ලෙස ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයෙන් නිර්දේශිත ගුරු මාර්ගෝපදේශ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ලබා දීමට තීරණ ගන්නා ලදී.

අදාළ ක්‍රියාවලියේ නිමැවුම් අදියර සම්පූර්ණ කර ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සහ ආයතන සභා අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව ද සමහර විෂය නිර්දේශ නැවත මුල් අදියරේ සිටම සකස් කිරීමට සිදු විය. ඒ අනුව ගුරු මාර්ගෝපදේශ සැකසීම ද ප්‍රමාද විය.

ගුරු මාර්ගෝපදේශ මුද්‍රණය කර පාසල්වලට ලබා දීම ප්‍රමාද වීම නිසා පාසල්වල නව විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ඇතිවූ බාධාව ඉවත් කිරීම සඳහා හදිසි පියවර ගත් අතර ගුරු මාර්ගෝපදේශ රිසෝ මුද්‍රණය කර, පුහුණු අත්පොත් සකස් කර, ඒවා බෙදා දෙමින් උසස් පෙළ සෑම විෂයයක් සඳහා ම සියලුම උසස් පෙළ ගුරුවරුන්ට ජාතික අධ්‍යාපන ආයතනය මගින් සෘජුව ම නව විෂය නිර්දේශ හඳුන්වා දීම සඳහා පුහුණුව ලබා දුනි. (2017 අ.පො.ස. (උසස් පෙළ) ශ්‍රේණි ආරම්භ වීමට පෙර විෂය කිහිපයක් හැරුණු කොට අනෙකුත් සියලු ම විෂයයන් සඳහා මෙම පුහුණුව අවසන් කර ඇත).

ජීව විද්‍යාව විෂය නිර්දේශය පිළිබඳ ව මෙහි ඉහත 4.3 (අ) -ii හි සඳහන් කර ඇති පරිදි සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැර වූ ගැටළුකාරී තත්වයක් ඇතිවූ අතර එය බාහිර මුද්‍රණ ආයතන මගින් මුද්‍රණය කිරීමට හා බෙදා හැරීමට වැඩි කාලයක් ගත වන බැවින් විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යය තුනෙන් ම) අනුමත වූ වහාම දින 03ක් ඇතුළත ආයතනයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කර විෂයය උගන්වනු ලබන සෑම පාසලකටම පිටපතක් බැගින් ලබා දුනි.

මේ අනුව විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ ප්‍රමාද වීම මගින් පාසල්වල 12 ශ්‍රේණියේ විෂය නිර්දේශ ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම අවම කිරීමට කටයුතු කර ඇති අතර ගුරුවරුන් සෘජුව ම ජාතික අධ්‍යාපන ආයතනය විසින් දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් සිදු කර විෂයමාලා ද්‍රව්‍යවල අදාළ මුද්‍රිත පිටපත් පුහුණුවේ දී ලබා දීම තුළින් අඩුපාඩු සිදු නොවීමට වග බලා ගෙන ඇත.මෙම සියලු කාර්යයන් සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලවල හිඟය තදින්ම බලපෑ අතර ගුරු මාර්ගෝපදේශ භාෂා කිහිපයකට පරිවර්තනය කර ගැනීම සඳහා පාලනය කර ගත නොහැකි පරිදි කාලය ගත වීම සිදු වී ඇත.

(i) පාසල්වලට ගුරු මාර්ගෝපදේශ ලැබීමට පෙර ඒවා රිසෝ මුද්‍රණය කර ගුරු පුහුණු වැඩසටහනේ දී ගුරුභවතුන් අතට ලබා දී ඇත. උසස් පෙළ විෂයමාලා හඳුන්වාදීමේ දී සෑම ගුරුවරයකුට ම ජාතික අධ්‍යාපනය ආයතනය මගින් සෘජුව ම ගුරු පුහුණුව ලබා දේ.

(ii) 2017 වර්ෂයේ උසස් පෙළ නව විෂය නිර්දේශ අනුව ඉගැන්වීම් ආරම්භ කළ යුතු වූ විෂයයන්වලට අදාළ වූ 2018 ජනවාරි 31 දින වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබූ ගුරු මාර්ගෝපදේශවලට අදාළ වර්තමාන තත්ත්වය උපලේඛන අංක 4 මඟින් ඉදිරිපත් කර ඇත.

**(උ) භෝජනාගාරය පිළිබඳ පරික්ෂාව**

භෝජනාගාරයේ අරක්කැමියන් 09ක් රාජකාරී කළ ද ඉන් එක් ප්‍රධාන අරක්කැමියකු දිනපතා ම ආහාරපාන ඉල්ලුම් කිරීම්වලට අදාළ ලිපිලේඛන පවත්වා ගෙන යාම හා ලබා ගත් ආහාරපාන පිළිබඳ ලේඛන පවත්වා ගෙන යාම සිදු කරයි.

භෝජනාගාරයේ ඇති ඉඩ ප්‍රමාණය හා භාණ්ඩ ප්‍රමාණය අනුව උපරිම වශයෙන් 200කට පමණ එකවර ආහාරපාන ලබා දීමේ හැකියාව පවතී. භෝජනාගාරයේ සේවකයන්ගේ සේවා කාලය සේවා මුර ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන අතර, දිනයේ එක් සේවා මුරයකට අරක්කැමියන් හතර දෙනෙකු සේවයේ යොදවා ඇත. එම අරක්කැමියන් හදිසි අවශ්‍යතා මත නිවාඩු ලබන අවස්ථාවල දී මෙලෙස ඉල්ලුම් කරනු ලබන ආහාරවේල් සැපයීමේ අපහසුතා මතු වී ඇත.

ආහාර සැපයීම වෙනුවෙන් ආදායම ඉක්මවා වියදමක් දරා ඇති බව පිළිගනිමි. වෙළෙඳපොලේ ආහාර අමුද්‍රව්‍ය මිල ශීඝ්‍රයෙන් වැඩි වීම ද වියදම් වැඩි වීමට හේතු වී ඇත. ආහාරපාන අලෙවිය සඳහා මිල ගණන් සංශෝධනය කිරිමට කටයුතු යොදා ඇති අතර නව මිල ගණන් අනුව ඉදිරියේ දී ආදායම වැඩි කර ගනු ලැබේ.

**වර්තමාන තත්වය :**

2018.10.11 දිනැති පාලන චක්‍රලේඛ අංක 471/2018 මගින් අදාළ ගාස්තු රේටයන් සංශෝධනය කර ඇත.

**4.4 අරමුදල් උපයෝජනය**

(අ) පහත සඳහන් පොත් ගණිත දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර මුද්‍රණ කටයුතු සඳහා මුද්‍රණ අංශයට නියමිත පරිදි භාර දී ඇත.

- **10 ශ්‍රේණිය පුනරීක්ෂණ ප්‍රශ්නපත්‍ර සංග්‍රහය - සිංහල මාධ්‍ය පිටපත් 7000**

මෙම පොත් මුද්‍රණය සඳහා 2016.10.21 දින මුද්‍රණ අංශයට භාර දී ඇත.

ඒ වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් මෙම පොත් මුද්‍රණය සඳහා රු. 1,845,000/= ක මුදලක් මුද්‍රණ වියදම් වශයෙන් 2016.11.23 දින ආයතනයේ ආදායම් ගිණුමට බැර කර ඇති බව පිළිගනිමි. මුද්‍රණාලයේ තිබූ කාර්ය බහුලත්වය හේතුවෙන් මෙම පොත් මුද්‍රණය ප්‍රමාද විය.

මෙම පොත් ඉතා ඉක්මණින් මුද්‍රණය කළ යුතු ව තිබූ බැවින් ආයතන සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව මෙම පොත බාහිර ආයතනයකින් මුද්‍රණය කරවා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව පොත් 2000ක් අලෙවිය සඳහා ද වන පරිදි පොත් 9000කට අදාළ ඇණවුම් අංක 7002 ගැනුම් ඇණවුම 2018.01.18 දින බාහිර මුද්‍රණ ආයතනයක් වෙත ලබා දී ඇති අතර එය සෝදුපත් බැලීමේ අවස්ථාවේ පවතී.
මුද්‍රණ කටයුතු අවසන් වූ වහාම මෙම පොත් පාසල්වලට බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.

**වර්තමාන තත්ත්වය**

බාහිර මුද්‍රණාලයෙන් ලබාදුන් පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සංග්‍රහයේ අවසන් සෝදුපත ගණිත දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර සකසන ලද සංයුක්ත තැටිය 2018.12.24 දින අදාළ මුද්‍රණාලයට භාර දී ඇත.

- **10 ශ්‍රේණිය ගණිතය පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සංග්‍රහය- (දෙමළ මාධ්‍යය) (පිටපත් 3000)**

මෙම පොත් මුද්‍රණය සඳහා 2016.10.21 දින මුද්‍රණ අංශයට භාර දී ඇත.

ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් මෙම පොත් මුද්‍රණය සඳහා රු. 1,042,500/= ක මුදලක් මුද්‍රණ වියදම් වශයෙන් ආයතනයේ ආදායම් ගිණුමට බැර කර ඇති බව පිළිගනිමි. ජාතික අධ්‍යාපන ආයතනයේ මුද්‍රණාලයේ තිබූ කාර්යබහුලත්වය හේතුවෙන් මෙම පොත් මුද්‍රණය ප්‍රමාද වූ නමුත් මේ වන විට පොත් 1015 ක මුද්‍රණ කටයුතු අවසන් කර ප්‍රකාශන ගබඩාවට භාර දී ඇත.

මෙම පොත් පාසල්වලට බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

- **11 ශ්‍රේණිය ගණිතය පුනරීක්ෂණ පත්‍ර සංග්‍රහය (ඉංග්‍රීසි මාධ්‍යය) (පිටපත් 3000)**

මෙම පොත් මුද්‍රණය සඳහා 2016.10.21 දින මුද්‍රණ අංශයට භාර දී ඇත.

ඒ වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් මෙම පොත් මුද්‍රණය සඳහා රු. 900,000/- මුදලක් මුද්‍රණ වියදම් වශයෙන් ආයතනයේ ආදායම් ගිණුමට බැර කර ඇති බව පිළිගනිමි. මුද්‍රණාලයේ තිබූ කාර්යබහුලත්වය හේතුවෙන් මෙම පොත් මුද්‍රණය ප්‍රමාද විය.

මෙම පොත් ඉතා ඉක්මණින් මුද්‍රණය කළ යුතු ව තිබූ බැවින් ආයතන සභාව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව මෙම පොත ද බාහිර ආයතනයකින් මුද්‍රණය කරවා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව අදාළ ගැනුම් ඇණවුම (7003) 2018.01.18 දින බාහිර මුද්‍රණ ආයතනයක් වෙත ලබා දී ඇති අතර මේ වන විට සෝදුපත් බැලීමේ අවස්ථාවේ පවති.

මුද්‍රණ කටයුතු අවසන් වූ වහාම මෙම පොත් පාසල්වලට බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

**වර්තමාන තත්ත්වය**

පුනරීක්ෂණ ප්‍රශ්නපත්‍ර සංග්‍රහයේ දෙවන සෝදුපත ($2^{nd}$ proof) ගණිත දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර 2018.12.24 දින අදාළ මුද්‍රණාලයට භාර දී ඇත.

(ආ) පර්යේෂණ ප්‍රදාන සඳහා වැය කර ඇති මුදල

| | |
|---|---|
| 2016 වර්ෂයේ වැඩමුලු සඳහා | රු. 29,200.00 |
| 2017 වර්ෂයේ දී වැඩමුලු සඳහා | රු. 72,000.00 |
| පුවත්පත් දැන්වීම් | රු. 80,500.00 |
| පර්යේෂණ ප්‍රදාන 3ක් සඳහා මූලික ගෙවීම් | රු. 375,000.00 |
| (පර්යේෂණ ප්‍රදාන වැඩමුලු 2) + (සංස්කෘතික පර්යේෂණ වැඩමුලු 1) | රු. 87,000.00 |
| 2018 මැයි 31 දිනට වියදම | රු. 643,700.00 |
| 2018 මැයි 31 දින සිට 2018 දෙසැම්බර් 31 දිනට වියදම | රු. 1,344,738.00 |
| **ඒ අනුව පර්යේෂණ ප්‍රදාන වැඩමුලු වැය කර ඇති මුළු මුදල** | **රු.1,988,438.00** |

ඉතිරි මුදලින් පර්යේෂණ ප්‍රදාන තුනක දෙවන වාරිකය ද මේ වන විට ගෙවා ඇත. තුන්වන සහ සිව්වන වාරික වෙනුවෙන් 2019 දෙසැම්බර් මාසය වන විට රු. 1,500,000/- ක් ලබා දීමට නියමිතය.

(ඇ) ඕස්ට්‍රේලියානු රජය මගින් පිරිනමනු ලබන අරමුදලෙන් (AUS AID) ප්‍රතිපාදනය යටතේ අ.පො.ස. (උසස් පෙළ) තෝරා ගත් විෂය කිහිපයක් සඳහා විෂයමාලා ද්‍රව්‍ය සැකසීම ආරම්භ කළ අතර 2014 වර්ෂයේ දී පහත සඳහන් පොත් සකස් කිරීමට නියමිත ව තිබුනි. මේ පිළිබඳ ව වර්තමාන තත්ත්වය උපලේඛණ අංක 05 මගින් දක්වා ඇත.

උපලේඛනයේ සඳහන් පොත් පිළිබඳ ව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

(ඈ) මුදල් ඉතිරිවන ආකාරය අනුව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව රු. 250,000,000/- ක ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. ඉතිරි මුදල උචිත පරිදි රෙපෝ ආයෝජන ක්‍රමය යටතේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

**4.5 ආර්ථික නොවූ ගනුදෙනු**

ජාතික අධ්‍යාපන ආයතනයේ මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ පවත්වා ගෙන යනු ලබන ආපනශාලාවේ 2017 වර්ෂයට අදාළ සියලුම විදුලි බිල්පත් සඳහා ගිවිසුම් ප්‍රකාරව විදුලි බිලෙන් 50 % මුදල අය කර ගැනීමට කටයුතු කර ඇත (ඇමුණුම-10).

කිරිහලේ සම්පූර්ණ විදුලි බිල්පත කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු බවට ගිවිසුමේ සඳහන් කර ඇතත් කිරිහල පවත්වා ගෙන යනු ලබනුයේ සුබ සාධක කටයුත්තක් වශයෙන් බැවින් එහි ද ආපනශාලාවේ ගිවිසුම පරිදි විදුලි බිලෙන් 50% ක් වශයෙන් විදුලි බිල අය කර ගැනීමට කටයුතු කර ඇත.

මේ අනුව 2017 වර්ෂයට අදාළව කිරිහලේ විදුලි බිලෙන් 50% ක මුදල සම්පූර්ණයෙන් අයකර ගෙන ඇත.

ගිවිසුමේ අදාළ සංශෝධන සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**4.6 කාර්යමණ්ඩල පරිපාලනය**

(අ) 2018 වර්ෂයේ දී බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර, ආයතනයේ දැනට පවතින කාර්ය භාරයට සරිලන පරිදි සේවක අවශ්‍යතා තීරණය කිරීමට ද කටයුතු කරනු ලැබේ.

රජය විසින් ඉදිරිපත් කරන ලද 2018 අයවැය යෝජනාවලට ජාතික අධ්‍යාපන ආයතනයේ සමස්ත ප්‍රතිව්‍යුහගතකරණයක් යෝජනා වී ඇති බැවින් ද විශේෂ කමිටුවක් විසින් එම ප්‍රතිසංවිධානයට අදාළ යෝජනා සකස් කෙරෙමින් පවතින බැවින් ද අනාගතයේ දී ආයතන කාර්යභාරය තවදුරටත් පුළුල් වීමට සහ කාර්ය මණ්ඩල සංශෝධනයක් අනිවාර්යයෙන් සිදු කළයුතු බව ප්‍රකාශ කරමි.

2017 වර්ෂයේ දී පුවත්පත් දැන්වීම් 03 ක් පළ කරන ලද අතර එහි සඳහන් තනතුරු 28 ක් සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.

සිවිල් ඉංජිනේරු තනතුර සඳහා නිලධාරිනියක් බඳවා ගෙන ඇත. විගණන සහකාර තනතුරු දෙක සඳහා බඳවා ගෙන ඇත .

(ආ) අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා විධිමත් ක්‍රමයක් මේ දක්වා ස්ථාපිත කර නොතිබුණු අතර විධිමත් ක්‍රියාපටිපාටියක් මේ වනවිට කෙටුම්පත් කර ඇත.

(ඇ) 2017 වර්ෂයේ දී තනතුරු 28 ක් සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් 03 ක් පළ කර ඇත. මින් තනතුරු 05 ක් සඳහා 2017 හා 2018 වර්ෂවල අදාළ කාර්ය මණ්ඩලය 06 දෙනෙකු බඳවා ගනු ලැබූ අතර , ඉතිරි තනතුරු 23 සඳහා ලැබූ අයදුම්පත් අතරින් අධ්‍යක්ෂ තනතුරු 08 ක් සඳහා ද, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 02 ක් සඳහා ද බඳවා ගැනීම් පටිපාටිය අනුව සුදුසුකම් සපුරා තිබෙන අයදුම්පත් ප්‍රමාණවත් ව ලැබී නොමැත.

තනතුරු 28 න් තවදුරටත් තනතුරු 13 ක් ඉතිරිව ඇති අතර, මින් තනතුරු 04 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඉතිරි තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට සූදානම් කර ඇත.

(ඈ) පුස්තකාලයට අදාළ කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි දක්වා ඇත.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නිරත කාර්ය මණ්ඩලය | පුරප්පාඩු ප්‍රමාණය | පුරප්පාඩු දිනය |
|---|---|---|---|---|
| පුස්තකාල අධ්‍යක්ෂ | 01 | - | 01 | 2013 වසරේ සිට |
| සහකාර පුස්තකාලාධිපති | 01 | - | 01 | ආරම්භ කළ දින සිට |
| පුස්තකාල සහකාර | 04 | 01 | 03 | 2013 වසරේ සිට |
| කළමනාකරණ සහකාර | 01 | - | 01 | 2017 වසරේ සිට |

මීට අදාළ විස්තර පහත පරිදි වේ.

අධ්‍යක්ෂ තනතුර සඳහා 2016 වර්ෂයේ දී අයදුම්පත් කැඳවා ඇතත්, පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වී ඇති බැවින් ද, ප්‍රමාණවත් අයදුම්පත්‍ර ලැබී නොමැති බැවින් ද එම තනතුර පිරවීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීමට එම වකවානුවේ දී හැකියාවක් වී නොමැත.

සහකාර පුස්තකාලාධිපති තනතුර මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨයේ පුස්තකාලය සඳහා ය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් ප්‍රමාද වීම නිසා බඳවා ගැනීමට හැකියාවක් වී නොමැත.

පුස්තකාල සහකාරවරුන් දෙදෙනෙකු (02) 2014 වර්ෂයේ දෙසැම්බර් මස බඳවා ගෙන ඇත. ඉන් එක් අයෙකු සේවය අතහැර ගොස් ඇති අතර , එක් අයෙක් දැනට සේවය කරමින් සිටී. දැනට පුස්තකාල

සහකාරවරුන් දෙදෙනෙකු බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් ඉදිරියේ දී බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

පුස්තකාලයේ සේවය කළ කළමනාකරණ සහකාර 2017 අගෝස්තු මස සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇති හෙයින්, කළමනාකරණ සහකාර තනතුරුවල ඌනතාවයක් පවතින අතර, මේ දක්වා එම තනතුර සඳහා කෙනෙකු බඳවා ගැනීමට හැකියාවක් වී නොමැත. ඉදිරියේ දී කළමනාකරණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු පුස්තකාලය සඳහා අයකු අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරවා ගැනීමෙන් පසු මෙම තනතුරු පිරවිය හැකිය.

**4.7. වාහන උපයෝජනය**

ප්‍රවාහන අංශයේ වැය ලෙජරය අනුව අවස්ථා 21 කදී රු. 2,629,236/54 ක මුදලක් දේශීය නියෝජිතයන්ට අලුත්වැඩියා සඳහා ගෙවා ඇත. ආයතනය සතු හොඳ තත්ත්වයෙන් ඇති වාහන මෙලෙස අලුත්වැඩියා සඳහා යොමු කරන ලද්දේ මෙම වාහනවල දීර්ඝ පැවැත්ම පිළිබඳ ව සැලකිලිමත්ව ය.

වාහන සේවා කටයුතු සඳහා දේශීය නියෝජිතයින් වෙත යොමු කිරීමේ දී දරන ලද වියදම් ද අදාළ ගණනය කිරීමේ දී අලුත්වැඩියා වියදම් ලෙස එකතු කර ඇති බව නිරීක්ෂණය වේ. වාහන මෙලෙස අලුත්වැඩියා සඳහා යොමු කරන ලද්දේ තවත් වසර (5-10) ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි වාහනවල තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ය.

**4.8 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

2016/2017 වර්ෂයේ මිල දී ගන්නා ලද භාණ්ඩවලින් කොටසක් දැනටමත් ඉල්ලුම් කර ඇති දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇත. ඉතිරි භාණ්ඩ ද මේ වන විට බෙදා හැර අවසන්ය.

**5.0 තිරසර සංවර්ධනය**

5.1 **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛය ආයතනයට නොලැබුණු බැවින් ඒ පිළිබඳ දැනුවත් නොවුන ද විගණකාධිපතිගේ PER/2017/SDG/05 ලිපිය ලද පසු අදාළ චක්‍රලේඛ බාගත කර ගෙන ඒ පිළිබඳ දැනුම්වත්වීම් ලබා ගැනීමට කටයුතු කර ඇත. ආයතනයේ කාර්යභාරය අනුව සෘජුව තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉලක්ක ගොඩනගා ගැනීමේ යම් යම් අපැහැදිලි තත්ත්ව තිබුණ ද 2018.07.18 දින හඳුනාගත් අරමුණු හා ඉලක්ක පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ (සැලසුම්) විසින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරි මහත්මියට පෞද්ගලික ව ගොස් බාරදීමට කටයුතු කර ඇත.

**6.0 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**6.1 ප්‍රසම්පාදනයන්**

**(අ) අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය සඳහා ලී බඩු ප්‍රසම්පාදනය කිරීම**

වාර්තාවේ සඳහන් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු. 4,492,613/- ක ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාල කාර්යසාධන සුරක්ෂණය ලබා ගෙන නොමැති බව පිළිගනිමි.

රු. 2,113,200/- වු දේශන ශාලා පුටු හා මේස මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයට අදාල කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට නොහැකි වී ඇති බව පිළිගනිමි.

ඉදිරියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව අදාළ මිල දී ගැනීම් සඳහා කාර්යය සාධන සුරක්ෂණ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට මුදල් අංශයේ නිලධාරින් දැනුවත් කර ඇත.

(ආ) ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගැනීමේ ප්‍රසම්පාදනය

මෙම වායු සමීකරණ යන්ත්‍ර 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිල දී ගැනීමට නියමිත ව තිබූ අතර 2017 වර්ෂයේ ම මෙම කටයුත්ත නිම කළ යුතු බැවින් වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ දේදුණු පිටුවල සඳහන් ආයතනවලින් සුළු ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතියට යටත් ව මිල ගණන් කැඳවීමට 2017.12.26 දින අනුමැතිය ලබා ගෙන මිල ගණන් කැඳවා ඇත.

ප්‍රසම්පාදන කාර්යය ප්‍රමාද වී ඇති බව පිළිගන්නා අතර සැලසුම් කරන ලද කාලය තුළ කාර්යය භාරය ඉටු කිරීමට නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදි.

මෙම ප්‍රසම්පාදන කටයුත්ත 2017 වර්ෂය තුළ ම සිදු කර ගත යුතු වු හෙයින් මෙම යන්ත්‍ර සඳහා පිරිවිතර පත් තාක්ෂණික ඇගයීම් කමිටුවෙන් ලබා දුන් පසුව ඉක්මණින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර ඇත.

ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇතිවීම් වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් නිසි ලෙස අනුගමනය කිරීමටත්, නිළධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදි.

- 2017 වාර්ෂික ප්‍රතිපාදන අපතේ යාම වලක්වා ගැනීම සඳහා ඉහත ක්‍රමවේදය අනුගමනය කර මෙම මිල දී ගැනීම ඉක්මණින් ඉටු කරන ලදී.

## 6.2 අයවැය පාලනය

2017 ගොඩනැගිලි සඳහා වෙන් කළ මුදල්වලින් පස් මහල් ගොඩනැගිල්ල සඳහා රු.මි. 161ක් වෙන් කර තිබුන ද සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වූ බැවින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රමාද විය. එම හේතුව නිසා 2017 වර්ෂයේ නිම කිරීමට නොහැකි වු බැවින් ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් කොටසක් ඉතිරි විය. එය මෙම විචලනය සඳහා හේතු වී ඇත.

ඉංජිනේරු අංශයේ පුරප්පාඩුව පැවති තාක්ෂණික තනතුර සඳහා බඳවා ගැනීම සිදු කිරීමට ඇති වූ විවිධ අපහසුතා නිසා ප්‍රමාණ පත්‍ර සැකසීම, ඇගයීම, ඇස්තමේන්තු සකස් කිරීම ආදී කාර්යය නියමිත වේලාවට ඉටු කර ගැනීමට නොහැකි වීම නිසා වියදම් කිරීම ප්‍රමාද වී ඇත.

භාණ්ඩ මිල දී ගැනීම සඳහා කාර්ය මණ්ඩල ඌණතා නිසා සිදු වූ ප්‍රමාදවීම් ද මෙම විචලනයට හේතු වී ඇත.

**ආදායම්**

**ආයතනයේ ආදායම**

මේ යටතේ යොමු කර තිබූ විගණන විමසුමෙහි අයවැයගත වටිනාකම ලෙස දක්වා ඇත්තේ රු. 138,825,000/-ක් වුව ද 2017 සංශෝධිත අයවැය ලේඛනයට අනුව එය රු. 192,625,000/- ක් වේ. (පුනරාවර්තන 138,825,000/- ප්‍රාග්ධන 53,800,000/-)

ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවලින් සහ වෙනත් මාර්ගවලින් අපේක්ෂිත ආදායම් වාර්ෂික අයවැය වාර්තාවට ඇතුළත් කරනු ලැබේ. සත්‍ය ආදායම, අපේක්ෂිත ආදායමට වඩා වෙනත් අගයක් ගන්නා අවස්ථා ඇත.

ආයතනයට වැඩි ආදායම් ප්‍රමාණයක් ලබා දෙන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා සාමාන්‍යයෙන් බඳවා ගන්නා ප්‍රමාණය 2500 සිට 4900ක් දක්වා වැඩි කිරීමත් (සාමාන්‍ය හා විශේෂ යනුවෙන් පාඨමාලා දෙකක් ලෙස ආරම්භ කිරීම) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගන්නා ප්‍රමාණය 3000 සිට 3600 දක්වා වැඩි කිරීමට සමගාමීව අපේක්ෂිත ආදායම් ප්‍රමාණය ද වර්ධනය විය.

**පුද්ගල පඩිනඩි දීමනා**

**පඩිනඩි හා වේතන**

ආයතනයේ 2017 අයවැය ලේඛනය සකස් කිරීමේ දී ආයතනයේ ඒ වන විට සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයට අමතරව අධ්‍යයන හා අනධ්‍යයන

කාර්යමණ්ඩලයේ 200 කට ආසන්න පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය ද වැටුප් හා වේතන යටතේ ඇතුළත් කරන ලදි. කාර්යමණ්ඩලයේ උසස්වීම් හා නව බඳවා ගැනීම් රාශියක් 2017 වර්ෂය අවසාන භාගයේ දී සිදු කළ අතර, විවිධ හේතුමත තවත් බොහෝ දෙනෙකුට පත්වීම් ලබා දීම ප්‍රමාද වීම ඉහත විචලනය සඳහා හේතු විය.

එසේ වුව ද යථෝක්ත ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය භාවිත කර සේවා නියුක්තයන්ගේ හා සේවක අර්ථසාධක අරමුදලට ආයතනයේ කාර්යමණ්ඩලය වෙනුවෙන් ගෙවීමට සිදු වී ඇති (2006 සිට 2015 වර්ෂය දක්වා ජීවන වියදම් දීමනාව ගණනය නොකර දායක මුදල් බැර කිරීම නිසා) රුපියල් මිලියන 72 ආසන්න මුදල ඉහත ප්‍රතිපාදන උපයෝගී කර ඒ සඳහා ගෙවීමට ආයතනයේ පාලක සභාවේ අනුමැතිය සහ අධ්‍යාපන ලේකම්තුමාගේ අනුමැතිය සහිතව භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ද ලබා ගත් නමුත් භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කිරීම නොකළ බැවින් එය ඉටුකර ගැනීමට නොහැකි විය.

**පාරිතෝෂික**

අවසන් ගිණුම්වල පාරිතෝෂික වියදම් ලෙස පෙන්වා ඇත්තේ 2017 වසර සඳහා සියලුම සේවකයන්ගේ පාරිතෝෂික ගෙවීම් වෙනුවෙන් වෙන් කරන ලද මුදලයි.
එහෙත් අයවැය ලේඛනය සකස් කරන අවස්ථාවේ දී ඇස්තමේන්තු කරනු ලබන්නේ අදාළ වසරේ විශ්‍රාම යාමට අපේක්ෂිත නිලධාරින්ට ගෙවීමට නියමිත පාරිතෝෂික මුදල් ප්‍රමාණයයි. එම නිසා මෙය විචලනයක් ලෙස සැලකිය නොහැකි ය.

**ගමන් වියදම් - විදේශීය**

අවසන් ගිණුම් ප්‍රකාශනය සකස් කිරීමේ දී විදේශ ගමන් වියදම් යටතේ ම විදේශ අධ්‍යයන කටයුතු සඳහා ගෙවූ පාඨමාලා ගාස්තු ද ඇතුළත් කර තිබීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇත. අයවැය ලේඛනය සකස් කිරීමේ දී එම පාඨමාලා ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ කාර්ය මණ්ඩල සංවර්ධන යන වියදම් අයිතමය යටතේ ය. ඒ අනුව තත්ත්වය පහත පරිදි විය යුතු ය.

| වියදම් | අයවැයගත වටිනාකම | සත්‍ය වටිනාකම | විචලනය |
|---|---|---|---|
| විදේශ ගමන් (1102) + කාර්ය මණ්ඩල සංවර්ධනය (1905.1) | 14,950,000<br>(4,550,000 + 10,400,000) | 14,036,083 | 6% |

ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.

**සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය**

**ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ**

වර්ෂය අවසානයේ දී මිල දී ගැනීමට අපේක්ෂිත ව තිබූ ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ ද්‍රව්‍ය සැලසුම් කළ පරිදි මිල දී නොගැනීම නිසා මෙම විචලනය ඇති වී ඇති අතර, එම විචලනය පිළිගනිමි.

**අලුත්වැඩියා හා නඩත්තු වියදම්**
**වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම්**

වාහන අලුත්වැඩියා සහ නඩත්තු වියදම් සඳහා අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ පුනරාවර්තන වියදම් යටතේ ය. මීට අමතර ව වාහන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් මූලධන (ප්‍රාග්ධන) වියදම් යටතේ අයවැයෙන් වෙන් කරනු ලබයි.
ඒ අනුව මෙම තත්‍ය වියදම් තුළ මූලධන වියදම් යටතේ කරන ලද වාහන පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීමේ වියදම ද (අවසන් ගිණුම්වල වියදම් වර්ගීකරණය අනුව) ඇතුළත් වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබේ.

**ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු**

ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු තත්‍ය වියදම යටතේ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ දරන ලද නමුත් ප්‍රාග්ධනිත කළ නොහැකි අලුත්වැඩියා හා නඩත්තු වියදම් ද ඇතුළත් වීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත.

**වෙනත්**

" වෙනත් " යටතේ ඇති ගිණුමේ ජර්නල් අංක 32B යන ජර්නලයෙන් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර ඇති මුදලින් රු. 24,548,203/81 යන මුදල සඳහා බැරකම් ලෙස මුදල් අංශය වෙත දැනුම් දී ඇත්තේ යන්ත්‍ර සූත්‍ර නඩත්තු වැය ශීර්ෂයෙනි. එම වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින්, වෙනත් වියදම් ගිණුමේ උපචිත ලෙස ගිණුම් ගත කර ඇත. එබැවින් ඉහත විචලනය සිදු වී ඇත.

**ගිවිසුම්ගත සේවා**

**තැපැල් වියදම් හා ප්‍රචාරණ**

2017 වර්ෂයේ දී පද්ධතියේ සිටින සියලුම උසස් පෙළ ගුරුවරුන් පුහුණු කිරීමට සැලසුම් කර තිබූ බැවින් තැපැල් ගාස්තු (මුද්දර) සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් ඇස්තමේන්තු කරන ලදී. නමුත් විෂය වැඩි ප්‍රමාණයක ගුරු පුහුණු වැඩසටහන් අදාළ පළාත් දෙපාර්තමේන්තු විසින් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම නිසා තැපැල් ගාස්තු වෙනුවෙන් දැරීමට සිදු වූ මුදල අයවැයගත ප්‍රමාණයට වඩා අඩු වී ඇත.

**පවිත්‍රතා සේවය**

විගණන විමසුමෙහි පවිත්‍රතා සේවා වියදම සටහන් කිරීමේ දී අයවැගත වටිනාකම හා සත්‍ය වටිනාකම අතපසුවීමකින් මාරු වී සටහන් කර ඇති බව නිරීක්ෂණය වෙයි. එය පහත පරිදි නිවැරදි විය යුතු ය.

| | (රු.) |
|---|---|
| සත්‍ය වටිනාකම | 15,085,331 |
| අයවැයගත වටිනාකම | 13,000,000 |
| | 2,085,331 |

ඒ අනුව විචලනය + 16% වේ. 2017 වර්ෂයේ අවසාන භාගයේ තෝරා ගත් පවිත්‍රතා සේවා සමාගමෙහි රේටයන් වැඩි වී තිබුණ ද සංශෝධිත අයවැය සකස් කරන අවස්ථාව වන විට උපචිත වියදම පිළිබඳ නිවැරදි තොරතුරු නොලැබීම හේතුවෙන් අයවැයගත වටිනාකමට වඩා වැඩි ප්‍රමාණයක වියදමක් දැරීමට සිදු විය. ඒ අනුව මෙහි සඳහන් විචලනය පිළිගනිමි.

**7. පද්ධති හා පාලනය**

**(අ) ගිණුම්කරණය**

2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සිදු වී ඇති ගිණුම්කරණ අඩුපාඩු හඳුනා ගෙන ඇති අතර, ඒවා 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**(ආ) මෙහෙයුම් පාලනය**

**(i) විෂය නිර්දේශ සකස් කිරීමේ ප්‍රමාද වීම් සහ විධිමත් පරිදි සකස් කිරීමට කටයුතු නොකිරීම.**

වසර 8කට වරක් චක්‍රීය ව සිදු වන විෂයමාලා නවීකරණ / සංශෝධන ක්‍රියාවලියට අනුව 2015 නව විෂයමාලා පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වීම ආරම්භ වූ අතර 2017 වර්ෂයේ දී එහි අවසන් අදියරට එළඹුනි. මෙම කාර්යය 2012 - 2016, 2013-2017 පස් අවුරුදු සැලැස්මට අනුකූල ව ආරම්භ විය. ප්‍රාථමික 1-5 හා ද්විතීයික 6-11 ශ්‍රේණිවලට අදාළ විෂයමාලා සංශෝධන එම පස් අවුරුදු හා වාර්ෂික සැලැස්මට අනුව ප්‍රමාදයකින් තොර ව සිදු කෙරුන අතර පාසල්වල ද 2015 සිට ක්‍රියාත්මක විය. අ.පො.ස (උසස් පෙළ) සඳහා විෂයයන් 50 ක් ක්‍රියාත්මක වන අතර එම විෂයයන් සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් සකස්

කරනු ලැබේ. ඒ අනුව අ.පො.ස. (උසස් පෙළ) සඳහා ගුරු මාර්ගෝපදේශ 92 ක් සකස් කළ යුතු වේ.

විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ කෙටුම්පත් කර ඒවා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල නිර්දේශ ලබා ආයතන සභා නිර්දේශ ලැබීමෙන් පසු පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර පාසල්වලට නිකුත් කෙරේ.

සැලැස්මට අනුව උසස් පෙළ විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ සැකසීම 2015 ආරම්භ කර 2016 වර්ෂ අවසානය වන විට අවසන් කළ යුතු ව තිබුණ ද පහත දැක්වෙන හේතු නිසා ප්‍රමාදයක් ඇති වී තිබේ.

- 2016 ජනවාරි සිට 2016 අගෝස්තු දක්වා ආයතන සභාව රැස් නොවීම (සාමාජිකයන් පත් කර නොතිබීම නිසා).
- උසස් පෙළ විෂයමාලා ද්‍රව්‍ය දස පුද්ගල කමිටුවකට යොමු කර එම නිර්දේශ සමග ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය තීරණය කිරීම (මෙය සැලසුම් සකස් කරන අවස්ථාවේ නොතිබුණ බැවින් මාස 6ක පමණ අමතර කාලයක් වැය විය).
- උසස් පෙළ විෂයමාලාවේ භාෂා සංශෝධන, භාෂා පරිවර්තන කටයුතු සඳහා අධික කාලයක් ගත වීම.

කෙසේ වුව ද, ඉහත බාධාකාරී තත්ත්වයන් යටතේ දී වුව ද 2017 උසස් පෙළ පන්ති ආරම්භයට පෙර 12 ශ්‍රේණිය විෂය නිර්දේශ / ගුරු මාර්ගෝපදේශ 90% පමණ අවසන් කර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් පාසල්වලට ලබා දී තිබූ අතර ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඒවා ආයතන වෙබ් පිටුවේ පළ කර තිබුණි. එම විෂයයන් සඳහා සියලුම උසස් පෙළ ගුරුවරුන් පුහුණු කිරීම ඍජුව ම ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කර තිබුණි.

එම විෂය නිර්දේශ / ගුරු අත්පොත් පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් ඇති වුව ද 2017 වර්ෂයේ දීම ඒවාට විසඳුම් ලබා දීම උසස් පෙළ ගුරුවරුන් ඍජුවම පුහුණු කිරීමෙන් ගැටලුවකින් තොරව පාසල්වල ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දී ඇත.

2018 වසරේ 13 ශ්‍රේණිය සඳහා වූ විෂයමාලා / ගුරු මාර්ගෝපදේශ සියල්ල නියමිත පරිදි අවසන් කර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. ඒ සඳහා වූ ගුරු පුහුණු කටයුතු අවසන් කර ඇත.

ඉහත සියලු විෂයමාලා සංවර්ධන කාර්යයන්ට අමතරව ලාංකීය අධ්‍යාපනයේ නවතම සංවර්ධනයක් ලෙස උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දීම සඳහා නවතම විෂයන් 26 ක විෂය නිර්දේශ සැකසීම ද මොඩියුල 26 ක් සැකසීම සහ ඒවා පාසල් 42 ක නියාමක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට ගුරුවරුන් පුහුණු කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2017 වසරේ දි සිදු කර ඇත.

**(ii) විෂයමාලා සංවර්ධනය සඳහා තීරණ ගැනිමට ඉවහල්වන පර්යේෂණ සිදු නොකිරීම.**

විෂයමාලා චක්‍රයක් ක්‍රියාත්මත වීමේ දී ඒ පිළිබඳ පර්යේෂණාත්මක තොරතුරු රැස් කිරීම සිදු කෙරේ. 2015, වසරෙන් ආරම්භ වූ විෂයමාලා චක්‍රයට පෙර ක්‍රියාත්මක වූයේ 2007-2014 දක්වා පැවති විෂයමාලා චක්‍රයයි. මෙහි දී ආයතනය විසින් SLAAD ආයතනය හරහා විෂයමාලාවේ තිරස් හා සිරස් සමෝධානයන් පිළිබඳ ව පර්යේෂණයක් ද, පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විෂයමාලා ක්‍රියාත්මක වීම පිළිබඳ පර්යේෂණයක් ද සිදු කර එහි ප්‍රතිඵල පිළිබඳ ව අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇත.

ප්‍රාථමික විෂයමාලාව ක්‍රියාත්මක වීම පිළිබඳ ව පසු විපරම් තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයක් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, 6-11 ශ්‍රේණිවල විෂයයන් ක්‍රියාත්මක වන ආකාරය, ගැඹුරෙන්

අධ්‍යයනය කිරීම හා පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම අදාළ දෙපාර්තමේන්තු විසින් සිදු කර ඇත. ලෝකයේ විවිධ රටවල විෂයමාලා පිළිබඳ තොරතුරු අධ්‍යයනය ද සිදු කරනු ලබන අතර 2015 නව විෂය නිර්දේශ සැකසීමේ දී එම තොරතුරු භාවිතා කර ඇත.

පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විෂයමාලා සංවර්ධනය වෘත්තීය සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඍජුව සම්බන්ධ වූ පර්යේෂණ 07 නිම කර ඇත.

2017 වසරේ දී 2020න් ඔබ්බට සිදු විය යුතු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ව පද්ධති විශ්ලේෂණයක් කර වාර්තාව සකස් කර ඇති අතර, එම වාර්තාව යොදා ගනිමින් තවදුරටත් පාර්ශ්ව කරුවන්ගේ අදහස් විමසීම සඳහා පළාත් මට්ටමින් තොරතුරු රැස් කිරීමක් සිදු කර ඇත. එහි අවසන් වාර්තාව සකස් කරමින් පවතින අතර 2020න් පසුව එළඹෙන විෂයමාලා නවීකරණයේ දී ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා යොදා ගැනේ.

පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද පර්යේෂණ ආයතනික වෙබ් පිටුවට ඇතුළත් කිරීම, දෙපාර්තමේන්තු කියවීම් කුටියේ ම හා පුස්තකාලයට ඇතුළත් කිරීම මගින් විෂයමාලා සම්පාදක තලය/ප්‍රතිපත්ති සම්පාදක තලයට හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන තලයට අවශ්‍ය පර්යේෂණාත්මක තොරතුරු ලබා ගැනීමට අවකාශ උදා කර ඇත. පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් ද දෙපාර්තමේන්තු පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කෙරෙන අතර, අධ්‍යාපන පද්ධතිය නියෝජනය කෙරෙන වෙනත් පාර්ශ්වයන්ට ද සිය පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමට අවශ්‍ය මංපෙත් විවර කර ඇත. එමෙන්ම මේ වන විට දෙපාර්තමේන්තුව මගින් පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අනාවරණ ඇතුලු ජාතික අධ්‍යාපන පුවත් රැගත් සන්දර්භ අර්ධ වාර්ෂික සගරාව නිකුත් කිරීම මගින් ද පද්ධතිය දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

(iii) **උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීම හා නිම කිරීම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි දත්ත පද්ධතියක් නොපැවතීම.**

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (MEd) අදාළ ව ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කර ඇති ලේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත (ඇමුණුම-08).
අනෙකුත් පාඨමාලා සඳහා ද අදාළ ලේඛන සකස් කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.

**(ඇ) විභාග පරිපාලනය**

ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව විසින් වසරකට විභාග 22ක් පමණ පවත්වනු ලබයි. මෙම විභාග පැවැත්වීමේ දින තීරණය කරනු ලබන්නේ අදාළ පාඨමාලාවල ආරම්භය, ක්‍රියාත්මක වීමේ දින වකවානුවලට සමගාමීව ය. ඒ අනුව වාර්ෂික ව විධිමත් ව විභාග කැලැන්ඩරය සකස් කරනු ලබන අතර, එය වාර්ෂික සැලැස්ම තුළ අනුමත කරනු ලබයි. නමුත් සමහර පාඨමාලාවල විවිධ නොවැලැක්විය හැකි හේතු නිසා පාඨමාලා ආරම්භය ප්‍රමාද වීම, පාඨමාලාව පැවැත්වෙන කාලය තුළ පාලනය කළ නොහැකි හේතු මත කාල සීමාවේ වෙනස්වීම් සිදු වීම නිසා විභාග පවත්වන දින වෙනස්වීම සිදු වේ. එහෙත් එම කරුණු සැලකිල්ලට ගෙන සංශෝධන සහිතව විභාග පැවැත්වීම සිදු කෙරේ.

ආයතනයේ විභාග පැවැත්වීම සඳහා යොදා ගනු ලබන්නේ ද පද්ධතියේ සිටින අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරින්, ගුරු අධ්‍යාපනඥයින්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා විශ්වවිද්‍යාල පද්ධතියේ කථිකාචාර්යවරුන් ය. මෙම බාහිර සම්පත් පුද්ගලයන් විභාග දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල හා අනෙකුත් ජාතික මට්ටම්වල විභාග සඳහා ද කැඳවන බැවින් සමහර අවස්ථාවල ඔවුන්ගේ සේවය ලබා ගැනීමට නොහැකි වීම නිසා ද ආයතනයේ විභාග සැලසුම්ගත පරිදි සිදු කර ගැනීමට බාධා ඇති වේ. විශ්වවිද්‍යාල, විභාග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතනවල ගෙවීම් වැඩි බැවින් මෙම බාහිර පුද්ගලයන් තම ප්‍රමුඛතාව ලබා දෙන්නේ එම ආයතනවල සේවය සඳහා ය.

පාඨමාලා කාලය අවසන් ව විභාග පවත්වා, ඇගයීම් කිරීමේ දී ද ඉහත පරිදි සේවය ලබා ගැනීමට අපහසු වීම නිසා ප්‍රතිඵල කඩිනමින් ලබා දීමට බාධා සිදු වේ. තව ද ආයතන ගෙවීම් සංශෝධනය සඳහා ඉල්ලීම් වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසමට ඉදිරිපත් කර වසර දෙකක් පමණ ගත වී ඇති නමුත් ඒවා ලබා නොදීමෙන් ඇගයීම් කිරීම සඳහා බාහිර සම්පත් පුද්ගලයන් පැමිණීම ඉතා අඩු බැවින් ඇගයීම් සිදු කෙරෙන කාලය ද දීර්ඝ වේ.

විභාග උපදෙස් සංග්‍රහයක් පිළියෙල කර ඇත.

**( ඈ ) සේවක මණ්ඩල කළමනාකරණය**

ජාතික අධ්‍යාපන ආයතනයට අනුමත අධ්‍යයන හා අනධ්‍යයන සේවක මණ්ඩලයේ පුරප්පාඩු කාලයක් තිස්සේ පැවැති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමෙන් ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ද අනුමැතිය ලබා ගැනීම සඳහා දැඩි දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදු විය. නිරන්තරයෙන් කරන ලද ඉල්ලීම් මත 2016 දී පුරප්පාඩු 79 පිරවීමට ද 2017 වසරේ දී පුරප්පාඩු 125ක් පිරවීමට ද අනුමැතිය ලැබුණි.

ඒ අනුව නව බඳවා ගැනීම් හා උසස්වීම් මගින් මේ දක්වා තනතුරු පුරප්පාඩු 108ක් සම්පූර්ණ කර ඇති අතර, ඉතිරි තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ කිරීමට කටයුතු යෙදුණි. 2018 ජනවාරි, පෙබරවාරි මාසවල පළාත්පාලන ඡන්ද පැවති නිසා මෙම කාර්යයේ ප්‍රමාදයක් ඇති වූ බව ද සඳහන් කළ යුතු ය.

**වර්තමාන තත්ත්වය**

2018.03.29 දින පල කළ පුවත්පත් දැන්වීමේ සඳහන් තනතුරු 05 න් (අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්), අධ්‍යක්ෂ (විභාග), සභා ලේකම්, ප්‍රසම්පාදන නිලධාරී, පොත් තබන්නා) තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සම්පූර්ණ කල අයඳුම්පත් ලැබී නොමැත.

ඉතිරි තනතුරු 03 න් එක් තනතුරක් සඳහා (ප්‍රසම්පාදන නිලධාරී) සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඉතිරි තනතුරු 02 සඳහා ( අධ්‍යක්ෂ (විභාග), පොත් තබන්නා ) සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

මෙම අවස්ථාව වන විට තනතුරු 21 ක් සඳහා පුරප්පාඩු 89 ක් පිරවීමට 2018.10.19 දින පුවත්පත් දැන්වීමක් පළ කර ඇත.

**(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

(i) හා (ii) ආයතනයේ වාර්ෂික ප්‍රසම්පාදන කටයුතු විශාල වශයෙන් පවතින අතර කාර්ය මණ්ඩල ඌනතාව හා ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ ව කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය මදකම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමේ දී ගැටලු මතු වී ඇත. එබැවින් විගණන නිරීක්ෂණවල දක්වා ඇති අඩුපාඩු සිදු වී ඇති බව පිළිගනිමි. ඉහත හේතු නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාද වීම ද නිරන්තරයෙන් සිදුවන බව නිරීක්ෂණය වී ඇති අතර අදාළ කාර්ය මණ්ඩලය ප්‍රසම්පාදන කටයුතු නිවැරදි ව හා කාර්යක්ෂම ව සිදු කිරීම සඳහා පුහුණු කිරීම තුළින් මෙම අඩුපාඩු ඉවත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර

අධ්‍යක්ෂ ජනරාල්

| අනු අංකය | විභාගය | විගණන විමසුමේ සඳහන් පරිදි පැවැත්වීමට සැලසුම් කළ මාසය | විභාගය නොපැවැත්වීමට හේතු |
|---|---|---|---|
| 01 | අධ්‍යාපනවේදී (BEd) 2011/2013 - III කොටස (පුනර්) විභාගය - 2017 | 2017 ජුනි | පැරණි විෂය නිර්දේශය යටතේ වූ අවසන් කණ්ඩායම 2011/2013 වන බැවින් මෙම කණ්ඩායමේ පාඨමාලාව සම්පූර්ණ කළ නොහැකි වූ අපේක්ෂකයන් සඳහා සුදුසු පියවර ගෙන විභාග පැවැත්වීමට තීරණය විය. ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් එම කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව විභාගය 2018 වසරේ ජුනි 23,24,30 හා ජුලි 01 දින විභාගය පවත්වා ඇත. |
| 02 | අධ්‍යාපනවේදී (BEd) 2013/2015- II කොටස (පුනර්) විභාගය - 2017 | 2017 ජුලි | පෙර ප්‍රතිඵල නිකුත් වීම ප්‍රමාද වීම හේතුවෙන් 2018 වර්ෂයට කල් දමන ලද අතර පාඨමාලාව සම්පූර්ණ කළ නොහැකි වූ අපේක්ෂකයන් සඳහා සුදුසු පියවර ගෙන විභාග පැවැත්වීමට තීරණය කර ඇත. මෙම විභාගය 2018 ජුලි 14, 15 දිනවල පවත්වා ඇත. |
| 03 | ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2017 | 2017 නොවැම්බර් | 2017 වසරේ විභාග පැවැත්වීම සඳහා ගණිත දෙපාර්තමේන්තුව මගින් පාඨමාලාවක් ආරම්භ කර නැත. |
| 04 | ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව -2017 | 2017 නොවැම්බර් | මෙය විගණන විමසුමේ ඉහත විභාගය ම නැවත සටහන් වීමකි. |

උපලේඛණ අංක 02

| අනු අංකය | විභාගයේ නම | විභාග පැවැත්වූ දිනය | ලිඛිත ලකුණු ලැබුණු දිනය | පැවැරුම් ලකුණු ලැබුණු දිනය | ප්‍රතිඵල නිකුත් කළ දිනය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|---|
| 01 | 6-11 විද්‍යා ගුරුවරුන් සඳහා උසස් සහතික පත්‍ර පාඨමාලාව (2016) අවසාන විභාගය -2017 | 2017.10.07/08/ 14/15 | 2017/12/27 | 2018/03/07 | 2018.06.21 | අදාළ පැවැරුම් ලකුණු ප්‍රමාද වී ලැබීම |
| 02 | අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (MEd) 2015/2016 අවසාන විභාගය - 2017 | 2017.03.11/12/ 18/19 | 2018/01/11 | ව්‍යාපෘති ලකුණු අවසන් වරට ලැබුණු දිනය -2018/02/02 | 2018/02/15 | ව්‍යාපෘති/පැවැරුම් ලකුණු ප්‍රමාද වී ලැබීම |
| 03 | පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (PGDE) 2015/2016 අවසාන විභාගය -(2017) | 2017.03.04/05/ 11/18/19 | 2017/09/08 | ව්‍යාපෘති ලකුණු අවසන් වරට ලැබුණු දිනය 2018/03/05 | 2018/04/26 | ගුරු පුහුණු/කාර්ය මූල පරීක්ෂණ ලකුණු ප්‍රමාද වී ලැබීම |
| 04 | අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (BEd) (2013/2015) කොටස-1 පුනර් පරීක්ෂණය - 2017 | 2017.10.21/22/ 28 | 2018/01/30 | පාසල් පාදක ව්‍යාපෘති ලකුණු ලැබුණු දිනය 2018/04/27 | 2018/05/17 | ව්‍යාපෘති ලකුණු ප්‍රමාද වී ලැබීම |
| 05 | මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව අවසාන විභාගය - 2017 | 2017.05/27/28 | 2017/10/11 | 2017/09/21 | 2017/12/21 | ලිඛිත/ පැවැරුම් ලකුණු ලැබීම අනුව ප්‍රතිඵල සකස් කර අදාළ අනුමැතිය ලැබීමෙන් පසු ප්‍රතිඵල නිකුත් කර ඇත.(AAB /Council අනුමැතියට මාස 1 ½ පමණ ගත වී ඇත.) |
| 06 | විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (2016) -අවසාන විභාගය -2017 | 2017.07.29/30 | 2018/01/22 | 2018/01/19 | 2018/02/15 | පැවැරුම් ලකුණු හා ලිඛිත ලකුණු ලැබීම අනුව ප්‍රතිඵල ප්‍රමාදයකින් තොරව නිකුත් කර ඇත. (ප්‍රතිඵල සැකසීමෙන් පසු විභාග කමිටුවට AAB /Council අනුමැතියට ඉදිරිපත් කෙරෙන නිසා මාස 1 ½ පමණ කාලයක් ගත වී ඇත.) |
| 07 | සංඥා භාෂා පිළිබඳව ඩිප්ලෝමා (2016/2017) -අවසාන විභාගය -2017 | 2017.07.29/30 | 2018/01/15 | 2018/01/17 | 2018/02/15 | |
| 08 | බේල් අධ්‍යාපන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - අවසාන විභාගය --2017 | 2017.10.28/29 | 2018.01.17 | 2018.01.16 | 2018.02.15 | |

උපලේඛණ අංක 03

| විභාගය | විභාගය පැවැත්වූ දිනය | ප්‍රතිඵල නිකුත් කළ දිනය | ලිඛිත ලකුණු ලැබුණු දිනය | අදාළ දෙපාර්තමේන්තුවෙන් පැවරුම් ලකුණු ලැබුණු දිනය | ප්‍රමාද වීමට හේතු |
|---|---|---|---|---|---|
| අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණ විද්‍යාපති උපාධිය (මාලදිවයින) - 2015 | 2015.08.30-31 | 2017.01.19 | 2015.12.15 | 2017.01.10 (පැවරුම්) 2017.01.14 වාචික පරීක්ෂණ ලකුණු | පැවරුම් ලකුණු ලබා දීම ප්‍රමාද වීම |
| බේල් අධ්‍යාපන පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2016 | 2016.11.05,06 (විගණන විමසුමේ 2015/11/05,06 ලෙස සඳහන්ව ඇත.) | 2017.03.16 | 2017.01.20 | 2017.02.02 | විගණන විමසුමේ සඳහන් විභාගය පැවැත් වූ වර්ෂය 2016 ලෙස නිවැරදි විය යුතු ය. ප්‍රමාදයක් සිදු වී නැත. |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (2013/2015) 1 කොටස (2015) දෙවන ලැයිස්තුව | 2015.03.28,29 සහ 2015.04.04 | 2017.07.20 | - | - | 2016/06/03 ප්‍රතිඵල නිකුත් කර ඇත. නමුත් ශ්‍රේණිගත (GPV/GPA) ක්‍රමයට ප්‍රතිඵල නිකුත් වූ පළමු අවස්ථාව නිසා නිබන්ධන ලබා නොදුන් අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල සම්බන්ධයෙන් ගැටලුවක් ඇතිවූයෙන් ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ඇගයීම් පටිපාටිය සංශෝධනය කර AAB /Council අනුමැතිය නැවත ලබා ගැනීමෙන් පසු දෙවැනි ලැයිස්තුව නිකුත් කර ඇත. |
| අධ්‍යාපන කළමනාකරුවන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඩිප්ලෝමාව -2014/2015 (2016) | 2016/01/30,31 සහ 2016/02/06,07 (විගණන විමසුමේ 2015/01/30,31 ලෙස සඳහන්ව ඇත.) | 2017/07/20 | 2016/12/28 | 2017/04/07 | විගණන විමසුමේ සඳහන් විභාගය පැවැත් වූ වර්ෂය 2016 ලෙස නිවැරදි විය යුතුව ඇත.<br>අභ්‍යන්තර ඇගයීම් ලකුණු ප්‍රමාද වීම |
| සංඥා භාෂාව පිළිබඳව ඩිප්ලෝමාව සහ සහතික පත්‍ර පාඨමාලාව - 2015/2016 | 2016/06/04, 05 | 2017/09/21 | 2016/09/07 | 2016/10/19 | ඇගයීම් පටිපාටියේ සංශෝධන ආයතන සභාවට ඉදිරිපත් කිරීමට සිදු වීම |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව පූර්ණ කාලීන (2016)<br>අර්ධ කාලීන 2014/2016 (නැවත පෙනී සිටි)<br>අර්ධ කාලීන 2013/2014 (නැවත පෙනී සිටි) | 2016/09/19, 21,23 | 2017/09/21 | 2017/05/16 | 2017/06/28 | පැවරුම් ව්‍යාපෘති ලකුණු ලැබීම ප්‍රමාද වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යාපනවේදී උපාධිය 2013/2015-2 කොටස (2016) | 2016/09/03,04 | 2017/10/19 | 2017/05/30 | - | ගණිතය විෂය දෙමළ ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 02 ක් සම්බන්ධයෙන් ඇගයීම් පරීක්ෂකවරු හා සැකසුම්/ ප්‍රමිත පරීක්ෂකවරු අතර ඒකාග්‍රතාවයට ගතවූ කාලය නිසා ප්‍රමාදය සිදු වී ඇත. (තෙවන පාර්ශ්වයක් වෙත යොමු කිරීමෙන් පසු විසඳුමකට පැමිණ ඇත.) |
| විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමාව 2015/2016 සහ 2013/2014(නැවත පෙනී සිටි) සහ (සහතික පත්‍ර පාඨමාලාව -2015 (2016) | 2016/06/11, 12 | 2017/10/19 | 2016/10/06 | 2016/11/04 | ඉහත 5 පිළිතුර අදාළ වේ- |

**සිංහල - 12 ශ්‍රේණිය**

12 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. වාර්ෂික සැලසුමට අනුකූල ව 2015 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී එහි අවසන් පිටපත සකස් කොට ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සූදානම් කරන ලදී.

එසේ වුවත් මේ අවස්ථාවේ අ.පො.ස. (උසස් පෙළ) සිංහල විෂය නිර්දේශ සම්බන්ධ ගැටලු සහගත තත්ත්වයක් මතු වීම හේතු කොට ගෙන, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නියමයෙන් එම විෂය නිර්දේශය නැවත සංස්කරණය කිරීමට සිදු විය.

විෂය නිර්දේශය පිළිබඳ අවසන් නිගමනයට එළඹීමෙන් පසු ඊට අනුරූපව 12 ශ්‍රේණිය සිංහල ගුරු මාර්ගෝපදේශය සංස්කරණය කිරීමට සිදු විය.

2017.08.09 දින මෙම ගුරු මාර්ගෝපදේශය අනුමැතිය සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. දස පුද්ගල කමිටු නිර්දේශවල පරස්පරතා සැලකිල්ලට ගෙන ගුරු මාර්ගෝපදේශය නැවත සංස්කරණය කළ යුතු බවට එහි දී නිර්දේශ විය.නැවත සංස්කරණය කරන ලද ගුරු මාර්ගෝපදේශය 2018.01.09 දින ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් නම් කරන ලද භාෂා සංස්කාරකවරයකු වෙත ගුරු මාර්ගෝපදේශය ඉදිරිපත් කරන ලෙස එහි දී උපදෙස් ලැබිණි.

භාෂා සංස්කරණය කරන ලද ගුරු මාර්ගෝපදේශය නැවත 2018.02.06 දින ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කර එම මණ්ඩලයේ උපදෙස් පරිදි තවදුරටත් භාෂා සංශෝධනය සිදු කර 2018.02.16 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත මුද්‍රණය සඳහා භාර දෙන ලදී.

**සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යයනය - 12 ශ්‍රේණිය (සිංහල,දෙමළ)**

12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශයට ගුරුවරුන්ගේ විරෝධතා මතු වීම නිසා, විශේෂ කමිටුවක් මගින් 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය නැවත සමාලෝචනය කරන ලදී.

ඒ අනුව සුදුසු විෂය අන්තර්ගතයන් තව දුරටත් තබා ගැනීමටත්, අලුතින් එක්විය යුතු විෂය කොටස් එකතු කිරීමටත්, ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් අනුමත කළ විෂයමාලා කමිටුවක් වෙත ලබා දෙන ලදී. සකස් කරන ලද නව විෂය නිර්දේශය 2018 මැයි මස 08 දින ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීමේ දී අනුමත විය. ඒ අනුව සකස් කෙරෙන ගුරු මාර්ගෝපදේශ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ජූනි මස රැස්වීමට ඉදිරිපත් කෙරේ.

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ආයතන සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ගන්නා ලද තීරණයකට අනුව මෙම විෂය නිර්දේශ ක්‍රියාත්මක වනුයේ 2018 වසරේ උසස් පෙළට ඇතුලුවන ශිෂ්‍යයන් සඳහා ය.

**දේශපාලන විද්‍යාව (ඉංග්‍රීසි) - 12 ශ්‍රේණිය**

ඉංග්‍රීසි මාධ්‍යය ගුරු මාර්ගෝපදේශය 2018.01.22 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මුද්‍රණයට ලබා දී ඇත.

**භූගෝල විද්‍යාව (ඉංග්‍රීසි) - 12 ශ්‍රේණිය**

ඉංග්‍රීසි මාධ්‍යය ගුරු මාර්ගෝපදේශය 2017.12.06 දින අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත මුද්‍රණය සඳහා භාර දී ඇත.

**ඉංග්‍රීසි භාෂාව - 12 ශ්‍රේණිය**

12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය සකස් කිරීමේ කටයුතු 2016 වසරේ දී ආරම්භ කළ අතර එය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කෙරිණ.

